# ශ්‍රී ලංකාවේ
# කුරුඳු කර්මාන්තය හා රජය

එම්.පී.මුවර්

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත,
කොළඹ 7.

633.833
(5L)
ගොවි

2009/06
06
2010/04

# ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය හා රජය

එම්.පී. මුවර්

වාර ප්‍රකාශන අංක 15.
නොවැම්බර් 1978

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ 7.

22898
22898

සිංහල ප්‍රකාශනයෙහි පරිවර්තන හා සංස්කරණ කටයුතු

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනී

අශෝකා පේපාල

විසිනි.

සිංහල ප්‍රකාශනයෙහි මුද්‍රණය - 1980 අගෝස්තු

පටුන


පිටුව

පෙරවදන

ස්තූතිය

පටුන

1 වන කොටස - හැඳින්වීම 01

1. අරමුණ 01

2. මූලාශ්‍ර 01

2 වන කොටස - කුරුඳු කර්මාන්තයේ ලක්ෂණ 02

කුරුඳු පැලය හා එහි නිෂ්පාදන 02

කුරුඳු නිෂ්පාදන සඳහා වෙළඳ පොල 07

මිළ විචලතාවය 11

වගා කිරීමේ තත්වයන් 14

කුරුඳු නිෂ්පාදකයෙන් ලැබෙන වාසි 18

කුරුඳු පොතුවල වර්ගය 21

කුරුඳු අසීරු භෝගයක් ද? 24

3 වන කොටස - කුරුඳු සහ රාජ්‍ය තන්ත්‍රය 25

ආයතනික අංශය 25

නැවත වගා කිරීම හා පුනරුත්ථාපනය සඳහා සහනාධාර 27

පොහොර සැපයීම 32

අවම මට්ටම් මිළ ප්‍රතිපත්තිය 34

රාජ්‍ය වාණිජ්‍යය 35

නිෂ්පාදකයින් ගේ ඉල්ලීම් 35

දේශපාලන වාතාවරණය 36

4 වන කොටස - රාජ්‍ය ප්‍රතිපත්තියේ බලපෑම් 38

භෝග එක් රැස් කිරීමක් 38

| | පිටුව |
|---|---|
| රාජ්‍ය ප්‍රතිපත්තියේ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයන් ලැබුඩින් | 40 |
| අනෙකුත් වගාවන් හා සැසඳුම | 41 |
| උප ග්‍රන්ථය I – බටපොල සමීක්ෂණය | 43 |
| උප ග්‍රන්ථය II – බටපොල පුර නිෂ්පාදකයින් ගේ නිෂ්පාදන ක්‍රම | 45 |
| සටහන් | 49 |

# පෙරවදන

කුරුඳු ශ්‍රී ලංකාවේ වැවෙන ඉතා අගනා කුළු බඩු වර්ගයන් ගෙන් එකකි. ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳාමේ දී ධනය ලබා ගැනීමේ හා හුවමාරු වෙළඳාමේ මාධ්‍යයක් ලෙස කුරුඳු ඉතා වැදගත් මෙහෙයක් ඉටු කළ බව ඉතිහාසය කියයි. කුරුඳු වාණිජ භාණ්ඩයක් ලෙස නිෂ්පාදනය කිරීම ආරම්භ වූයේ 1765 සිට 1770 දක්වා වූ කාලයේ මීගමු ප්‍රදේශයේ ය. ලන්දේසීන් විසින් වාණිජමය භාණ්ඩයක් ලෙස කුරුඳු නිෂ්පාදනය මේ කාලයේ ආරම්භ කළ ද, ශ්‍රී ලංකාවේ කුරුඳු නිෂ්පාදනය පිළිබඳ ඉතිහාසය ඉතා ඈත අතීතය දක්වා දිවේ. ඊජිප්තු ඉතිහාසයේ ශ්‍රී ලංකාවේ කුරුඳුවලට තිබූ අධික ඉල්ලුමක් ගැන කියැවෙන සටහනකින් මෙම භෝග යේ ඉතිහාසයේ දීර්ඝ බව වටහා ගත හැකි වනු ඇත.

දැනට අක්කර 40,000 ක පමණ භූමි ප්‍රදේශයක කුරුඳු වගා කෙරේ. මෙම වගාවන් තැන තැන කුඩා ඉඩම් කට්ටි ලෙස පවතින අතර, නොසැලකිලිමත් දුර්වල පාලනය නිසා වගාවන් ඉතා නිසරු තත්වයක පවතී. මේ හේතුවෙන් කුරුඳු වලින් අද අපේ නිර්යාත ඉපයුම්වලට ලැබෙන් නේ ඉතා අල්ප දායකත්වයකි. එහෙත් කුරුඳු කර්මාන්තය නිසා ඇති වූ හා ඇති වන රැකී රක්ෂා ප්‍රමාණය සුළු කොට තැකිය නොහේ.

රජය කුරුඳු කර්මාන්තය පිළිබඳව වූ ගැටළු වටහා ගත්තේ මීට බොහෝ කලකට ඉහත ය. එකලම රජය එය සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය නීති රීති, යෝජනා ක්‍රම හා සැලසුම් සම්පාදනය කළේය. මෙම ප්‍රකාශනයේ මූලික අරමුණ එවැනි සැලසුම් හා යෝජනා ක්‍රමයන් ගෙන් ඇති වූ සමාජ-ආර්ථික බලපෑම් හා රජය කුරුඳු කර්මාන්තයට මැදිහත් වීම නිසා ඇති වූ බලපෑම් රටාව විස්තරාත්මකව අධ්‍යයනය කිරීම යි.

කුරුඳු කර්මාන්තයේ බොහෝ ප්‍රශ්න පැන නැඟී ඇත්තේ කුරුඳුවල ස්වභාවික ගුණාංග මත වුව ද, ව්‍යුහාත්මක හා ශිල්පීය ගැටළු ද මෙම කර්මාන්තයේ ඌන ඵලදායිතාවය පිළිබඳ හේතු සාධකයන්ට දායක වේ. මීට ඉතා හොඳ නිදසුනකි, කුරුඳු තෙල් කර්මාන්තය. මෙහි දී මෙම ගැටළු මඟහැරවීම සඳහා නොයෙකුත් යෝජනාවන් ඉදිරිපත් වේ. රජය කුරුඳු කර්මාන්තය නඟා සිටුවීම උදෙසා විශේෂ ප්‍රයත්නයක යෙදෙන මෙවන් අවදියක මෙවැනි අධ්‍යයනයක් නිති සම්පාදනය කරන්නවුන් ඇතුළු මෙම කර්මාන්තය කෙරෙහි උනන්දුවක් ඇති සැම දෙනෙකුගේම පරිශීලනය සඳහා අනගි කෘතියක් වේ යයි හඟිමි.

ටී.බී. සුබසිංහ
අධ්‍යක්ෂ.

# ස් තු ති ය

මෙහි කර්තෘවරයා මෙම මාතෘකාව කෙරෙහි පෙළඹවීමට රුකුලක් වූයේ කුරුඳු වවන පලාතක කරන ලද කෘෂිකාර්මික රැකී රක්ෂා රටාවන් පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී හෙළිදරව් වූ තොරතුරු රැසකි. මෙම සමීක්ෂණය ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සහාය ඇතිව එක්සත් රාජධානියේ විදේශ සංවර්ධන අමාත්‍යාංශයේ ආර්ථික හා සමාජ විද්‍යා කමිටුව මගින් කරන ලද්දකි. කුරුඳු කර්මාන්තයේ යථා තත්වය පුනරීක්ෂණය කර, සහනාධාර මගින් එය යළි පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් කෙරුණු නියැදි සමීක්ෂණයක් මෙහි දී ඉවහල් විය. මෙම සමීක්ෂණයේ දී දත්ත රැස් කිරීමෙන් හා ඒවා සකස් කිරීමෙන් ශං.ඒ. හේමචන්ද්‍ර, ඩබ්ලිව්.එම්. විජේපාල, පී.එම්. විමලසිරි යන තිදෙනා ගෙන් ලැබුණු සහයෝගය අගය කළයුතු ය. ඒ හැරුණු විට කුරුඳු කර්මාන්තයේ නියැලී සිටින බොහෝ දෙනෙකු පුද්ගලිකව ද, නිල වශයෙන් ද, වැදගත් තොරතුරු රැසක් සපයා දීමෙන් අපට කරන ලද සහාය ගැන තවත් බොහෝ දෙනෙකුට (ඒ අය නිර්නාමිකව සිටීමට අදහස් කරන බැවින්) ස්තුති කළයුතුව ඇත. මුල් පිටපත කියවා අගනා විවේචනයන් ගෙන් සංග්‍රහ කළ ජෝන් ෆැරින්ටන්, රිචඩ් හිවර් සහ ආචාර්ය එස්.ඩී.ඩබ්ලිව්. කිරින්ද යන මහතුන් ගේ සහාය ද ඉතා අගය කළයුතු ය. පුරුදු හැකියාවන් ගෙන් යුතුව සිංහල පිටපත ප්‍රකාශනය උදෙසා යතුරු ලියනය කළ ස්වර්ණා කරුණාරත්න මහත්මිය ගේ සේවය අගය කරමි.

## I වන කොටස ... හැඳින්වීම.

### 1. අරමුණ.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ කුරුඳු කර්මාන්තයේ ස්වභාවය පිළිබඳ විග්‍රහයක් කිරීම නොව, සමස්ථ වශයෙන් පුද්ගලික අංශය මත රැඳී තිබෙන කර්මාන්තයකට රජයේ මැදිහත් වීමෙන් ඇති වූ නව රටා, එයින් ඇති වූ ගැටළු ආදිය ගැන විමර්ශනය කිරීම යි. කෙසේ හෝ මෙම නිගමනයන් ගෙන් සෑහෙන ප්‍රමාණයක් කුරුඳු වගා කිරීම, සකස් කිරීම හා වෙළඳාම මත පදනම් වූ විවිධ පැවතුම් හා ආයතන මත විශ්ලේෂණය වූ බව සැලකිය යුතු ය. මේ අනුව මෙම කෘතියෙන් වැඩි කොටසක්, එනම් දෙවන කොටස කුරුඳු කර්මාන්තය ආශ්‍රිත විචාරාත්මක විස්තර යකට පිඩුගු කෙරේ. එහෙත් මෙය එයටම සීමා වූ විශේෂිත වැදගත්කමකින් යුක්ත වේ. මෙහි නිගමනයන් විවිධ කොටස් දෙකකට උපකාරී වන්නේ යැයි සැලකේ. කුරුඳු නිෂ්පාදනය හා අලෙවි යන් ඒ පිළිබඳව විශේෂිතව බලපාන රජයේ ප්‍රතිපත්තින් පිළිබඳ එක්තරා යෝජනා කිහිපයක් මෙහි දී ඉදිරිපත් වන බැවින් ඊට අදාළ ක්ෂේත්‍රයන්හි පුද්ගලයන්ට මෙය වැඩදායි වේ. අනිත් අතින් ශාස්ත්‍රීය වශයෙන් මේ විෂය හදාරන්නවුන් වෙනුවෙන්, කර්මාන්තයට බලපාන රජයේ ආයතනික හා දේශපාලනමය හේතු ද රජය කර්මාන්තයට මැදිහත් වීමේ ප්‍රතිවිපාක ද, සම්බන්ධයෙන් විස් තරාත්මක විග්‍රහයක් කෙරෙනු ඇත. මෙම කෘතියේ නිගමනයන්, ආර්ථිකයේ අනිකුත් අංශ කෙරේ ද, ලෝකයේ අනිත් රටවල් කෙරේ ද, පුළුල් වශයෙන් අදාළ වන්නේ ය. මෙහි අන්තර්ගත තොරතුරු හා විග්‍රහයන් සෑහෙන ප්‍රමාණයක් උක්ත අරමුණු දෙක සඳහා ම පොදුවේ යොමු වන අතර, බොහෝ කරුණු එකම පොදු නිගමනයක් කරා එල්ල වේ. රජය මැදිහත් වීමේ නිත්‍යානුකූල භාවය හෝ යෝග්‍යතාවය පිළිබඳව ඇති විශාල බලාපොරොත්තු රැසක් ද තවත් අතකින් රජය මගින් කෙරෙන බලපෑම් ද ලෙස එම අරමුණු දැක්විය හැක.

### 2. මූලාශ්‍ර.

ශ්‍රී ලංකා ඉතිහාසයේ සෑහෙන වැදගත්කමක් හිමි වූ භෝගයකි, කුරුඳු. මේ නිසාම කුරුඳු පිළිබඳ ඉතිහාසය ද ඉතා හොඳින් සටහන් වී ඇත. (1) මෙම කර්මාන්තයේ වර්තමාන තත්වය පිළිබඳව ලියැවී තිබෙන ලියවිලි ගණන ඉතා සීමිත ය. කුරුඳු නිෂ්පාදකයින් ගේ තත්වය පිළිබඳව 1971 දී සමීක්ෂණයක් කළ එස්. ද සිල්වා ඒ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉතා වැදගත් සංඛ්‍යානමය පසුබිමක් ඉදිරිපත් කරයි. මෙය ඉතා කඩිනමින් කරන ලද නිසා එහි රටේ දීර්ඝ විස්තරයක් නැත. මේ කර්මාන්තය ගැන පැහැදිලි විස්තරයක් ඩී.ජේ. කෝර්නල් සහ ඩී.කේ. උපවංශ විසින් රචිත 'ශ්‍රී ලංකාවේ කුරු බඩු කර්මාන්ත රටාව හා නිෂ්පාදන ආර්ථික විද්‍යාව' (ගොවීන් පිළිබඳ පාලන වාර්තා අංක 2. එක්සත් ජාතීන් ගේ සංවර්ධන සැලැස්ම/ ආහාර හා කෘෂිකර්ම සංවිධානය, කෘෂිකර්ම විවිධාංගකරණ සැලැස්ම, පේරාදෙනිය, 1972) ග්‍රන්ථයේ දක්නට ලැබේ. මෙහි විශාල කුරුඳු වතු 50 ක නියැදියකින් හා අදාළ නිෂ්පාදන

විශේෂයදම් පිළිබඳ විග්‍රහයක් ඇතුළත් ය. රජයේ ප්‍රතිපත්ති පිළිබඳ මොවුන් ගේ ඇතැම් නිගමන යන්ට වර්තමාන කතුවරයා ද එකඟත්වය පළ කරයි. කුරුඳු වගාව හා එහි ශිල්පීය තත්වයන් ගැන කෙටි විග්‍රහයක් කුරුඳු වගාව සහ එහි සැකසුම (ශිල්පීය සඟරාව, අංක 8, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව, 1973), යන සඟරාවේ දක්නට ලැබේ.

මේ වාර්තාව පදනම් වී ඇත්තේ ඉහත දැක් වූ ග්‍රන්ථ හා තවත් පළ කරන ලද ලිපි හා පත්‍රිකා වන්හි අඩංගු කරුණු ද, කුරුඳු කර්මාන්තයේ වෘත්තිය වශයෙන් නියැළුණු කිහිප දෙනෙකු සමඟ කරන ලද සාකච්ඡාවන් ද, කතුවරයා විසින් කරන ලද මූලික සමීක්ෂණ දෙකක තොරතුරු ද, පසුබිම් කර ගෙන ය. මෙහි මුල්ම ආර්ථික සමීක්ෂණය, අම්බලන්ගොඩට නුදුරුව පිහිටි කුරුඳු නිෂ්පාදකයන් හා කුරුඳු තලන්නන් වැඩි වශයෙන් ජීවත් වන බටපොළ ගම්මානයේ 1976/77 වර්ෂයන්හි මාස 12 ක කාලයක් තුළ කෙරුණු සුළු කුරුඳු නිෂ්පාදකයින් පිළිබඳ ආර්ථික සමීක්ෂණ යයි. බටපොළ ග්‍රාමයේ එක් රැස් කර ගත් තොරතුරු මේ කර්මාන්තය හා අදාළ ඉතාම වැදගත් හා සත්‍ය වූ තොරතුරු ලෙස පෙන්නුම් කළ හැකි ය. මේ සම්බන්ධ විස්තර පළමු වන උප ග්‍රන්ථයෙන් දක්වේ. දෙවන සමීක්ෂණය කුරුඳු නැවත වගාව හා පුනරුත්ථාපනය සඳහා ලැබුණු සහනාධාරවල සඵලදායක බව විග්‍රහ කෙරෙන සහනාධාර සමීක්ෂණය යි. එහි විස්තර 10 වන අංකය යටතේ දක්වේ.

II වන කොටස - කුරුඳු කර්මාන්තයේ ලක්ෂණ.

කුරුඳු පැලය හා එහි නිෂ්පාදන.

නිදැල්ලේ වැඩෙන්නට ඉඩ හැරීමෙන් කුරුඳු විශාල ගසක් ලෙස වැවේ. මෙහි ප්‍රයෝජනවත්ම කොටස ඉරා වේලා ප්‍රයෝජනයට ගනු ලබන කඳ කොටස ය. මෙයින් පිහිරි සුවඳක් ලැබෙන අතර, එය කෑම රස කර ගැනීමට යොදා ගන්නා ද්‍රව්‍යයක් ලෙස ද, ඖෂධීය ද්‍රව්‍යයක් ලෙස ද, භාවිතා කෙරේ. 16 වන සියවසේ අග භාගයේ ලංකාවේ නිරිත දිග පහත් බිම්වල පෘතුගීසි ජනපද බිහි කිරීමට ප්‍රධාන වශයෙන් පෘතුගීසීහු පෙළඹුනේ මේ ගසෙහි පොත්ත නිසා ය. එසේ වුව ද, අද කුරුඳු වනගතව වැවෙනු දැකීම ඉතා දුලබය. මෙම කුරුඳු වැවෙන ප්‍රදේශ පෘතුගීසීන් ගෙන් උදුරා ගත් ලන්දේසීහු කර්මාන්තයක් ලෙස කුරුඳු වගාව ආරම්භ කළහ. කුරුඳු වගාවේ දැන් පවතින වාණිජමය ස්වභාවය ආරම්භ වූයේ මෙලෙසිනි. කුරුඳු වගා කිරීමේ දී මුලින් ම කුරුඳු පැල එකට පැල කරනු ලැබේ. මේවා ක්‍රමයෙන් අඩි හතක්, අටක් පමණ උසට අඟල් ලක් පමණ ඝනකමට රිකිලි රැසකින් යුතු පඳුරක් ලෙස වැවේ. මෙම රිකිලි ගසේ මුලින්ම කපා ඒවායේ පොත්ත ගැලවීමෙන් කුරුඳු සකස් කෙරේ. කපන ලද රිකිලි වෙනුවට අළුත් රිකිලි නිරායාසයෙන් ම ඇදී එයි.

කුරුඳු පොතු ගැලවීම කුරුඳු නිෂ්පාදනයේ ඇති විශාලතම, එමෙන් ම වැදගත්ම ක්‍රියාවයි.

බටපොල සමීක්ෂණයට අනුව, කුරුඳු කැපීම හෙවත් පොතු ගැලවීම සඳහා සම්පූර්ණ කුරුඳු නිෂ්පාදනය පිණිස වැය වන කාලයෙන් 72% ක් පමණ යෙදවීමට සිදු වේ.

'කුරුඳු ගැලවීම කරන්නේ ඒ සඳහාම භාවිතා කරන එක් පැත්තක පමණක් මුවහත්, කවාකාර පිහිය කිනි. කුරුඳු රිකිල්ල, කොළ ඉවත් කර සකස් කර ගන්නා කුරුඳු තලන්නෝ ඊට පසු ඒවා ලෝහ කැට සමඟ එකට අතුල්ලති. තියුණු පිහියකින් අඟල් භාගයක් පමණ පළලට කුරුඳු කෝටුවේ දෙකෙළවර තිරස් කැපුම් දෙකකින් පොත්තේ කැපුමක් කරයි. ඊට පසු මුලින් ඇඳි කැපුමට සමාන්තරව අඟල් 1 ක පරතරය ඇතිව තවත් කැපුමක් යොදනු ලැබේ. ඉන්පසු මේ කැපුම් වලින් ගලවා කුරුඳු තීරු හෝ පයිප්ප ලෙස එක උඩ එක අඩි තුනහමාරක් පමණ දිගට අසුරනු ලැබේ. අඩු කොටස් පිරවීම සඳහා කුඩා කුරුඳු කැබලි යොදා ගනු ලැබේ. ඉන්පසු මේවා ලනු වලින් බැඳ රාක්කවල අසුරා සිසි පරිදි වියලෙන තුරු පවනේ තබනු ලැබේ. මෙම කුරුඳු පොතු සකස් කිරීමේ ක්‍රියාවලිය නිම වන්නේ පිටතින් ඇති තීරු අවශ්‍ය පමණට තද කොට දෙකෙළවර ක්‍රමවත් වන සේ කතුරකින් කැපීමෙනි'.[2]

කුරුඳු පොතු ගැලවීම පිළිබඳ වර්තමාන තත්වයෙහි කරුණු තුනක් පැහැදිලි අවධානයට යොමු විය යුතු ය. ඉන් පළමුවැන්න කුරුඳු පොතු ගැලවීම මනා පුහුණුවක් හා ශික්ෂණයක් අවශ්‍ය කාර්යයක් වීම ය. දෙවැන්න, මේ කාර්යය සම්බන්ධයෙන් අවශ්‍ය ඉවසීම හා දැඩි අවධානය යි. වැඩ කළයුතු වන පැය ගණන ඉතා දීර්ඝ වන නමුත් සුවිශේෂ ශාරීරික තත්වයක් අවශ්‍ය නොවන කාර්ය යක් බැවින් කුරුඳු පොතු ගැලවීම ඒ පිළිබඳ පළපුරුද්ද ලබා නැති අයෙකුට දුෂ්කර කාර්යයකි. එසේ ම කුරුඳු පොතු ගැලවීමෙහි නිරත වී සිටි කම්කරුවන්ට අනෙකුත් සාමාන්‍ය බර වැඩ කිරීම අසීරු ය. තෙවන කරුණ වනුයේ කුරුඳුවල තත්වය පිළිබඳ විශාල වගකීමක් කුරුඳු තලන්නා සතු වීම යි. මෙහි දී කුරුඳුවල ප්‍රමාණය හා වර්ගය පිළිබඳ පැහැදිලි අන්තර් සම්බන්ධතාවයක් ඇති බව පෙනේ. ඉතා කඩිනමින් කුරුඳු පොතු සකස් කරන කුරුඳු තලන්නකු ගේ කුරුඳු ඇසිරීම්වල තත්වය බාල විය හැකි ය. ඔබු පිරිසිදු, දිග හා කෙළින් පිළිවෙළකට සකස් වූ කුරුඳු පොතු නිෂ්පාදනය කිරීම සඳහා කාලය පිඩාගු නොකරයි. මේවාට ඉල්ලුමක් නැතැයි අප වරදවා වටහා ගත යුතු නොවේ. මේවා රසයෙන් උසස් නොවූව ද, සමහර විට විදේශීය ගැනුම්කරුවන් වැඩි මුදලකට මිළ දී ගනී.

ඉහත දැක් වූ කුරුඳු පොතු, කුරුඳු වලින් සාදනු ලබන ද්‍රව්‍ය සම්භාරයෙන් එකක් පමණි. මේ හැරුණු විට කුරුඳු පොත්ත ගැලවීමේ දී හා කැපීමේ දී ඉතිරි වන කුඩා කැබලි, පතුරු හා කුඩු ද, නිර්යාත කරනු ලැබේ. කුරුඳු කොළ හා තඳ තෙල් සිඳීම සඳහා වෙන වෙනම භාවිතා කෙරේ. පොතු ගලවා ගැනීමෙන් පසු ඉතිරි වන කුරුඳු කෝටු දර වශයෙන් පාවිච්චි කරනු ලැබේ. සමහර විට මේවා වෙළඳ භාණ්ඩ ලෙස ද යොදා ගනු ලැබේ. දර හිඟයක් තිබෙන සමහර ප්‍රදේශවලට මේ කුරුඳු කෝටු විපුල පලදායක ය. කුරුඳු පොතු හා සසඳද්දී කුරුඳු වලින් කෙරෙන අනිකුත් නිෂ්පාදන වැඩි වැදගත්කමක් නොදක්වයි. 1976 දී ශ්‍රී ලංකාවේ කුරුඳු වලින් ලැබූ නිර්යාත ආදායමින් 91% ක් ලැබුනේ කුරුඳු පොතු වලිනි[3]. ඒ අනුව මෙම අධ්‍යයන යෙහි බොහෝ විස්තර හා නිගමනයන් කුරුඳු පොතුවලටම සීමා වේ. එසේ වුවත් කුරුඳු පොතු

කෙරෙහි කරන විශ්ලේෂණ හා නිගමනයන් සමහර විට මුළු කර්මාන්තය කෙරෙහි ම බලපායි.

වේලීමෙන් පසුව කුරුඳු පොතු එක් වරක් හෝ කිහිප වරක් වර්ග කරනු ලැබේ. ඉන්පසු ඒවා දවන ලද සල්/ෆර් දුමෙන් වර්ණීකරණය කෙරේ. මෙසේ නිර්යාත වෙළඳ පොළ ප්‍රිය කරන අන්දමින් සුවඳක් හා පැහැයක් කුරුඳු පොතුවලට ලැබේ. ඊළඟ අවශ්‍යතාවය කුරුඳු පොතු රාත්තල් 100 මිටි වලට බැඳ ගෝනිවලට ඇසිරීම ය. මේ තත්වයෙන් කුරුඳු වර්ෂ ගණනාවක් නරක් නොවී තබා ගත හැකි ය. මේ කුරුඳු පොතු සකස් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම නැවී ගත කරන්නන් හෝ විශාල තොග වෙළඳුන් අතින් ඉටු වනු ඇත.

ඉහතින් දැක් වුනු කරුණු අනුව සළකා බලන විට කුරුඳු පොතු, කුරුඳු ගහේ එකම නිෂ්පාදනය නොවන බව පෙනෙනු ඇත. එහි නිල වශයෙන් හඳුනා ගත් වර්ග එකොළහක් පමණ ඇත. මෙම වර්ග කිරීම කුරුඳු පොත්තේ ඝනකම හා පැහැය වෙනස් වීමේ උපරිම තත්වය මත සිදු කර ඇත. මේ හැරුණු විට කුරුඳු මිළ දී ගනු ලබන්නා විසින් සංකේත ලෙස මිළ මට්ටමක් යටතට පමුණුවනු නොලැබූ නමුත්, මිළ දී ගැනීම කෙරෙහි බහු පොළඹවන පැහැදිලි ලක්ෂණ කිහිපයක් ඇත. නිදසුනක් ලෙස කුරුඳු පොත්තේ ඝනකම සිහින්වත්ම එය වඩාත් තීව්‍ර රසයකින් යුක්ත වේ. එසේ වුව ද, වර්ගය පිළිබඳ සම්පූර්ණ බලපෑමක් වගාවන් ගේ පිහිටීම මත තීරණය වේ. ඉතාම හොඳ කුරුඳු පොතු කොළඹට උතුරින් ජා-ඇල හා ඒකල අතර ඇති සුදු වැලි තීරයෙන් ලැබේ. මේ ප්‍රදේශයෙන් ලැබුණු පොතු වැඩි ප්‍රමාණයක් විශේෂ සී5 නම් වූ හොඳම වර්ගයේ ය. අම්බලන්ගොඩ හා අනෙකුත් දකුණු දිස්ත්‍රික්කවල නිෂ්පාදනය කරන එච්2 වර්ගයට වඩා මෙය අගයෙන් වැඩි ය. එච්2 වර්ගයේ රාත්තලක මිළ මෙන් දෙගුණයක් ආදායම සී5 වර්ගයේ එක රාත්තලකින් ලැබේ. ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක (4) නිෂ්පාදනයෙන් 72% ක් පිළිබඳ වගකීම් දරයි. ඉතිරි සියල්ලම පාහේ දක්නට ලැබෙන්නේ හම්බන්තොට රත්නපුර හා කළුතර ප්‍රදේශයන්හි ය.

කුරුඳු දිවයිනේ එක්තරා කොටසකට පමණක් සීමා වී තිබුණ ද, සමහර කුරුඳු වගාවන් වෙත ළඟා වීම පවා ඉතා අසීරු වේ. මීට ප්‍රධාන හේතුව තේ, රබර් හෝ පොල් වගාවන් සඳහා නුසුදුසු බිම් තීරයන් හා පස් වර්ගයන්හි මේවා ඉතා හොඳින් වැඩීම ය. මෑත කාලයක් වන තුරු කැලෑවෙන් වැසී තිබුණු නමුත් ජනගහණ වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ජනාවාස වීමට ආධාර වී ඇති නිසරු ප්‍රදේශයන්හි ද දැන් කුරුඳු වගාව පටන් ගෙන ඇත. පසුගිය දස වර්ෂය තුළ කුරුඳු මිළ අඩුවීම නැතහොත් මිළ ස්ථාවර වීමක් දක්නට ලැබුණ අතර එය නිෂ්පාදනය වර්ධනය වීමේ හේතුවක් ලෙස නිර්වචනය කළ හැක (4 වන කොටස). පිහිටීම පිළිබඳ ප්‍රශ්නයේ දී ගමන් බිමන් දුෂ්කරතාවය නිසා බොහෝ කුරුඳු නිෂ්පාදකයන්ට වගා නිලධාරියා හෝ අනෙකුත් රජයේ නිලධාරීන් ගේ සහාය ලබා ගැනීම දුෂ්කර වී ඇත. එහෙත් ඉතා නිසරු ලෙස වැඩුනු තේ මෙන් කුරුඳු නිසා ද පසෙහි සෝදා පාළුව සිදු වේ. කුරුඳු පැළ ඉතා ළඟින් ළඟින් සිට වීම කෙරුණ ද, උසස් නිෂ්පාදනයක් ලබා ගැනීමට නම් නිරන්තරයෙන් ම තණ කොළ ඉවත් කළයුතු බැවින් කුරුඳු වලින් පසට සෙවන ලැබෙනුයේ මඳ වශයෙනි. ඒ හැරුණු විට බොහෝ කුරුඳු වගාවන් දුර්වල තත්වයෙන් පාලනය කර ගෙන යාම නිසා දුර්වල හෝ

පරණ පැල වෙනුවට අළුතින් පැල සිටුවීමක් නොකරන නිසාත්, මේ සෝදා පාළුව විශේෂ ප්‍රශ්නයක් වී ඇත. (6 වන කොටස) කුරුඳු තෙල් නිෂ්පාදනය වැඩි වීම මෙම ප්‍රශ්නයත් තවත් ගැටළු සහගත තත්ත්වයක් ඇති කරයි. මුල දී මෙන් නොව, දැන් කපන ලද කොළ හා රිකිලි කුරුඳු තෙල් පෙරීමේ යන්ත්‍රාගාර සඳහා විශාල ලෙස විළ දී ගන්නා හෙයින් කොළ හා රිකිලි වලින් පසට කලින් ලැබුන සාරය දැන් නොලැබෙයි. සාමාන්‍ය බෑවුම්වලට වඩා සීඝ්‍ර බෑවුම්වල වවන ලද කුරුඳු නිසා පස සේදී යාමේ ප්‍රශ්නය වඩාත් තීව්‍ර වී ඇත.

සහභාධාර සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලද ඒකකයන් ගෙන් තෝරා ගන්නා ලද ඒකක 81 ක නියැදියේ භූමි ප්‍රදේශ විස්තරයෙන් මෙම ගැටළුවේ තියුණු බව අවධාරණය කළ හැක. මෙම නියැදියෙන් වගාවන් අටක් සම භූමියෙහි ද, හතක් රළු භූමියෙහි ද, 31 ක් කඳු බිම්වල ද දක්නට ලැබුණි. වගාවන් 32 ක් වූයේ තියුණු බෑවුම්වල ය. ඒ සටහන් වලින් පැහැදිලි වන්නේ කුරුඳු වැවීම කෙරෙන්නේ පස සේදී යාමට බහුල වශයෙන් ලක් වූ භූමි ප්‍රදේශවල බව ය. මෙහි දී නිසියාකාර පිරිවැය, ප්‍රතිලාභ විග්‍රහයක් කළේ නම්, එයට පස සේදී යාම පිළිබඳ සමාජ පිරිවැයත් එකතු කිරීමට සිදු වනු ඇත. ඒ අනුව විමසන විට සමස්ථයක් ලෙස කුරුඳු කර්මාන්ත යෙන් රටට සිදු වන ශුද්ධ වාසිය ඉතා අල්ප වන බව පෙනී යයි.

කුරුඳු වැවීම පිළිබඳව මඳ හෝ අපේක්ෂාවක් ඇති වීමට එකම හේතුව නම්, එය නිසරු කඳු ඉඩම් සඳහා සුදුසු එකම භෝගය වීමත්, කාලීන භෝගයක් බැවින් පහසුවෙන් ම අනෙකුත් වගා වන් සඳහා ගැළපුනු කර ගත යුතු ශ්‍රම කාලය අනුව කුරුඳු කැළීමේ කාල වේලාවන් වෙනස් කර ගත හැකි වීමත් ය. මෙවැනි වාසිදායී තත්වයක් කුඩා බිම් කට්ටි හිමියා අගය කරයි. කුරුඳු නිෂ්පාදනයේ දී සම්පූර්ණ වැඩ කොටසින් 3/4 ක් ම කුරුඳු පොතු කැපීමත්, ගැලවීමත්, සකස් කිරීමත් සඳහා යෙදෙන බැවින් ඊට උචිත කාලයක් වෙන් කර තබා ගැනීම වැදගත් ය. මුලින් පොතු ගැලවීම සිරිතක් වශයෙන් මැයි සිට සැප්තැම්බර් දක්වා කෙරෙන අතර, ජනවාරි මාසයේ සුළු අතුරු කාලයක දී තවත් කොටසක් කපනු ලැබේ. මේ හැම අවදියක් ම මෝසම් වැස්ස කට පසු එළඹෙන කාලය බැවින් එය පොතු ගැලවීම සඳහා විශේෂයෙන් සුදුසු ය. කඳේ ඇති ජලය වාෂ්ප වී යාමේ හේතුවෙන් කුරුඳු පොතු ගැලවීම මෝසම් වැස්ස ළඟ අවස්ථාවක දී හැර පහසුවෙන් හා සූක්ෂ්ම ලෙස ඉවත් කළ නොහැකි ය. විශේෂයෙන් කුඩා කර්මාන්ත කරුවන් ගේ අංශයෙහි මෙය වඩාත් සංකීර්ණ වේ. 1 සිට 3 දක්වා වූ බටපොල සමීක්ෂණයට අදාළ ප්‍රස්ථාර සටහන් පවසන අන්දමට අවුරුද්දේ සෑම දිනකම පොතු ගැලවීම සිදු වන බව කිව හැකි ය[5]. එසේම පොතු ගැලවීම හා එයින් අනෙකුත් කාර්යයන්ට ඇති බලපෑම සම්බන්ධයෙන් කරුණු කිහිප යක් ද සමීක්ෂණයෙන් පැහැදිලි කෙරේ. කුරුඳු පොතු ගැලවීම සඳහා බොහෝ විට කුඹුරු වැඩ නැති විවේකී කාලය යොදා ගනු ලැබේ. කුලී ශ්‍රමය නොව, පවුලේ ශ්‍රමය යොදා ගන්නා අවස්ථාවන්හි දී මෙය ඉතා වැදගත් ය. කුරුඳු කැපීම් නොකරන කාලවල දී තණ කොළ ගැල වීම, ගස් කප්පාදු කිරීම, පොහොර දැමීම හා භෝගී සකස් කිරීම ආදී පිරිසිදු කිරීමේ කටයුතු කරනු ලැබේ. අප්‍රේල් මස පැවැත් වෙන සිංහල අළුත් අවුරුදු උත්සවය සඳහා මුදල් ලබා ගැනී මේ අටියෙන් බොහෝ කුරුඳු තලන්නෝ මාර්තු මස අග භාගයේ දී කුරුඳු ගැලවීම ආරම්භ කරති. මෙසේ බොහෝ කුඩා බිම් කට්ටි හිමියන්, තමන් ගේ සම්ප්‍රදායික වාර්ෂික හෝ වෙනත්

ඕනෑම උත්සවයකට වැනි පෞද්ගලික අවශ්‍යතාවයකට අදාළ මුදල් වහාම ලබා ගත හැකි මාර්ග යක් වශයෙන් සලකා කුරුඳු පොතු ගැලවීම ආරම්භ කරති. පොතු ගලවන කාලය සුසුදු (?) තැද්ද යන්න හෝ අනෙකුත් කරුණු මෙහි දී ඔවුනට වැදගත් නොවේ.

අනික් අතින් කුරුඳුවල අඩු මිළ, නිෂ්පාදනයේ විශේෂ තත්වයකි. මෙහි පහත දැක්වෙන අන්ද මට කුරුඳු මිළ ගණන් පුරල් විචල්‍යතාවයන්ට භාජනය වේ. නිෂ්පාදකයෝ කුරුඳු මිළ වැඩි අවස්ථාවල දී වැඩි වශයෙන් පෞද්ගලිකවම කුරුඳු තැලීම වැනි කාර්යයන්හි නියුතු වන අතර, මිළ අඩුවත්ම එම කාර්යයන් පමා කෙරේ. මෙය සාමාන්‍යයෙන් තාර්කික වුව ද, සමස්ථයක් ලෙස වෙළඳ පොලේ අඩු මිළ රඳවා ගැනීමට සමත් වේ. මිළ ඉහළ යන අවස්ථාවන්හි දී හොඳින් නොවැඩුණු කුරුඳු ගස්වල පවා පොතු ගලවනු ලැබේ. මේ නිසා ගසෙහි ශාඛා පත්‍ර ඝන වීමෙන් ඊළඟ වාරයේ නිෂ්පාදනයට ගස සකස් වීම සඳහා සාමාන්‍යයෙන් (6) වැඩි කලක් ගත වේ. මේ කල් පමාවෙන් කුරුඳුවල නියුණු හිඟයක් ඇති වීමත්, ඒ මගින් මිළ උද්ධමනයක් ඇති වීමත් සිදු වේ.

උක්ත හේතූන් මත බලන විට එකම කුරුඳු වගාවක වුව ද, අවුරුද්දෙන් අවුරුද්දට කුරුඳු කපන කාලය වෙනස් විය හැකි ය. ගසෙහි වැඩීමත්, කුරුඳු පොතු ගැලවීමත් අතර වාර ගණන තීරණය කරන ශිල්පීය සාධක අතර ජල වාෂ්ප රැඳී සිටීම, වර්ෂාපතන ව්‍යාප්තිය, පසෙහි තෙත මනය හා පෝර යෙදීම ද වැදගත් වේ. සමහර නිෂ්පාදකයෝ මුළු අවුරුද්ද පුරාම පාහේ පොතු ගැලවීම කරති. ඒ තම වගාවන්හි කාර්ය සඳහා තමා ගේ හා තම පවුලේ ශ්‍රමය ඔවුන් සතු ඉඩම්වලට යොදා ගන්නා වෙනත් ඊකියාවක නියුතු නොවුනු ගොවියෝ හා අවුරුද්ද මුළුල්ලේ ම ස්ථිරව කුරුඳු තලන්නකු සේවයේ යොදවා ඔවුනට වැටුප් ගෙවන ලොකු ඉඩම් හිමියෝ ද වෙති. බොහෝ නිෂ්පාදකයෝ කුරුඳු තැලීම සඳහා කුලීකරුවන් යොදා ගැනීම හෝ අනෙකුත් වැඩ වලින් ඉවත් වී එම කාර්ය කිරීම, අවුරුද්දකට දෙවරක්, අවුරුද්දකට වරක් හෝ අට මසකට වරක් ලෙස සිදු කරති. මේවා බොහෝ විට ඉතා උචිතතම අවස්ථා පිළිබඳ සංකල්පයන් මත පිය නිෂ්පාදකයන් විසින් සත්‍ය ලෝකයේ අනුගමනය කරන ප්‍රතිපත්ති මත නොපිහිටවූ ඒවා බැවින් නියම කාල සීමාවන් බොහෝ දුරට මීට ඉහතින් දැක් වූ කරුණු මත විචලනයන්ට භාජනය වීමට ඉඩ ඇත. 1 වන සටහනේ බටපොල සමීක්ෂණයට අනුව 1976 ඔක්තෝබර් මස සිට 1977 සැප් තැම්බර් දක්වා වූ සමීක්ෂණ කාලය තුළ වගාවන් ගේ පොතු ගැලවීම කල වාර ගණන පෙන්වා දෙයි.

1 වන සටහන.

සමීක්ෂණ වර්ෂයේ දී බටපොල නිකැඩියේ වගාවන්හි

කුරුඳු පොතු ගැලවීම කරන ලද වාර ගණන

| කුරුඳු පොතු ගලවන වාර ගණන | 0 | 1 | 2 | 3 | 4 | සෑම දිනකම | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| වගාවන් ගණන | 3 | 23 | 2 | 2 | 1 | 18 | 81 |

පරීක්ෂණයට අනුව එක් නිෂ්පාදකයින් පිරිසක් වර්ෂය පුරාල්ලේ ම කුරුඳු පොතු ගැලවීම කල ද, සමහර නිෂ්පාදකයින් එය වසරකට වරක් හෝ දෙකකට සීමා කරයි. සමහරු පොතු ගැලවීමක් සිසිපේසීම නොකරති.

**කුරුඳු නිෂ්පාදන සඳහා වෙළඳ පොල.**

දේශීය ප්‍රයෝජනය සඳහා යොදා ගනු ලබන කුරුඳු ප්‍රමාණය කෙතරම් අල්ප දැයි කිවහොත් නිෂ්පාදකයෙහි සම්පූර්ණ කුරුඳු ප්‍රමාණය ද, සම්පූර්ණ කුරුඳු ආයාත ප්‍රමාණය ද, අතර වැඩි වෙනස්කමක් නැතැයි සැලකිය හැකි ය. කුරුඳු කර්මාන්තයේ නියැලීන බොහෝ දෙනෙකුට වාසනාව ගෙන එන්නේ ජාත්‍යන්තර වෙළඳ පොලයි. එසේ වුව ද හැම විටම පෙවැති වාසිදායක තත්ව යක් ඇති නොවේ. ඈත අතීතයේ පවා කුරුඳු 100% ක් ම නිර්යාත භෝගයක් ලෙස වගා කෙරුණි. ඈත ඉතිහාසයේ කුරුඳු නිෂ්පාදකයින්ට ලැබුණු වාසි සියල්ලක් ම පාහේ රාජ්‍ය තීරණ යන් මත ක්‍රියාත්මක වූ ඒවා ය. ආදි කාලයේ පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි රාජ්‍ය පාලන තන්ත්‍රයන්හි රජයේ ආදායම් ලැබෙන මූලික මාර්ගයක් වූයේ කුරුඳු ය. එකල කුරුඳු වෙළඳාම රජයේ ඒකාධිකාරයක් ලෙස හෝ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් කිහිප දෙනෙකු ගේ පුද්ගලික ව්‍යාපාරික ඒකකයක් ලෙස හෝ පැවතුණි. මේ සඳහා කුරුඳු සැපයුම බදු ගිලව්වට ලබා ගන්නා ලදී. වාර්ෂිකව ස්ථාවර කෙරුණු ප්‍රමාණයක් මගින් බදු ගෙවීමට සමහර කණ්ඩායම්වලට බල කරන ලදී. දැනට ඇති සලාගම කුලය මෙම කණ්ඩායම් තුළින් මතු වූවකි. මෙහි දී කුරුඳු වෙළඳාම සම් බන්ධයෙන් අය කරන ලද අත්තනෝමතික අයුතු ගාස්තුවෙන් ලැබුණු ඒකාධිකාරී ලාභ නිසා චීන කසියා වර්ගයේ වෙළඳ පොල තරඟයකට යටත් වීමට කුරුඳු වලට සිදු වූ අතර, පසු කාලයක කුරුඳු නිදහස් වෙළඳ භාණ්ඩයක් ලෙස නම් කිරීමට ද හේතු විය.

යුරෝපියයන් ආසියාව ආක්‍රමණය කළ අනෙකුත් කුළු බඩුවල සේම කුරුඳුවල ද දැන් ආර්ථිකමය වැදගත්කමක් හීන වී ඇත. 1972 සිට 1976 දක්වා ශ්‍රී ලංකාවේ නිර්යාත ඉපැයුම් වලින් 1% ක් ආදායම් පමණි, කුරුඳු වලින් ලැබුනේ[8]. එසේ වුව ද, ශ්‍රී ලංකාවේ කුරුඳුවල උසස් බව නොනැසී පැවති කාලයේ ඇති වූ හැසිරීම් රටාව තවමත් වෙනස් නොවී පවතී. තවද, බොහෝ කුරුඳු නිෂ්පාදනය කරන්නන් සලාගම කුලයට අයත් ය. ශ්‍රී ලංකාවේ කුරුඳු ඉල්ලුම ස්ථාවර වී ඇත්තේ පුරාණයේ සිටම තීරණය වූ වැදගත් වෙළඳ පොලවල ය. මේවායින් විශාල තම හා මූලිකම වෙළඳ පොල ස්පාඤ්ඤ භාෂාව කථා කරන ලෝකයේ, එනම් ස්පාඤ්ඤ ඇමෙරිකාවේ පිහිටි ඇත. මේ සම්බන්ධ වාර්තා දක්වන අන්දමට ශ්‍රී ලංකා කුරුඳු නිර්යාතයෙන් සම් පූර්ණ අර්ධයකට වැඩි ප්‍රමාණයක් මේ රටවලට යැවේ. ඇමෙරිකා එක්සත් ජනපදයට යැවෙන කුරුඳු වලින් සැහෙන ප්‍රමාණයක් මැක්සිකෝව නීති විරෝධී ලෙස කොල්ලකා ගැනීමේ හේතුවෙන් සත්‍ය ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණය මීටත් වඩා වැඩි විය හැකි ය. මැක්සිකෝව ශ්‍රී ලංකා කුරුඳු වලින් 1/3 ක් භාවිතා කරන අතර, ඉතිරි කොටස් පිනමත් වී හෙවත් කුරුඳු තේ සකස් කිරීම සඳහා යොදා ගනු ලැබේ. ස්පාඤ්ඤ බස කථා කරන ලෝකයේ අධික කුරුඳු පරිභෝජනය ආර ම්භ වූයේ ස්පාඤ්ඤ ලෝකයේ දියුණුතම වෙළඳ ජාතීන් වශයෙන් නම් දරා සිටි තාන්ත්‍රික යුගයේ දීය.

එහෙත් කුරුඳුවල ලාභදායිතාවය නිසාම ශ්‍රී ලංකාව යටත් කර ගත් පෘතුගීසි, ලන්දේසි, බ්‍රිතාන්‍ය වැනි අනෙකුත් යුරෝපීය ජාතීන් මෙම භාණ්ඩය කෙරෙහි විශේෂ රුචියක් නොදැක්වූහ. යුරෝපයේ සහ දකුණු ඇමරිකා ධනවාදී කාර්මික ජාතීන් ස්පාඤ්ඤ බස කථා කරන ලෝකය වෙත ඉලක්ක නොවූ සියළු ම කුරුඳු ප්‍රයෝජනයට ගත්හ. ලෝකයේ කුරුඳු අලෙවිය පිළිබඳව අතීතයට වඩා අප ගේ අවධානය යොමු විය යුත්තේ අනාගතය කෙරෙහි ය. එය මෙරට නිෂ්පාදනය සඳහා නීති කෙටුම්පත් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු මූලික කරුණක් ලෙස සැළකිය හැක. ජාත්‍යන්තර වෙළඳ පොලේ මෙම භාණ්ඩයේ ඇති සන්කීර්ණ භාවය එහි ඇති විශේෂ නිෂ්පාදන සංඛ්‍යාව ද, ඒ ඒ නිෂ්පාදනයන් රටකට හෝ දෙකකට සීමා වූ අතර, එකිනෙකට විශේෂිත වූ ක්ෂණික ගුණාංගයන් ද ඇති බව වටහා ගත යුතු ය.

කෙසේ වෙතත් මිළ හා වර්ගය අතින් ශ්‍රී ලංකාවේ කුරුඳු පළමුවන තැන ගනී. එය ලොව පුරා වෙළඳ පලකම පළමුවන ස්ථානය ගන්නා හොඳම කුරුඳු වර්ගය යි. ලංකාව හැරුණු විට සීසෙල්ස් හා මලගාසි යන රටවලින් ද කුරුඳු නිර්යාත කරනු ලැබේ. එහෙත් ඔවුන් නිපදවන්නේ ශ්‍රී ලංකා කුරුඳු ප්‍රමාණය හා සසඳන විට ඉතාම සුළු කොටසක් පමණි. මලගාසියෙහි කුරුඳු යුරෝපීය ආර්ථික වෙළඳ සමාජයේ වෙළඳ පොල වලට අනුග්‍රහපරිවාසව පිවිසුමක් ලබා ගැනීමට සමත් වී ඇත. නිෂ්පාදනය හා මිළ අතින් කුරුඳුවලට වඩා පහත් ස්ථානයක් හිමුණු ද, කැසියා වෙළඳ පල කුරුඳු හා එකට තරඟ කරන බව සංඛ්‍යා ලේඛන කෙටුම්පත් ආදියේ සඳහන් වේ. කැසියා කුරුඳු වලට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් පැලෑටියක් වුව ද, එහි රසය හා ඉල්ලුම ඒ සම්බන්ධ අවශ්‍යතාවයන් ජනනය කරයි. චීනය හා ඉන්දුනීසියාව කැසියා නිර්යාත කරන ප්‍රධාන රටවල් වේ. එහෙත් සාධාරණව සලකන විට කැසියා හා කුරුඳු යන දෙවර්ගයම එකිනෙක මිළ හා සැපයුම අතර ආදේශනයක් ලෙස ද තරඟකාරී භාණ්ඩයක් ලෙස ද ක්‍රියා කරනු පෙනේ. එසේ වුව ද, සමහර රටවල විවිධ අවශ්‍යතාවයන්ට විවිධ වර්ගයන් ප්‍රිය කරනු ඇත.

1960 සිට 1972 කාලය තුළ ලෝකයේ කුරුඳු ආයාත ප්‍රමාණය වර්ෂයකට සාමාන්‍යයෙන් 0.9% කින් වැඩි වී ඇත. (9%). මේ සාමාන්‍ය ප්‍රතිශතය තුළ නිර්යාත රටෙහි කෙටි කාලීන මිළ විචලනය ද හා නිර්යාත පරිමාණයන් ද සැඟ වී ඇතැයි සිතිය හැක. මේ අනුව ධිනැම අයෙකුට තෝරා ගත් කාල පරිච්ඡේද ගණනක් සඳහා මිළ හා නිෂ්පාදනය පිළිබඳ ප්‍රවණතාවය දක්වන සංඛ්‍යාති දැනට තිබෙන සංඛ්‍යානයන් අතුරින් සකස් කර ගත හැකි ය. මෙහි දී අතීත අත්දැකීම් මගින් අනාගත වෙළඳ පල සැලසුම් කිරීමේ දී ඉවු වන්නේ ඉතා අල්ප සහායක් පමණි. ඒ කෙසේ වුව ද, පසුගිය ශත වර්ෂය මුළුල්ලේම වෙළඳ පොල තත්වය ගැන පැහැදිලි දර්ශනයක් සකසා ගැනීමෙන් අප ගේ තර්කය වඩාත් පහසු වනු ඇත. දෙවන සටහනින් 1977 දක්වා නිර්යාත කරන ලද කුරුඳු පොතු හා පතුරු පිළිබඳ නැව් ගත කරන්නන් ගේ සත්‍ය හා මූල්‍යමය මිළ ගණන් පිළිබඳ දර්ශනයක් දැක්වේ. මෙම මිළ ගණන් රුපියල් වලින් දක්වා ඇත. එම දත්තයන් විදේශීය මුදලට පරිවර්තනය කිරීම වඩාත් අසීරු දායක වන්නේ සාමාන්‍ය විනිමය අනුපාතිකයේ සිදු වන වෙනස් වීම් හා රුපියල සඳහා මෙම කාල පරිච්ඡේදය මුළුල්ලේ ම පැවති විවිධ විනිමය අනුපාතික රටාවන් නිසා ය. කුරුඳු නැව් ගත කරන්නන් පොලී අනුපාතිකයක් ලැබූ නමුත් එය තෙවරක් ම සංශෝධනය කරන ලදී. එම නිසා පසුගිය ශත වර්ෂයේ විනිමය අනු

පාතිකය වෙනස් නොකරන ලද අවුරුදුවල පමණි, මෙහි තොරතුරු දක්වා තිබුණේ. දෙවන සටහනේ නිගමනයන් තීරණය කරන විට අවධානයට යොමු කළයුතු කරුණු රාශියක් තිබේ. ඉන් පළමුවැන්න මෙහි පදනම් වර්ෂය ලෙස ගත් 1967 ඊට පෙර හා පසු වර්ෂවලට වඩා අඩු මිල ගණනක් පැවති වර්ෂයක් වීම යි. එහෙත් වෙනත් පදනම් වර්ෂයක් හෝ වර්ෂ කිහිපයක් හෝ මේ සඳහා යොදා ගත්තේ නම් එම ගත වර්ෂයේ මිල ප්‍රවණතාවය මීටත් වඩා පරිහානි තත්ත්වයක් පෙන්නුම් කරනු ඇත (10). දෙවැනි කාරණය ලෙස ගත හැක්කේ 1974 අග භාගයේ දී නිර්දේශ කරන ලද අවම මට්ටම් මිල ප්‍රතිපත්ති යයි. (අවම මට්ටම් මිළ 13 වන කොටස) ඒ මගින් නැව් ගත කරන්නන් විසින් අඩු මිළ ගණන් වලට සැපයුම් පත්‍ර සකස් කොට එමගින් විදේශ විනිමය නීති විරෝධී ලෙස විදේශයන්හි රඳවා ගැනීමේ මෙතෙක් පැවති තත්වය වැළැක්වීම අපේක්ෂා කරන ලදී. එහෙත් 1974 මුල භාගයේ දී (අවම මට්ටම් මිළ ක්‍රියාත්මක වූයේ 1974 අග භාගයේ ය). ඇත්තවශයෙන් ම ලැබුණ මිළ ගණන් දැනට සටහනේ දක්වා ඇති සංඛ්‍යාවන්ට ද වඩා ඉහළ විය හැකි යයි අපේක්ෂා කළ හැක. තෙවැනි කරුණ නම්, 1975 දී නීති ගත වූ මැක්සිකෝ - ශ්‍රී ලංකා කුරුඳු පිළිබඳ ඒකාධිකාරය පිළිබඳ පණතින් (13 වන කොටස) නැව් ගත කරන්නන් ගේ ලාභ ඉතා විශාල ලෙස ඉහළ ගියේ ය. එසේ වුව ද, නැව් ගත කරන්නන් හා සසඳන කළ නිෂ්පාදකයින්ට ලැබුනේ ඉතා අඩු මිළකි. උක්ත කරුණු දෙකින් ම පිළිඹිබු වන්නේ දෙවන සටහනේ දක්වෙනවාට වඩා අවම තත්ත්වයක් කුරුඳු නිෂ්පාදකයින් ගේ ආදායම සම්බන්ධයෙන් පසුගිය ගත වර්ෂයේ දී පැවතුනු බව ය. එසේම 1971 අග භාගයේ දී ආරම්භ වී (1978 අගෝස්තු) මේ ලියන කාලය දක්වා ම පැවතුන නිෂ්පාදන හා නිර්යාත මිළ ගණන්වල ඉහළ යාම මේ සටහනේ සඳහන් නොවේ. මේ අනුව කුරුඳු පොතු සඳහා 1978 මැද භාගයේ වූ සත්‍ය නිෂ්පාදන මිළ ගණන් ද, ඊට අවුරුදු දහයකට පෙර තිබූ මිළට සමාන බව පෙනේ. එසේ වුව ද, 1967 හා 1977 අතර නිර්යාත කරන ලද කුරුඳු පොතු හා පතුරු ප්‍රමාණය දෙගුණයක් විය.

දෙවන සටහන. කුරුඳු නිර්යාත ධාරිතාව හා අගය අනුව 1967 - 1977*

| | 1967 | 1970 | 1971 | 1973 | 1974 | 1975 | 1976 | 1977 |
|---|---|---|---|---|---|---|---|---|
| කුරුඳු පොතු හා පතුරු නිර්යාත ප්‍රමාණය හොණ්ඩර දශම වලින් | 607 | 827 | 878 | 1281 | 151.0 | 74.1 | 116.2 | 113 |
| කුරුඳු පොතු හා පතුරු නිර්යාත ධාරිතාවේ දර්ශකය | 100 | 136 | 145 | 211 | 249 | 122 | 188 | 186 |
| සාමාන්‍ය නිර්යාත මිළ (පතුරු හොණ්ඩරයක මිළ රුපියල් වලින්) | 564 | 406 | 353 | 356 | 513 | 589 | 657 | 700 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නිර්යාත මිල දර්ශකය | | | | | | | | |
| පතුරු | 100 | 72 | 63 | 63 | 91 | 104 | 116 | 124 |
| ජාතික මිල දර්ශකය | 100 | 119 | 121 | 145 | 182 | 197 | 210 | විස්තර නැත. |
| පතුරුවල නියම මිල දර්ශකය | 100 | 61 | 52 | 42 | 50 | 53 | 55 | විස්තර නැත. |

* මෙම දත්තයන්හි මූලාශ්‍රය ශ්‍රී ලංකා මහ බැංකු විවරණිකාවේ ප්‍රකාශන කිහිපයක 32 වැනි සටහනය.

XX මේ වටිනාකම් රේගු තීරු බදු ගාස්තු සහිතව ද, රහිතව ද, යන්න සඳහන් කර නැත.

XXX මෙය වෙනත් අයුරකින් කිවහොත් දළ දේශීය නිෂ්පාදන පහත හෙළීමේ උපකාරකයකි. මෙය නිර්යාත භාණ්ඩයන්ට ඉතා ඉහළ මිලක් දෙන දේශීය භෝග හෝ සිල්ලර මිල දර්ශනයන්ට සමානකම් නොදක්වයි. 1976 හා 1977 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා වන්හි පළමු වන සටහන.

මේ සංඛ්‍යාන සටහන් කුරුඳු නිෂ්පාදකයාට එතරම් පැහැපත් අනාගතයක් නොපෙන්වයි. වර්තමාන වෙළඳ පොල තත්ත්වය ද එසේම අපැහැදිලි ය. ආයාත කරනු ලබන රටවල් වල ද ඉල්ලුමේ වර්ධනය දක්වන්නේ ආදායම් තත්ත්වයන් ඉහළ යාමෙන් නොව, ජනගහණ වර්ධනයන් නිසා ය. (11).

අනිකුත් කුළු බඩු මෙන් නොව, කුරුඳු පොතු වලට ආහාර නිෂ්පාදනය පිළිබඳ නවීන ශිල්ප ක්‍රම වලින් සෑම විටම වාගේ අභියෝගයක් ද එල්ල වී ඇත. ඒ අනුව කෘත්‍රිම කුරුඳු පොතු බිහි වී ඇත. එහෙත් සෑම කෙනෙක් ම කුරුඳු පොතු වෙළඳ පොල පිළිබඳ අභියෝගයට එකඟ නොවෙති. සමහර සර්ව සුභවාදීන් පෙන්වා දෙන්නේ ළඟදීම ලෝක වෙළඳ පොලේ කැසියා සැපයුමේ ස්ථිර අඩුවීමක් ඇති වන හෙයින්, ධනවත් තෙල් රටවල කුරුඳු ප්‍රචලිත කරවීම ප්‍රත්‍යාගෝචර බව යි. එසේ වුව ද, සංඛ්‍යා ලේඛන හා අනිකුත් තොරතුරු වලට අනුව අනාගත ලෝකයේ කුරුඳුවල මිල ස්ථාවර ඉල්ලුමක් මත පදනම් වනු ඇතැයි සිතිය හැකි ය. ශ්‍රී ලංකාව ලෝකයේ සම්පූර්ණ කුරුඳු ප්‍රමාණයෙන් 60%, 70% අතර ප්‍රමාණයක් නිපදවමින් 35%, 45% අතර ප්‍රමාණයක් කුරුඳු නිර්යාත වෙළඳ පලට සපයමින් කුරුඳු පිළිබඳ ඒකාධිකාරී තත්ත්වයක වැජඹෙයි. (12) ඇය පසුගිය ශත වර්ෂයේ කර ගෙන ගිය ආකාරයටම නිෂ්පාදනය වැඩි කළ හොත් එයින් ලෝක කුරුඳු මිල බසිනු ඇත. එවිට මීට වඩා විශාල ප්‍රමාණයක ඉඩම්, ශ්‍රමය, පෝර, බලය හා අනිකුත් මූල ද්‍රව්‍යයන් ගෙන් විදේශ විනිමය මේ තරම් හෝ මීට අඩු ප්‍රමාණයක් ඉපයෙනු ඇත. ඒ සමඟ ම ඉතා අවම තත්ත්වයක පවතින කුරුඳු නිෂ්පාදකයින් ගේ විශේෂයෙන් කුරුඳු තලන්නන් ගේ ලාභ තවත් පහත වැටෙනු ඇත. (6 වන කොටස).

සර්ව අසුභවාදීන් දක්වන මතය වන්නේ කුරුඳුවල අනාගතය කෙසේ වත් සාර්ථක නොවන බව යි. ඊට ප්‍රධාන හේතුව ලෙස ඔවුන් තීරණය කරන්නේ වගාවේ ඇති අවදානම යි. කුරුඳු වෙළඳ පොල වර්ධනය වන්නක් ලෙසට සිතීම ද එහි පරිහානිය පිළිබඳ සිතීම ද එකම දෙයක් ලෙස ඔවුහු දක්වති. මන්ද නිෂ්පාදනය වැඩි කිරීම අවිනිශ්චිත බැවිනි. වැඩි නිෂ්පාදනයේ දී වෙනත් අංශ වලට යොමු වී ඇති ඉඩම්, ශ්‍රමය හා පොහොර යනාදී මූල ද්‍රව්‍ය රැසක් කුරුඳු සඳහා යොමු කරන්නට සිදු වේ. එහි ප්‍රතිඵලය ලෙස සැපයුම වර්ධනය වී වෙළඳ මිළ හා ඉල්ලුම පහළ බසින බැවිනි. අනෙක් අතට නිෂ්පාදනය වැඩි නොකර මිළ පමණක් ඉහළ නැංවුව හොත් පමණක් ශ්‍රී ලංකාව වාසි සහගත ඉහළ ආදායමක් ලබනු ඇත. මෙහි දී අනිකුත් තරඟකාරී භාණ්ඩ නිසා වෙළඳ පොල නැති වේය යන අවිනිශ්චිත තාවයක් තිබුණ ද වී ඉතා මඳ වෙයි. මන්ද, කුරුඳු සඳහා යෙදවා ඇත්තේ සුළු ඉඩම් කොටස් බැවිනි.

එහෙත් ශ්‍රී ලංකාවේ කුරුඳු පිළිබඳ ඒකාධිකාරය ජාත්‍යන්තර වෙළඳ පලේ දී රැක ගැනීම අවශ්‍ය නම් රජයට කළ හැකි වැදගත් ප්‍රයත්නයන් දෙකක් ඇත. පළමුවැන්න අන්තවාදී තත්ත්වයකි. එනම්, මිළ ඉහළ දැමීමේ අරමුණින් සිතා මතාම නිෂ්පාදනය සීමා කිරීම යි. එයින් ලැබෙන ප්‍රතිඵල ඵලදායක වුව ද, මේ අවස්ථාවේ දී මෙවැන්නක් සිදු කිරීමෙන් වන්නේ ජීවනෝපාය සඳහා කුරුඳු කර්මාන්තයේ යෙදෙනවුන්ට (අනෙකුත් කර්මාන්තයන් කෙරේ යොමු කරවීමේ දුෂ්කරතාවය නිසා) පිටුවහලක් නොමැතිවීම හා මෙවැනි නීතියක් ක්‍රියාත්මක කිරීමට ඇති ආයතනික හිඟය යනාදී හේතූන් නිසා කාර්යය බැරෑරුම් වීම පමණි. එබැවින් මෙවැනි ප්‍රතිපත්තියක් විචාරක විමර්ශනයන්ට භාජනය කිරීමට පෙර කුරුඳු වෙළඳ පොල අනෙකුත් ආදේශක භාණ්ඩයකට යටත් වේද, එයින් සිදු වන ප්‍රති විපාක කවරේද, වෙළඳ පල සම්පූර්ණයෙන් විනාශ වේද, යන කරුණු සැලකිල්ලට ගත යුතු ය.

දෙවැනි ප්‍රයත්නය වන්නේ රජයේ සහනාධාර ක්‍රමය හැරීම වැනි ක්‍රියාවලින් වගාවේ දියුණුව සඳහා අනුග්‍රහ නොදැක්වීමෙන් සැපයුම සීමා කිරීම යි. මෑතක් වන තුරුම රාජ්‍ය ප්‍රතිපත්තිය වූයේ අළුත් වගාවන්ට අනුග්‍රහ දීම නොව, දැනට කුරුඳු යටතේ ඇති අක්කර 40,000 ක් පමණ වූ බිම් ප්‍රමාණය පුනරුත්ථාපනය කිරීම යි. එසේ වුව ද, පොල් සඳහා කුරුඳු බිම් යොදා ගැනීමෙන් හා නිදහස් වෙළඳ කලාප ව්‍යුහයක් නිසා කුරුඳු සිටවීම සඳහා බිම් ප්‍රමාණයක් අහිමි වන බැවින් අළුත් වගාවන් සඳහා ද සහනාධාර දීමට සිදු වන බව පෙනේ. මෙය මූල සාධකවල ඉතා අවාසිදායක යෙදවුමක් ලෙස පෙනුන ද, එවැනිම තර්කයක් සහනාධාර ලෙස කුරුඳු පතුරු සැපයීම හා බෙදා හැරීමේ කටයුතු ගැන ද යොදා ගැනීමට සිදු වේ. (11 වන කොටස).

## 5. මිළ විචලතාවය.

කුරුඳු වලින් ආදායමක් ලබා ගන්නා බොහෝ දෙනාට ඔවුන් ගේ අවධානය මිළ පිළිබඳ දීර්ඝ කාලීන චක්‍රයට නොව, කෙටි කාලීන මිළ විචලතාවයන් කෙරෙහි යොමු කළයුතු වේ. කුරුඳු නිෂ්පාදනය බොහොමයක් අලෙවි වන්නේ පුද්ගලික කොන්ත්‍රාත් ක්‍රමයට ය. මේවා නැව් ගත

කිරීමට පෙර බොහෝ විට කිහිප දෙනෙකු අතට හුවමාරු වනු දක්නට ලැබේ. කුරුඳු පොතු සකස් කර, ඒවා වියළා, ඉන් පසුව එම පීරි ලියා නැවත වර්ග කිරීමක් සෑම වෙළෙන් දෙකු විසින් ම වාගේ කරනු ලැබේ. එමනිසා සතියක හෝ මාසයක් ඇතුළත සිදු වන විචල තාවන් ගෙන් ඵලදායි මිළ විචලතා සොයා ගැනීම ද අසීරු ය. එසේ ම තොග වෙන්දේසියට ඉදිරිපත් කරන්නේ කුරුඳු ඉතාම සුළු ප්‍රමාණයක් බැවින්, ඒවායින් සමස්ථයක් ලෙස කුරුඳු සාමාන්‍ය මිළ ගණන් සොයා ගැනීමට ද දුෂ්කර ය. 1965 සිට 1972 දක්වා වකවානුවේ වෙළඳුන් මිළ ගණන් මැකහෝලි හා උපවංශ විසින් ඉදිරිපත් කර ඇත. (1.2 වගුය). මේකයේ ද විශාල විචලනයක් දක්නට ලැබේ. බටපොල ප්‍රදේශයේ කුරුඳු පොතු තලන්නන් ගේ ආදායම ජනවාරි සිට 1977 ඔක්තෝබර් දක්වා කාලය තුළ දෙගුණ වූ අතර, ඊට මාස කිහිපයකට පසු එය ඔක්තෝබර් ආදායමින් 1/3 දක්වා පහත වැටුණි. මෙයින් පැහැදිලි වන්නේ වෙළඳ පල පුරා පවතින අවිනිශ්චිත තාවය යි. පෝර යොදන අවස්ථාවේ දී පවා ඊට හය මසකට පසු කුරුඳු තැලීමෙන් ලැබෙන ආදායම පිළිබඳ පැහැදිලි විශ්වාසයක් කුරුඳු තලන්නන් තුළ නැත. එහෙයින් මෙම කුරුඳු වෙළඳ පල ලාභදායිතාවය ගැන ඇති අපේක්ෂා හා ප්‍රයෝගයන් නිපුණ නිෂ්පාදකයෙකුට ඉතා හොඳ තෝතැන්නක් වේ.

මිළ විචලතාවය බොහෝ කරුණු මත ජනිත වුව ද, ප්‍රධාන වශයෙන් ඒවා මූලික හා ද්විතීයන කරුණු ලෙස වෙන් කළ හැකි ය. විචලතාවයට මූලික හේතුව වශයෙන් අඩු දෙන්නේ ඉල්ලුම හා සැපයුම යන අංගයන් ගේ ඇති විචලතාවය යි. ඉල්ලුම විචලතාවය කරුණු දෙකක් නිසා ජනනය වේ. ජාත්‍යන්තර වෙළඳ පලේ ඇති ව්‍යාකූල ස්වභාවයේ හේතුවෙන් ඉල්ලුම් විචලතාවය ඇති වන අතර, නැව් ගත කරන්නන් වෙත ඇති තොග ප්‍රමාණයන් අනිකුත් රටවල් වලින් ලැබෙන කුරුඳු හා කැසියා වලින් ඇති වන ජාත්‍යන්තර ඉල්ලුම ද විචලනය වේ. කැසියා වෙළඳ පොල නිරන්තර භෞතික සැපයුම් වෙනස්කම් වලට ලක් වේ. ඒ ඒ අවස්ථාවන්හි දී සමහර ආයාතිකයින් කුරුඳු දෙසට නැඹුරුවීම ද, කුරුඳු වෙනුවට කැසියා භාවිතය ද කරන බැවින් කුරුඳු ඉල්ලුම ද විෂමාචාර වේ. ඒ අනුව ලංකාවේ වාර්ෂිකව කුරුඳු පොතු හා කුඩු නිර්යාත කරනු ලබන ප්‍රමාණය ද විවිධ වේ. 1967 සිට 1977 දක්වා සිදු වී ඇති වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතයන් වශයෙන් දැක්වුව හොත් එය පිළිවෙලින් පහත සඳහන් පරිදි වේ.

+ 12%   − 5%   + 6%   + 17%   + 24%   + 18%   − 51%   + 54%   − 1%

විචලතාවය නැව් ගත කිරීම් ප්‍රමාණයන් අනුව ද උත්පාදනය වේ. නැව් ගත කරන්නෝ විශාල තොග රැස් කර තැබීම නොකරති. ඔවුන් එක්තරා ඇණවුමකට අවශ්‍ය පරිදි භාණ්ඩ සපයා ගනිති. මේ තොග රැස් කිරීමේ කාර්යයේ කඩිනම් බව මතු වන්නේ නැව් වල තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව යි. නිදසුනක් වශයෙන් එක්තරා ඇණවුමක් සති දෙකකින් පිටත් වන නැවකට ගබඩා කරනු නොලැබුවහොත් එම ඇණවුම බොහෝ ලෙස කල් පමා වීමක් හෝ නැති වීයාමක් හෝ සිදු වේ. එමනිසා එම ඇණවුම රඳවා තබා ගැනීම උදෙසා නැව් ගත කරන්නා හැකිතාක් ඉක්මනින් භාණ්ඩ මිළ දී ගැනීමත්, කුරුඳු වලට ඉහළ මිළක් ගෙවීමක් කරයි.

මෙහි දී කොළඹ සිටින නැව් ගත කරන්නන් ගේ ප්‍රමාණය හය හතකට වැඩි නොවන බැවින් ඔවුන් ගෙන් ඕනෑම කෙනෙකුට වෙළඳ පොල පිළිබඳ කිසියම් බලපෑම් ඇති කළ හැකි ය. මෙහි දී වෙළඳුන්ට නැව් ගත කරන්නා ගේ කඩිනම් බව පිළිබඳව අදහසක් දැන ගැනීමට ලැබුණහොත් ඔවුන් ද තමන් ළඟ ඇති තොග දින කිහිපයක් රඳවා තබා ගැනීමෙන් මිළ තවදුරටත් ඉහළ නැංවීම කරති. එහෙත් මෙවැනිම තත්වයක් මත නැව් ගත කරන්නන් එක් කෙනෙකුට හෝ දෙදෙනෙකුට අණවුම් නොමැති වූවහොත් වෙළඳ පල සීඝ්‍රයෙන් පහත බැසීම හෝ සම්පූර්ණයෙන් විනාශ වීම හෝ සිදු වේ.

සැපයුම් අංශයෙන් බලන කළ විචලතාවය පැන නගින්නේ ඉහත තුන්වන කොටසින් දැක් වූ අන්දමටය. මූලික වශයෙන් කුරුඳු පොතු ගැලවීම පිළිබඳව තීරණය වූ කාල සීමාවන් ඇත. බොහෝ නිෂ්පාදකයින් සුළු ඉඩම් හිමියන් බැවින් ඒ අයට මිළ ඉහළ නගින තුරු එම නිෂ්පාදනය අලෙවියට සුදුසු සේ සකස් කොකර සිටීමේ අවදානමට මුහුණ දිය නොහැක. එබැවින් කුරුඳු පොතු ගැලවීමේ උච්චතම මාස යන්හි මිළ සීඝ්‍ර ලෙස පහත වැටෙයි. මෙහි දී වෙළඳුන්ට මිළ විචලනයන් ගේ සාමාන්‍ය රටාව පිළිබඳ හැඟීමක් ඇති කර ගත හැකි වූව ද, නියම අවස්ථාවේ දී නියම ප්‍රමාණයට වර්ෂාව නොලැබුණ හොත් ඔවුන් ගේ සියළු ම ගණනය කිරීම් නැවතත් විචලනය වේ. ඊට අමතරව ඉහත දැක් වූ පරිදි මිළ මට්ටම් හා කුරුඳු තොග ප්‍රමාණය විචලනයට තවත් බල පෑම් කරනු ඇත. බොහෝ විට අසාමාන්‍ය ඉහළ මිළක් නිසා බොහෝ නිෂ්පාදකයින් උපරිම කුරුඳු ප්‍රමාණයක් ගලවා ගන්නා අටියෙන්, අනවශ්‍ය පරිදි පො තු ගැලවීම කිරීම නිසා නැවත වරක් ඒවා පොතු ගැලවීමට යොදා ගත හැකි කාලයකට එළඹීම විශාල ලෙස ප්‍රමාද වනු ඇත. ඒ හේතුව නිසාම මාස කිහිපයක් ඉක්මෙන තුරු වෙළඳ පොලට එන සැපයුම් සාමාන්‍ය ප්‍රමාණයට වඩා මඳ වනු ඇත. එවිට ඉල්ලුම ස්ථාවරව පවතී නම් මිළ අරිත් ස්ථානයක් වෙත ළඟා වන නමුත් නිෂ්පාදනය වැඩිවත්ම අණවුම් අඩු වූවහොත් ඒ මිළ සීඝ්‍රලෙස පහත බැසීමට ද ඉඩ ඇත.

මිළ විචලතාවයන්ට තුඩු දුන් හේතූන් අතර ඉහත දැක් වූ කරුණු මූලික වෙයි. එම මූලික කරුණු හා බැඳුණු ප්‍රධානතම ද්විතීය සාධක තුනකි. එමගින් දෙකක් ම උක්ත කරුණ හා බැඳුණු ඒවා වේ. වෙළඳුන් හෝ නැව්ගත කරන්නන් සිටියත් මිළෙහි අවිනිශ්චිත බව හා ඇති වන පාඩුත් වලක්වා ගැනීම සඳහා විශාල තොග රැස් කිරීම ඉන් පළමුවැන්න යි. දෙවැන්න වෙළඳුන් සිය අපේක්ෂනය පරිදි වෙළඳ පොල නිර්මානය කර ගැනීම යි.

මෙහි දී කුරුඳු වෙළඳ පොල ඉතාම කුඩා වෙළඳ පොලක් බැවින්, එක් වෙළෙන්දෙකු ගේ හෝ දෙතුන් දෙනෙකුගේ වෙළඳ උපක්‍රම නිසා හෝ අනිකුත් වෙළඳුන් නොමග යැවීමේ ක්‍රම වලින් හෝ බොහෝ දෙනෙකු වෙළඳ පලින් ඉවත් කර කීප දෙනෙකු පාලනය ගෙන යනු ඇත. අපේ ස්ව දේශීය වාතාවරණයට ඉතා කිට්ටු සබඳතාවයන් ඇති තුන්වන කරුණට අනුව මිළ දී ගැනීමට හෝ අලෙවි කිරීමට (වගාවේ අස්වැන්න ලබා ගැනීමට පෙර හෝ ඒ බව) කරන ලද ගිවිසුම් නිරන්තර යෙන් ම වාසිදායක පක්ෂය විසින් පැහැර හරිනු ලැබේ. එක්තරා මුදලකට එක්තරා කුරුඳු පොතු ප්‍රමාණයක් මාස දෙකකට පෙර නැව් ගත කරන්නකුට ගෙනැවිත් අලෙවි කිරීමට ගිවිස ගත් නිෂ්පාදක යෙක් වෙනත් නැව්ගත කරන්නකු ඉහළ මිළක් ගෙවන්නේ නම් ඊට එකඟ වී පළමුවැනි ගිවිසුම අමතක



22898

කර දමනු ඇත. මෙලෙස නිර්යාත කොන්ත්‍රාත් කරුවන් හා නැව්ගත කරන්නන් අතර බැඳුණු ගිවිසුම් වලින් සෑහෙන ප්‍රමාණයක් ඉෂ්ට නොවීම මත වෙළඳ පොළ විනාශ වී යනු ඇත. මෙවැනි හේතූන් නිසා අනාගත වෙළඳ පොළ පිළිබඳ අවධානම් පිළිබඳ සැකය තුරන් කිරීම අපහසු වේ.

ශිල්පීය කරුණු අනුව සලකන කළ කුරුඳු නිෂ්පාදනයේ දී පුද්ගලික වෙළඳාම රාජ්‍ය අංශයන්ට වෙළඳාමට වඩා වාසිදායක වනු ඇත. (13 වන කොටස). එසේ වුව ද, එයින් ලැබෙන ප්‍රතිඵල උපරිමයෙන් අඩු වේ. නිෂ්පාදකයින් හා වෙළෙන්දන් ගේ පුද්ගලික අවශ්‍යතාව මත කරන ලද පුද්ගලික ප්‍රයත්නයන් නිසා විශාල මිළ විචලතාවයන්ට ගොදුරු වීමෙන් සමස්ථ කර්මාන්තයම විනාශ වන අයුරු පහත දැක්වේ. (6 වන කොටස). මිළ විචලතාවය පිළිබඳ මූලික කරුණු ව්‍යුහාත්මක වේ. කර්මාන්තයේ කුඩා බව, විශාල වෙළෙන්දන් කිහිප දෙනෙකු ගේ හෝ තනි වෙළෙන්දෙකුට ජාත්‍යන්තර හා දේශීය වෙළඳ පොළ දෙක කෙරෙහිම බලපෑම් ඇති කළ හැකි වීම, නැව්ගත කිරීමේ දී ඇති වන සියලුම බාධක, ශිල්පීය හා ආර්ථික දුර්වලතා නිසා නිෂ්පාදනයෙන් ලැබෙන සැපයුම් අසමානය වීම, ආදී හේතූන් මත මෙම විචලතාවය ඇති වේ. ජාත්‍යන්තර වෙළඳ පල සමතුලිතව පැවතුන ද, දේශීය සාධකයන් මත තවදුරටත් විචලතා ඇති වනු ඇත. මේ අනුව සලකන විට පෞද්ගලික වෙළඳාමේ වාසිදායක බව දැක්වීමට නම් කුරුඳු කර්මාන්තය දුර්වල නිදසුනක් වනු ඇත.

## 6. වගා කිරීමේ තත්වයන්.

පීට ඉහත කොටසේ දී දැක් වූ පරිදි මිළ විචලතාව කුරුඳු කර්මාන්තයේ ව්‍යුහයේ ස්වභාවය නිසා ම ඇති වන්නක් මෙන් ම, අවම නිෂ්පාදනයට ද එම හේතුවම තුඩු දෙන බව කිව හැකි ය. වගා වන් පාලනය කිරීමේ තත්වයන් සාමාන්‍යයෙන් දුර්වල ය. එසේ ම ඒවා ඉතාම හොඳ පාලන තත්වය යටතේ පවා ඉතා පහත් අස්වැන්නක් ලැබෙන තත්වයක පවතින වගාවන් වේ. මෙයට ඉතාම හොඳ සාක්ෂිය වන්නේ කුරුඳු නිෂ්පාදනය කරන ප්‍රදේශ හරහා ගමන් කරන්නෙකුට හමු වන දර්ශන පථයයි. මෙහි ඉඩම් වලින් වැඩි කොටසක් සෝදා පාළුවට ලක් වී ඇති අතර, තවත් කොටසක් නිසියාකාර තණ කොළ ඉවත් කිරීමක් හෝ ක්‍රමවත් පැල සිටුවීමක් හෝ කර නැත. පැළෑටි මිය යෑමේ හේතුවෙන් හා වෙනත් නොයෙක් හේතූ නිසා නිසරුව තැන තැන විසිරී වැඩී තිබෙන කුරුඳු වගාවන්හි සමහර තැනක කුරුඳු පෝර එක් රොක් වී ඇත. සංඛ්‍යා දත්තයන් මෙහි අනිත් කොටස හෙළි කරයි. බොහෝ නිෂ්පාදකයින් පෝර භාවිතා කිරීමේ අවශ්‍යතාවය ඉතා හොඳින් දන්නා නමුදු ක්‍රියාත්මක අංශයේ දී එය ඉටු කිරීමට පැකිලෙති. 1971 දී කරන ලද ජාතික සමීක්ෂණයේදී හෙළි වූ කරුණු අනුව පෝර යෙදීම කර ඇත්තේ සමස්ථ කුරුඳු වගා බිම් ප්‍රමාණයෙන් 11% කට පමණක් බව පැහැදිලි විය. එහෙත් මෙම සමීක්ෂණය කරන ලද්දේ කුරුඳු පොතුවල මිළ ඉතා පහත් මට්ටමක පවතිද්දී ය. පෝර යෙදීමේ පරිමාණය විශාල ඉඩම්වල 11% ට වඩා වැඩි විය. බටපොල සමීක්ෂණයට අයත් වූයේ කුඩා ඉඩම් හිමියන් පමණක් වුව ද, එහි පෝර භාවිතා කෙරුණු පරිමාණය 27% ක් පමණ වේ. මෙය 1971 දී කරන ලද සමස්ථ ජාතික

සමීක්ෂණයේ සංඛ්‍යා ලේඛන වලට වඩා වැඩි වීමේ හේතුව පොර යෙදීම කෙරේ නිෂ්පාදකයා වැඩියෙන් පෙළඹීම බව සිතිය හැකි ය. ඒ හැරුණු විට කුරුඳු, පොර යෙදීම සම්බන්ධ සංඛ්‍යා ලේඛන දත්තයන් බොහෝ විට පොල් හෝ වෙනත් ද්‍රව්‍ය සඳහා භාවිතා කරන පොර දත්තයන් හා බැඳී පවතී. මන්ද, බොහෝ වැවිලි කරුවන් කුරුඳු සඳහා පොල් හෝ වෙනත් ද්‍රව්‍ය සඳහා භාවිතා කරන පොර වර්ග යොදවන බැවිනි. කෙසේ වුව ද, සමස්ථ වශයෙන් ම පවතින අස්වැන්නේ පහත් මට්ටම අනුව බලන කල්හි අවුරුද්දකට එක් අක්කරයකින් කුරුඳු පොතු රාත්තල් 400 ක් අස්වැන්නක් ලැබීම සාමාන්‍යයෙන් සාර්ථක අස්වැන්නක් ලෙස සැළකිය හැකි ය. මෙම සංඛ්‍යාව 1973–1977 දක්වා කාලය තුළ කුරුඳු පොතු හා කැබලි වල සාමාන්‍ය අස්වැන්නයි. එහෙත් ජාතික මට්ටමේ සාමාන්‍ය අස්වනු ප්‍රමාණය 1971 දී අක්කරයකට රාත්තල් 300 ක් විය. විශාල වතු 50 කින් කෙරුණු සමීක්ෂණයේ දී සාමාන්‍ය අස්වැන්න අක්කරයකට රාත්තල් 410 ක් පමණ විය. මෙහි දී එක් වත්තකින් රාත්තල් 11,000 කට වැඩි ප්‍රමාණයක් ලැබිනි. (13). එම වසරේ ම ජාතික සමීක්ෂණ සංඛ්‍යාන අනුව සාමාන්‍ය අස්වනු ප්‍රමාණය අක්කරයකට රාත්තල් 242 ක් විය (14). මෙහි දී තොරතුරු හා දත්තයන් නියම ප්‍රමාණයට වඩා අඩුවෙන් දක්වා ඇතැයි අනුමාන කළ හැකි ය. එහෙත් සම්පූර්ණ අක්කර ප්‍රමාණය පිළිබඳ දත්තයන් ද මෙහි දී අඩු ඇස්තමේන්තු මත පදනම් වූ ඒවා නො වේ නම්, මෙම සංඛ්‍යා ලේඛන දත්තයන් නිර්යාත දත්තයන් සමඟ සැසඳීම ඉතා අසීරු කරුණක් වේ. කෙසේ වුව ද, මෙම සමීක්ෂණයේ වැදගත් ම තීරණය, විශාල ඉඩම්වල සාමාන්‍ය අස්වනු ප්‍රමාණය ඉහල මට්ටමක පවතින බව යි. මෙය විස්තර කිරීමට ලිඛිතව, වාචිකව හෝ දෘෂ්ටියට අනුව සෑහෙන සාක්ෂි ලබා ගත හැකි ය. නිදසුනක් ලෙස 1976/77 වර්ෂයේ දී ජාතික මට්ටමේ සාමාන්‍ය අස්වනු ප්‍රමාණය අක්කරයකට රාත්තල් 400 ක් වුව ද, (ඉහළ කොටස) බටපොල පුරා ඉඩම් හිමියන් නිෂ්පාදනය කළේ තනි කර කුරුඳු පමණක් සිටුවා ඇති බිම් අක්කරයකින් රාත්තල් 215 ක් පමණ ද, අනෙකුත් භෝග හා මිශ්‍රව වගා කර තිබූ ඉඩම් වල අක්කරයකට රාත්තල් 180 ක් ද පමණ ය.

විශේෂයෙන් කුඩා ඉඩම් අංශයේ වගාවන්හි තත්වය හා අස්වැන්නේ පහළ මට්ටමට හේතු කිහිපයක් සඳහන් කළ හැකි ය. අවධානයේ පහසුව තකා මෙම කරුණු වෙළඳ පොල හේතු හා ව්‍යුහාත්මක හේතු ලෙස වර්ග කළ හැකි ය. වෙළඳ පොල හේතු ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. ඉන් පළමුවැන්න දිගු කාලීන මිළ අඩු වීම ය (4 වන කොටස). මේ හේතුවෙන් නිෂ්පාදකයෝ කුරුඳු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට මැලි වෙති. දෙවැන්න, මිළ විචලනය පිළිබඳ ගැටළුව යි. (5 වන කොටස). මේ නිසා නිෂ්පාදකයන් හා තලන්නන් මීට වඩා වාසිදායක වෙනත් කාර්යයන් තිබේ නම්, ඒවා කෙරේ පෙළඹවීම් ඇති කිරීම ද, නොවැළැක්විය හැකි ය. පොර, වාරි ක්‍රමය හා පස සංරක්ෂණය ආදිය සඳහා සිය මූලධනය යොදවන මේ නිෂ්පාදකයින් විශාල අවධානමකට මුහුණ දෙන බව පැහැදිලි ය. කුරුඳු මිළ පහත වැටුණු අවස්ථාවන්හි කුරුඳු පොතු ගැලවීමේ පමණක් විශේෂ නිපුණතා ඇති කුරුඳු තලන්නකු ගේ ආදායම හා රැකියා අවස්ථා සීඝ්‍ර ලෙස පහළ යාමක් දක්නට ලැබේ. එය කෙලින් ම තම ජීවන තත්වය කෙරේ බලපාන බැවින් විශේෂයෙන් දිළිඳු ජනයා මෙවැනි අවධානම් කාර්යයන්හි යෙදීමට ධනවතුන්ට වඩා විශාල පිළිකුලක් දක්වති. ව්‍යුහාත්මක කරුණු අනුව සළකන විට සාමාන්‍ය අස්වැන්න හා පාලන තත්වයන් හි පහත් මට්ටමට හේතු කිහිපයකි.

1. කුරුඳු සාමාන්‍යයෙන් සුළු භෝගයකි. 1969 සංඛ්‍යාන තත්ත්‍වයන්ට අනුව කුරුඳු ඉඩම් වලින් 97% ක් ම අක්කර තුනට වඩා කුඩා ඒවා වන අතර, ඒ භූමි ප්‍රමාණය සම්පූර්ණයෙන් කුරුඳු යටතේ තිබෙන බිම් ප්‍රමාණයෙන් 62% ක් පමණ වේ.

අක්කර 10 ට වැඩි ඉඩම් ඇත්තේ 18% ක් පමණ ඉතා අඩු ප්‍රමාණයකි (15). 1970 ඉඩම් ප්‍රතිසංස්කරණයට පසු ඉතිරි වී තිබූ විශාල වතු පවා විනාශ වී ගියේ ය. අනිකුත් බෝග වගාවේ දී මෙන් ම කුරුඳු වගාවේ දී ද ඉතා හොඳ අස්වනු ප්‍රමාණයක් ලබා ගනු සඳහා අවශ්‍ය ආයෝජනයන් යෙදීම සමස්ථයක් වශයෙන් කුරුඳු වවන්නන් ගේ දිළිඳු භාවය නිසා කිරීම අසීරු ය. මොවුන් ගේ ජීවනෝපාය 'අතින් කටට' යන්නට පමණක් සීමා වූ ආදායම් මාර්ග බැවින් තමා ගේ කොටස්වලට ඇල වේලි සකස් කිරීම, පැරණි හා රෝගී පඳුරු වෙනුවට අළුත් පැල සිටුවීම වැනි කාර්යයන්හි යෙදෙනවාට වඩා වැටුප් ලැබෙන රැකියාවක යෙදීමෙන් ශ්‍රමය ඵලදායී ලෙස නිරත කළ හැකි වේ. රසායනික පොර ද්‍රව්‍ය යෙදීමේ වාසි පිළිබඳව නිෂ්පාදකයා දන්නා නමුදු දුප්පත්කම කුඩා ඉඩම් හිමියන් එම ද්‍රව්‍යයන් වගාවන්ට යෙදීමෙන් වළක්වයි (16).

කුරුඳු වගාවෙන් නිසි ප්‍රයෝජන ලැබිය හැක්කේ නිතිපතා නියායාකාර පොර යෙදීමක් කරන්නේ නම් පමණි. ඒ නිසා සාමාන්‍ය දිළිඳු කුරුඳු නිෂ්පාදකයෙකුට එක් වර්ෂයක දී පොර යෙදීමේ හැකියාව තිබුන ද, එය පිළිවෙළට නොකඩවා සිදු කිරීම අසීරු වීමේ බාධකය නිසා ඒ අවස්ථාව ද බැහැර කරන අවස්ථා එමට ය. ඒ හැරුණු විට වගාව කුඩාවන්නම පොර ලබා ගැනීමට කළයුතු වියදම ද ඊට අනුකූලව ඉහළ යයි. කුරුඳු පොර ගම්වල වෙළඳ සැල් වලින් ලබා ගත නොහැකි බැවින් එය ලබා ගැනීම සඳහා නගරයට යා යුතු වෙයි. විශාල වතු හිමියෝ ඔවුන් ගේ ම හෝ කුලියට ගත් හෝ වාහනයක් මගින් ඒවා වගාවන් වෙත ගෙන්වා ගනිති. මෙහි දී පොර භාණ්ඩරයක් දෙකක් ගත්ත ද, එසේ නැතහොත් ටොන් හත අටක් ගත්ත ද, එකම ආකාරයකට ගාස්තු ආදියට අමතරව කාලය හා ශ්‍රමය ද වැයි වෙයි. පොර ඉතා සුළු ප්‍රමාණයක් අවශ්‍ය කුඩා නිෂ්පාදකයාට මෙය අනවශ්‍ය විශාල කරදරයක් වෙයි. මෙය බොහෝ සුළු කුරුඳු ගොවීන්, පොර යෙදීම කෙරේ උදාසීන කරවන අතර, විශාල නිෂ්පාදකයාට වාසිදායක තත්ත්වයක් ඇති කරයි.

2. කුරුඳු වගා කරන්නන් සුළු ප්‍රමාණයක් කොළඹ හෝ වෙනත් නගරවල වාසය කරති. ඒ ගොවිතැනේ දී නම් ඉඩම් හිමියන් ඉඩම්වල වාසය නොකරන අවස්ථාවල දී ඒවා අඳයට හෝ බද්දට වගා කිරීමට දෙති. අනෙකුත් වගාවන්හි දී වගාවේ ප්‍රමාණය අනුව එක්තරා ශ්‍රමික ප්‍රමාණයක් යොදවා ඒ ඒ කාර්යයන් කරවති. එහෙත් කුරුඳු වල දී කෙරෙන්නේ එක්තරා කැනෑත්තෙක් කුරුඳු ඉඩම ආරක්ෂා කිරීමට පත් කොට ඔහුට ඒ සඳහා සුළු මුදලක් ගෙවීම යි. ඉඩම් හිමියා කුරුඳු පොතු ගැලවීම කිරීමට හෝ තණ කොළ ඉවත් කිරීමට වරක් දෙකක් වගාවන් වෙත යයි. මෙසේ අඩු වෙහෙසක් දරමින්, සෑහෙන අඛණ්ඩ ආදායමක් ලැබීමට කැමති අයෙකුට කුරුඳු ඉතා හොඳ වගාවක් වේ. මෙහි දී මෙම ඉඩම් හිමියෝ කුරුඳු වගාව වැඩි දියුණු කර විශාල ලාභ ලැබීමට එතරම් උනන්දුවක් නොගනිති.

ඡේඛ හෝ නම්, වගාවේ විශාල වැඩ කොටසක් කළයුතු වීමත්, ඒ අනුව වැඩි වාර ගණනක් නගරවල සිට වගාවන් ඇති ගම්වලට පැමිණීමට සිදු වීමත් නිසා ය. අනෙක් හේතුවක් ලෙස නගරයක සිටින අයිතිකරු හා බැඳීමක් නොමැති බැවින් ඔහු ගේ හොඳ හිත පිළිබඳ ගම්වාසීන් එතරම් තැකීමක් නොකරන නිසා හොඳට වැඩුනු වගාවන් වේ නම්, අයිතිකරු පැමිණීමට පෙර ඒවා කපා සකස් කර ගැනීමට ගම්වාසීන් පෙළඹෙති. මෙසේ වගාව හොඳ වන්ම එය සොරකම් සඳහා පෙළඹවීමේ හැකියාව වැඩි කරවන්නක් වේ. 1971 සමීක්ෂණ යට අනුව ඉඩමින් පිට සිටින අයිතිකරුවන් වූයේ 4% ක් පමණි. ඔවුන් විශාල වතු හිමියන් වූහ (17). එසේ වුව ද, ඉඩමේ පදිංචි නොවූ අයිති කරුවන් ගේ ප්‍රමාණය මීට වඩා අධික විය හැකි යයි කතෘවරයා විශ්වාස කරයි.

3. ඉහත දැක් වූ ඉඩමේ පදිංචි නොවූ අයිතිකරුවා කුරුඳු කර්මාන්තයේ තවත් ප්‍රශ්නයක් හෙළි කරයි. එනම්, කුරුඳු කර්මාන්තයේ අර්ධකාලීන ස්වභාව යයි. කුරුඳු වගාවේ පූර්ණකාලී නව නියුතු එයින් ම ජීවනෝපාය සළසා ගන්නා වැවිලි කරුවන් ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. බොහෝ විශාල පරිමාණයේ වැවිලි කරුවෝ වෙනත් ආදායම් මාර්ග ලබන්නෝ වෙති. කුඩා පරිමාණයේ වැවිලි කරුවෝ අනෙකුත් කාර්යයන් ගෙන් නිදහස් අවස්ථාවල කරන අර්ධ කාලීන රැකියාවක් ලෙස මෙහි නියැලෙති (3 වන කොටස). තම ජීවනෝපාය සළසා ගැනී මට තරම් කුරුඳු ප්‍රමාණයක් හිමි සුළු පරිමාණයේ වැවිලි කරුවෙකුට වුව ද, කුරුඳු පොතු ගැලවීමේ කාර්යයේ දී, වෙනත් එලදායි කර්මාන්ත කෙරේ යෙදවිය හැකි පවුලේ ශ්‍රමය මේ සඳහා යොදා ගත යුතු වෙයි. එබැවින් ලාභ විශාල ලෙස විචල්‍යය වන මෙවැනි කර්මාන්තයකට එම ශ්‍රමය බැඳ තබා ගැනීමට බොහෝ වැවිලි කරුවෝ නොපෙළඹෙති.

අර්ධ කාලීන වැවිලි කරුවා දුර්වල ගොවීන් ලෙස හංවඩු ගැසිය නොහැකි ය. නමුත් එක කට වඩා කාර්යයන් රැසක් කරන පවුලක ඉතා හොඳ ආදායම් මාර්ග නැතහොත් ඉතා ප්‍රිය ආදායම් මාර්ග (රැසක් ඇත්නම් එකක් හෝ දෙකක්) හැර අනිත්වා අතපසු වීමක් සිදු වෙයි. විශාල මිළ විචලතාවයන්ට ගොදුරු වන කුරුඳු නිතරම එවන් අතපසු වීම් වලට ලක් වන වැවිල්ලකි විය හැකි ය. මෙසේ කුරුඳුවලට යටත්ව ඇති බිම් ප්‍රමාණයෙන් වැඩි කොටසක් සිය අභිමතාර්ථය, ශක්තිය හා ධන ආයෝජන ආදිය වෙනත් අංශයන් කෙරේ රැඳ වුනු සුළු පිරිසක් මත එක් රොක් වී ඇත.

4. කුරුඳු පොතු ගැලවීමේ කොන්ත්‍රාත්තුව ද කුරුඳු වගාව දියුණු කිරීමේ අදහසක් ඇති වැවිලි කරුවෙකුට වඩා හොඳ දිරි ගැන්වීමක් නො වේ. පොතු ගලවන්නන් ද ඒ සඳහා කුරුඳු කොටසක් ලබා ගන්නා බැවින් කුරුඳු නිෂ්පාදකයා විසින් වගාව සඳහා අමතරව එක් කරන ලද ආයෝජනයක් ද අවාසිදායක ලෙස බෙදී යයි. අඳයට කුඹුරු වැඩ කරන ගොවීන්ට සේම හවුල් වගාවන් කරන කුරුඳු වගා කරන්නන්ට ද අවාසි ඇත. එහෙත් මෙය මෙහි දැක්වෙන තරම් අවාසිදායක තත්වයක් ලෙස සැලකිය යුතු නැත. මන්ද කුරුඳු නිෂ්පාදකයා හා තලන්නා අතර අස්වැන්න පිළිබඳව ගිවිසුමක් ඇති කර ගත හැකි ය. ඉතා හොඳ වර්ග යේ කුරුඳු හිමි නිෂ්පාදකයෙකුට තලන්නාට දෙන කුරුඳුවල ප්‍රමාණය අඩු කළ හැකි ය.

හැකි ය. ඉතා හොඳ වර්ගයේ කුරුඳු හිමි නිෂ්පාදකයෙකුට තලන්නාට දෙන කුරුඳුවල ප්‍රමාණය අඩු කළ හැකි ය. වර්ගය උසස් බැවිනි ඒ. එහෙත් ක්‍රියාත්මක වීමේ දී කුරුඳු තලන්නන්ට ගෙවීම ලෙස දිය යුතු නියමිත කුරුඳු ප්‍රමාණයේ වෙනසක් වර්ගය අනුව ඇති නොවන්නා සේම, වගා කරන්නා ගේ ශ්‍රමයෙන් කුරුඳු තලන්නන් අනිසි ලාභ ලබති, යන හැඟීම ද තුරන් කිරීම දුෂ්කර වේ. එහි දී කුරුඳු තලන්නන් වගා කරන්නන් සමඟ බොහෝ දුරට සාකච්ඡා කිරීමෙන් තමන් ගේ ශ්‍රමය සඳහා දිය යුතු කොටස පහළ බසිතැයි යන බිය නිසා සාකච්ඡා කිරීමෙන් ද වලකින බව පෙනේ.

## 7. කුරුඳු නිෂ්පාදනයෙන් ලැබෙන වාසි.

සාමාන්‍ය ලෙස කුරුඳු වගාවේ දී සම්පත්වල සාමාන්‍ය ඵලදායිතාවය අවම වන අතර, (18) එම නිෂ්පාදනයේ යෙදී සිටින්නවුන්ට ලැබෙන ලාභයන් ද අවම වේ. එසේම කුරුඳු නිෂ්පාදනයෙන් ලැබෙන ලාභ ද ජන දෙකොට්ඨාශයක් – ඉඩම් හිමියෝ හා කුලී කාර තලන්නෝ – අතර අසමානව බෙදී යාමක් ද දක්නට ලැබේ. එහෙත් මෙම වගාවන් සඳහා භාවිතා කර ඇති ඉඩම් වල වගා කළ හැකි ආදේශක භෝග සීමිත නැතහොත් ශූන්‍ය නිසාත්, ඵලදායිතාවයේ අවම බවත් නිසා ඉඩම් හිමියෝ අසීමිත ලාභ ලබන බව පෙනේ. මේ තත්වය බටපොල සමීක්ෂණයේ කරුණු මත වඩාත් පැහැදිලි කළ හැකි ය.

පෝර භාවිතයක් නොවුනු අනෙක් භෝග වර්ග සමඟ සමයේ වැඩුනු නිසරු නිෂ්පාදනයක් ඇති කුරුඳු වගාවක් තෝරා ගත හොත්, එයින් කුරුඳු ඉඩම් අයිතිකරුට අක්කරයකට රු.460.00 ක ශුද්ධ ලාභයක් කුරුඳු පොතු වලින් පමණක් ලැබේ. ඊට අමතරව කොළ තෙල් පෙරීමට ද, කුරුඳු කෝටු දර සඳහා ද යොදා ගැනීමෙන් තවත් රු.100.00 ක් ලබා ගත හැකි ය. මේ ගණනය කිරීමේ දී පහත සඳහන් උපකල්පනයන් උපයෝගී කර ගන්නා ලදී. 1976 සැප්තැම්බර් සිට 1977 සැප්තැම්බර් දක්වා අක්කරයකින් සාමාන්‍යයෙන් කුරුඳු රාත්තල් 164 ක් ලැබුණු අතර එම රාත්තල් සාමාන්‍යයෙන් රු.5.50 කට අලෙවි කෙරුණි. කුරුඳු වගාවේ දී හා නිෂ්පාදනයේ දී සියළු ම ශ්‍රම භාවිතය මිළට ගත් ලෙසට උපකල්පනය කරන ලදී.

මෙසේ අවම යෙදවුම් හා ධෛර්යයන් මත ඉඩම් හිමියා ගේ අංශයෙන් වර්ෂයකට රු.600.00 ක ලාභයක් ලබා ගත හැකි ය. පෝර යෙදූ වගාවන්හි දැනට කුරුඳු පොතුවලට ඇති ඉහළ මිළ ගණන්වලට අනුව මීට වඩා ලාභ අපේක්ෂා කළ හැකි ය. බටපොල සමීක්ෂණයට අනුව ලබා ගත් ඉහත දැක් වූ උපකල්පනයන් මතම, පෝර යෙදූ වගාවන්හි දැනට පවතින රාත්තල රු.9.00 මිළ ගණන් අනුව ඉඩම් හිමියාට කුරුඳු පොතු විකිණීමෙන් පමණක් අක්කරයකට රු.960.00 ක ලාභයක් ද, තෙල් සඳහා කොළ අලෙවියෙන් තවත් රු.160.00 ක ආදායමක් ද, ලබා ගත හැකි ය. මේ ඉපැයුම් මෙම ප්‍රදේශයේ ම වී වගාවෙන් ලබා ගත හැකි ආදායම්වලට වඩා බොහෝ ඉහළ ය. ඉඩම් හිමියෙකුට කුරුඳු ඉතාම වාසිදායක වැවිල්ලකි. මන්ද, එයට අවශ්‍ය සුළු සත්තුවක් හා යෙදවුමක් පමණක් වන හෙයින් සම්පූර්ණ වගා පාඩුව පිළිබඳ අවිනිශ්චිත බාධාවක්

3 වන වගුව.  කුඩා පරිමාණයේ වගාවන්හි කුරුඳු තලන්නවුන් ගේ පැයක ආදායම.

| | කුරුඳු තනි වගාවක් ලෙස | කුරුඳු මිශ්‍ර වගාවක් ලෙස |
|---|---|---|
| අක්කර ප්‍රමාණය | 15.00 | 18.88 |
| කුරුඳු පොතුවල සාමාන්‍ය-අක්කර ප්‍රමාණය (පැයකට ගැල වූ පොතු රාත්තල් වලින්) | 00.32 | 00.35 |

| අස්වැන්නත් කුරුඳු තලන්නන් ගේ ප්‍රමාණය පිළිබඳ ප්‍රගණනය | කුරුඳු පොතු සඳහා වෙළඳපල පිළිබඳ ප්‍රගණනය | කුරුඳු තලන්නන් ගේ දෛනික ආදායම | |
|---|---|---|---|
| 50% | රාත්තලකට රු.5.00 | 00.73 | 00.80 |
| 50% | රාත්තලකට රු.9.00 | 01.31 | 01.45 |
| 35% | රාත්තලකට රු.5.00 | 00.51 | 00.56 |
| 35% | රාත්තලකට රු.9.00 | 00.92 | 01.02 |

මූලාශ්‍ර : කුලී ශ්‍රමිකයන් විසින් ඉටු කරනු ලැබූ පොතු ගැලවීමේ කාර්යය පිළිබඳ මේ තොරතුරු සියල්ල බටපොල සමීක්ෂණයෙන් ලබා ගැනිනි.

නොමැති වීමත් බැවිනි.

එහෙත් අභාග්‍යයකට මෙන් කුරුඳු නිෂ්පාදනයේ වැදගත් මෙහෙයක් ඉටු කරන කුරුඳු තලන්නන් කුරුඳු නිෂ්පාදනයේ ඉඩම් හිමියන්ට වඩා අඩු ලාභ ලබති. මෙහි දී නියම ආදායම ගණනය කිරීම ඉතා අසීරු කරවන විචල්‍යතා දෙකක් වෙයි. කුරුඳු තලන්නාට කුරුඳු තොගයෙන් තම කාර්යය සඳහා ලැ බෙන කොටසත්, එම කොටස විකුණා ගැනීමේ දී මිලේ විචල්‍යතාවයත් ලෙස ඒවා දැක්විය හැකි ය. කීප දෙනෙකු හැර සියලු ම කුරුඳු තලන්නන්ට ගෙවීම් කරනු ලබන්නේ වගාවෙන් කොටසක් යන නීතිය මත ය. අම්බලන්ගොඩින් පිටත ප්‍රදේශයේ එය නිෂ්පාදනයෙන් 50% ක් හෝ ඊට සමාන මුදලක් වේ. එහෙත් අම්බලන්ගොඩ ප්‍රදේශය තුළ ඊට වඩා අඩු වැටුපක් ලැබෙයි. මේ වෙනසට හේතුව බොහෝ කුරුඳු තලන්නන් අම්බලන්ගොඩ ප්‍රදේශයේ වීමත්, එම ප්‍රදේශයේ ම සිය කාර්යය ඉටු කරද්දී කෑමට බීමට යන වියදම් අඩු නිසා වැඩි ඉල්ලීමක් කිරීමට ඉඩකඩ නොමැති වීමත් නිසා ය (19). 1977 අම්බලන්ගොඩින් පිටත ප්‍රදේශයේ කුරුඳු තැලීම වැඩිපුරම තැනින් තැන යන තලන්නන් කණ්ඩායම් විසින් ඉටු කරන බැවින් ඔවුන් ඒ සඳහා වැටුප් තලයක් තීරණය කර ගනිති. තුන්වන වක්‍රයේ පැයක ආදායම දක්වා ඇත. බටපොල සමීක්ෂණයට අනුව සාමාන්‍ය කුරුඳු තලන්නෙකුට අස්වැන්නෙන් 35% ක් ලැබුණු අතර, 1977 මිල ගණන් ඉහළ යාමට පෙර රාත්තලක මිළ රු.5.00 ක් පමණ විය. මේ තත්වයන් යටතේ පුහුණු වෘත්තිය කුරුඳු තලන්නෙක් පැයකට සාමාන්‍ය වශයෙන් ශත -/50 සිට ශත -/60 අතර ගණනක් උපයයි. මෙය පැය 08 ක වැඩ දිනයක දී රු.4.00 සිට රු.4.80 දක්වා වේ.

එසේ වුව ද, සමහර කුරුඳු තලන්නන් සෑහෙන වේතනයක් ලබා ගැනීමේ අටියෙන් එක දිගට පැය 16 ක් පමණ තම කාර්යයේ නිරත වෙති. දැනට ඇති ඉහළ මිළ තත්වය යටතේ පවා ඔවුන් ගේ වේතනය පැයකට රු.1.00 කට වඩා වැඩි නොවේ. අනෙකුත් කුලී ශ්‍රමය හා මෙය සැසඳිය නොහැක්කේ මොවුන් වයස් සීමාවල කිහිපයක සිටිනා, විවිධ ශ්‍රේණියේ පුහුණු තත්වයන් ඇති මිශ්‍ර කණ්ඩායමක් වීම යි. කුලී ශ්‍රමික කුරුඳු තලන්නන් අතර මනා නිපුණත්වයකින් යුතු වැඩිහිටියෝ ද, වඩා අසීරු නොවූ තැලීමේ කටයුතු කරන බාලයෝ ද වෙති. මේවාට ද අතිරේකයන් අත හැර දමා ගණනය කළ ද අනෙකුත් කුලී ශ්‍රමිකයන්ට වඩා ඔවුන් අඩු වේතන ලබති. බටපොල පිරිමි කම්කරුවෝ ලී ඉරීම හා කුඹුරු අස්වැද්දීමේ කාර්යයන්හි නිරත වෙති. කුඹුරු වල වැඩ කිරීමේ දී දිනකට පැය 08 ක දී රු.8.00 ක වේතනයක් ද, ඊට අමතරව තවත් රු.3.00 සිට රු.4.00 ක් වටිනා දිවා ආහාරය හා අතුරුපස ද ලැබේ. ලී ඉරීමේ දී මීට වඩා මඳක් වැඩි ආදායමක් ලැබේ.

මෙහි දී බටපොල ග්‍රාමය සුළු වැවිලි කරුවන් ගේ තත්වය අසමාන්‍ය ලෙස දක්වන්නකැයි සිතිය නොහැකි ය. එක් කුරුඳු තලන්නකු ගේ දෛනික නිෂ්පාදනය අන් තැනක සඳහන් කර ඇති සංඛ්‍යාවන්ට වඩා අඩු වේ (20). මීට හේතුව විශාල වතුවල අමු ද්‍රව්‍ය ඉතා හොඳ වීමත්, බටපොල ග්‍රාමයේ වැඩිදෙනා මනා පුහුණුවකින් යුත් පූර්ණකාලීන කම්කරුවන් වීමත් ය. කෙසේ වුව ද, කුරුඳු තලන්නන් ගේ සේවයට ලැබෙන්නේ මඳ උපහාරයකි. මෙයින් ඉඩම් හා රැකියා

උණතාවය පැහැදිලිව පිළිබිඹු වේ. කුරුඳු තැලීම, රැකියා විරහිත එහෙත් ටික කාලයක් එම ශිල්පය හැදෑරීමට කාලය වැය කළ හැකි ඕනෑම අයෙකුට විවෘතව ඇත. එම නිසා රැකියා විරහිත බොහෝ දෙනා අර්ධ කාලීනව හෝ මේ කාර්යයට ඇතුළු වී ඇත. පසුගිය සිය වස් වල දී මෙය බටපොල සිදු වී ඇත. කුරුඳු තලන්නන් ගේ කුලයට පිටස්තර කුලවල අය ද දැන් මේ කර්මාන්තයට ඇතුළු වී ඇත. මේ හේතූන් නවීන කුරුඳු තලන්නන් පුහුණු ශ්‍රමිකයන් නොවන බවට නගන චෝදනාවන්ට ද එක් හේතුවක් විය හැකි ය.

## 8. කුරුඳු පොතුවල වර්ගය.

කුරුඳු පොතු වර්ගීකරණය සඳහා යොදා ගන්නා බොහෝ පිණුම් කුරුඳු පොතුවල නෛසර්ගික භාවිත වටිනාකම මත පදනම් නොවූ ඒවා ය. නිල වර්ගීකරණයන් පොත්තේ ඝනකම වර්ගීකරණයට ඔරොත්තු දෙන ප්‍රමාණය, එක පොතු පීරියක ඇති පොතු හා කුඩු ප්‍රමාණය මත තීරණය වේ. මෙම සාධක කුඩා වන තරමට වර්ගීකරණය උසස් වී රාත්තලක මිළ ඉහළ නැංවී, අවසාන පරිභෝජකයාට වඩා හොඳ නිෂ්පාදනයක් ලැබේ. එසේ වුව ද, නිර්යාතකයෝ සාමාන්‍ය ඇසුරුම් ස්වභාවය හා පැහැය ද සැළකිල්ලට ගනිති. අවසාන නිෂ්පාදනයේ වර්ගය පිළිබඳ තීරණයට නිෂ්පාදනය හා වගා කිරීම යන හැම අවස්ථාවක දීම බලපෑම් ඇති වේ. වගා කිරීමේදී පස සංරක්ෂණය, තණ කොළ ඉවත් කිරීම හා කප්පාදු කිරීම, වඩා හොඳ පොත්තක් සහිත ව කුරුඳු ගස කෙළින් වැඩීමට උපකාරී වේ. කුරුඳු තලන්නා බාහිර පෙනුමට අවහිරයක් නොවී කුරුඳු මිටි තුළම ඉතිරි කුඩු ආදිය කෙතරම් අන්තර්ගත විය යුතු ද යන්න තීරණය කරන අතර, පසුව වෙළෙඳුන් විසින් ඒවා වර්ගීකරණය කරනු ලැබේ.

වෙළඳ අංශයේ සෑම කොටසකින් ම වන චෝදනාවකි, සාමාන්‍යයෙන් කුරුඳු පොතුවල තත්වය දැන් වඩාත් පහත් මට්ටමක ඇති බව. තවදුරටත් සලකන කල්හි වර්ගය පිළිබඳ වංචා කිරීම් බහුලව පැතිරී ඇත. නිෂ්පාදකයා ගේ අංශයේ දී කුරුඳු කුඩු හා අනෙකුත් ද්‍රව්‍ය ඇතුළත් කර බාහිර පෙනුමේ වෙනසක් නැතිව බරෙහි එක්තරා ප්‍රමාණයක වැඩිවීමක් ඇති කර ගත හැකි ය. එසේම වෙළෙන්දා වර්ගීකරණය කිරීමෙන් පසු වඩා හොඳ එච් 2 වර්ගයට වඩා උසස් නොවූ එච්. 3 වර්ගය ද කලවම් කිරීමක් කරයි. මෙහි දී මිළ දී ගන්නාට සියුම් හේතූන් මත විවිධ වර්ගීකරණයන්ට ගොදුරු වූ මේ මිටි එකිනෙක වෙන් කිරීම ඉතා භාරදූර කාර්යයකි.

මෙහි දී නැව් ගත කෙරෙන්නේ රාත්තල් 100 ගෝනි ලෙස බැවින් එච් 2 වර්ගයේ මිටි 60 ක අණවුමකට නැව්ගත කරන්නට පහසුවෙන් ම එච් 3 වර්ගයේ මිටි කීපයක් ඇතුළත් කළ හැකි ය. මෙවැනි වංචාවන් සොයා ගත හැක්කේ මේ විශාල තොග එකින් එක මුදවා නැවත මුද්‍රා තැබීමෙන් බැවින් එය කළහැක්කේ විශාල කාල වේලා ගත කිරීමෙන් පමණි. ලොයිඩ් වැනි ජාත්‍යන්තර මට්ටමේ සමාගමකින් පවා වර්ගය පිළිබඳව නිකුත් කරන සහතික වුව ද, නිසියාකාර ආරක්ෂිත ආවරණයක් නොවන්නේ මේ හේතූන් මත ය.

දැනට නිර්යාත කරන කුරුඳු බොහොමයක් වර්ගය අතින් බාල තත්වයක පවතින්නට කරුණු ගණ රැස් පදනම් වී ඇත. ඉන් ප්‍රධානතම වනුයේ 6 වැනි කොටසින් දැක් වුනු පරිදි වැවිලි කර්මාන්තයේ දී සිදු වන දුර්වලතා ය. දුර්වල පස් සංරක්ෂණය, පසට පෙහෙමන ආරක්ෂිත ක්‍රම භාවිතා නොකිරීම, ක්‍රමානුකූලව තණ කොළ ඉවත් නොකිරීම, වර්ගයෙන් උසස් නොවූ කුරුඳු පීලිවලට අඩු දෙන අක්‍රමවත් පොතු ගැලවීම ලෙස ඒවා දැක් විය හැකි ය. පස් වන කොටසෙහි දැක් වූ අන්දමට ඊළඟ ප්‍රධානතම හේතුව මිල විචලතාවයි. මිල වෙනස් වීම හෝ ඒ පිළිබඳ අපේක්ෂාවන් නිසා බොහෝ විට කුරුඳු පොතු ගැලවීමේ කාලය වෙනස් වේ. මිල ඉහළ ගිය අවස්ථාවන්හි දී හොඳින් නොමේරූ කුරුඳු ද පොතු ගැලවීමට යොදා ගන්නා අතර, මිල පහළ යාමේ දී මේ කාර්යයට අනවශ්‍ය කාල පමාවක් ඇති වෙයි. තෙවැනි හේතුව කුරුඳු ගැලවීමේ කොන්ත්‍රාත්තුව යි. මිල ඉහළ ගිය අවස්ථාවල දී වැඩි වාසි තකා 'සූන් බූන්' ලෙස ඉවත දමන කුරුඳු කැබලි පවා පොතු අතරට අසුරා බර වැඩි කිරීමට උත්සාහ කරනු ලැබේ. එසේම මිල අඩුවීමේ දී ඉතා හොඳ පොත්ත පමණක් ඇසිරීමට කුරුඳු තලන්නෝ උනන්දු වෙති. එහෙත් බොහෝ කුරුඳු තලන්නන් කුලී කරුවන්ට ගෙවීම් කරනුයේ රාත්තල් ප්‍රමාණයට බැවින් බර වැඩි කිරීමට 'සූන් බූන්' ආදී අනවශ්‍ය ද්‍රව්‍යය ද ඇතුළත් කරති. එයින් ප්‍රමාණය වැඩි වන නමුදු වර්ගය ඉතා පහළ තත්ත්වයකට බසියි. හතර වන හේතුව ලෙස දැක් විය හැක්කේ සාමාන්‍යයෙන් සෑම කුරුඳු නිෂ්පාදකයෙකුටම මේ වර්ගය පිළිබඳ වංචා කරන බව යි. ඒ නිසා සෑම ගැණුම් කරුවෙකුම වර්ගය පහත්ය, යන උපකල්පනය මත මිල ගණන් දක්වයි. වර්ගය පිළිබඳ මේ ප්‍රශ්නය සෑම නිෂ්පාදකයෙකුටම පොදු දෙයක් නොවේ. ඊට හේතුව විශාල වතු වලින් වඩා හොඳ අස්වැන්නක් ද උසස් වර්ගයේ කුරුඳු ද ලැබෙන බැවිනි (21). මේ නිසා වර්ගය ගැන උනන්දුවක් දක්වන වෙළෙන්දෝ සුළු නිෂ්පාදකයින් ගෙන් කුරුඳු මිල දී ගැනීමට මැලි වෙති. සුළු නිෂ්පාදකයින් ගෙන් තත්වයෙන් බාල කුරුඳු මිලයට ගැනීමෙන් සිය කීර්ති නාමයට කැළලක් වෙතැයි සිතන ඔවුහු හැකිතාක් දුරට සිය මිල දී ගැනීම් විශාල වතු වලින් ම කරති. විශාල වතුවල මනා පරිපාලන කටයුතු නිසා උසස් වර්ගයේ කුරුඳු නිෂ්පාදනය වේ (6 වන කොටස).

මේ හැරුණු විට විශාල වතුවල කුරුඳු හා සුළු නිෂ්පාදකයින් ගේ කුරුඳු ද අතර වැදගත් වෙනසක් ඇත. සාමාන්‍යයෙන් ගැණුම් කරුවකු කුරුඳු හෝ ඕනෑම භාණ්ඩයක තත්වය හා වර්ගය තීරණය කරන්නේ ඒවා එක එක පරීක්ෂා කිරීමෙනි. එහෙත් කුරුඳු පොතුවල දී මෙය ඉටු කර ගැනීම ඉතා දුෂ්කර ක්‍රියාවකි. තත්වය හා වර්ගය තීරණය කර ගත හැකි අනෙක් ක්‍රමය නම්, එක්තරා නිෂ්පාදකයෙකු ගේ කුරුඳු එකම ගැණුම් කරුවෙකු වෙත ගෙන යාමෙන් තම කුරුඳුවල වර්ගය එම වෙළෙන්දාට තහවුරු කිරීම යි. එහෙත් මෙය වැදගත් වන්නේ ගැණුම් කරුවට තම ගිවිසුම කඩ නොකල හැකි වන පරිදි ස්ථාවර සැපයුමක් තිබුණ හොත් පමණි. කුරුඳු නිෂ්පාදකයින්ට කාර්යයන් දෙකක් පිළිබඳව විමසිලිමත් විය යුතු වේ. එනම්, කුරුඳු තලන්නන් කුලියට ගැනීම හා කුරුඳු පොතු අලෙවිය යන අංග දෙක යි. නමුත් අලෙවියේ දී ඔහුට කේවල් කිරීම අවාසිදායක ද වනු ඇත. පොතුවල ප්‍රමාණය වැඩිවත්ම ස්ථාවර වෙළඳ බැඳීමක් ඇති වේ. නිදසුනක් ලෙස විශාල වත්තක කුරුඳු තැලීම සඳහා එකම පිරිස උපයෝගී කර ගැනීමෙන් වර්ගය පිළිබඳ සැකයක් ඇති නොවේ (22). ඊට හාත්පසින් ම වෙනස් ආකාරයට සුළු ඉඩම්

හිමියෝ වාර්ෂිකව විවිධ කුලී කරුවන් ගෙන් ඒ කාර්යය ඉටු කරවා ගනිති. එසේම විශාල වතු හිමියෝ සෑම විටම, නාගරික ගැණුම්කරුවකුට අලෙවි කරයි. විශාල ප්‍රමාණයක් බැවින් ඩූර තොගයම ගැණුම් කරුවා ගේ හෝ නිෂ්පාදකයා ගේ හෝ වාහනයකින් වෙළඳ පොලට ගෙන යා හැකි ය. ප්‍රමාණයේ විශාලත්වය මත ගැණුම් කරුවා ඊට පසුව ද එම නිෂ්පාදක භාණ්ඩය (තත්වයෙන් උසස් නම් පමණක්) ලබා ගැනීමට පෙළඹෙයි. වර්ගය පහත් වී නම් ඊළඟ වර්ෂයේ දී ගැණුම්කරුවා ඊට අඩු මුදලක් ගෙවීමට පෙළඹෙයි. සුර නිෂ්පාදකයෝ කුඩා පරිමාණයන් ගෙන් ග්‍රාමීය හෝ වෙළඳ පොලේ හෝ සිටින අතරමැදියන්ට අලෙවි කරති (23). මොවුන් ගේ කුඩා තොග අනිකුත් විශාල තොගයන්ට එකතු වන බැවින් වර්ගයේ උසස් බව සමහර විට ඵල රහිත වනු ඇත.

මේ දීර්ඝ සාකච්ඡාව අවසානයේ දී 'එසේ නම් කුමක් ද' යන ප්‍රශ්නය නිතැතින් ම ගැනෙනු ඇත. විදේශීය ගැණුම් කරුවන්ට ලංකාවේ කුරුඳු තත්වයෙන් පහත් යැයි සිතන්නේ නම් උසස් තත්වයකින් යුතු කුරුඳු සඳහා වැඩි මිළක් ගෙවීමෙන් නිෂ්පාදකයා දිරිමත් කළ නොහැකි ද? අපට ඒ සියල්ලම වෙළඳ පොල තීරණය කරතියි යන හැඟීමෙන් නිහඬ වීමට සිදු වේ. මීට හේතු රාශියකි. නිෂ්පාදකයා ගේ සිට නිර්යාත කරන්නා දක්වා සෑම වෙළඳ අංශයකම වංචා කිරීම පිළිබඳ අදහසක් ඇතිනම් මිළ පහළ බැසීම වැලැක්විය නොහැකි ය. ඒ නිසාම ඉතා හොඳ නිෂ්පාදකයට වුව ද, අඩු මිළක් ලැබේ. අනෙක් කරුණ නම්, එච්. 2 සැපයිය හැකිව තිබිය දී එච් 3 සැපයීම ද වර්ගීකරණයේ ප්‍රශ්නයක් ලෙස සැලකිය නොහේ. මෙය සම්පූර්ණ වංචාවක් වන අතර, ඒ නිසා ද ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ පොල විනාශ වේ. ලෝකයේ කුරුඳු හා කැසියා වෙළඳ පොල සම්බන්ධයෙන් 4 හා 5 වන කොටස්වල දෙන විස්තරයන්ට අනුව ශ්‍රී ලංකාව නිපදවන ඉතා හොඳ කුරුඳු සුර මිලකට අලෙවි වේ. අස්ථිර අනාගතයත්, සැපයුම් විචලතාවයනුත් නිසා එහි ජාත්‍යන්තර වෙළඳ පොල දියුණුව අවහිර වේ. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවට දැන් අවශ්‍ය ජාත්‍යන්තර වෙළඳ පොලට ඇතුළු වීම නොව, එය උදුරා ගැනීම බව එයින් පැහැදිලි වේ.

මේ සම්බන්ධයෙන් කළයුතු උපක්‍රමය සැලසුම් කළයුතු ය. එසේ වුව ද, පහත දැක් වූ කරුණු එහි අවශ්‍යයෙන් ම අන්තර්ගත යුතු යයි හැඟේ. ඉල්ලුම සීඝ්‍රව හා ස්ථාවරව ඉහළ යාමත්, ඒ අනුව මිළ ඉහළ යාමත් අනුව සැපයුම වැඩි කිරීම සීමා කළයුතු ය. මිළ විශාල පහත වැටීම් වලින් ආරක්ෂණය කිරීමට යම් යම් ක්‍රම තිබිය යුතු ය. මෙය 13 වන කොටසේ දී විස්තර කරනු ලැබේ. ජාත්‍යන්තර මිළ ගණන්වල දී මෙසේ මිළට ආරක්ෂාවන් දැනටමත් යොදා ඇත. ලාංකික නිෂ්පාදනයේ වර්ග ආරක්ෂා කිරීම සඳහා වර්ගය වැඩි දියුණු කිරීම පිළිබඳ උත්සාහය හා ඒවා ප්‍රසිද්ධ කිරීම සැපයීමේ විචලතා වැලැක්වීම ද, වංචා කිරීම් නැති කිරීම් ද එම සැලසුමේ වැදගත් අංගයන් විය යුතු ය. එසේම මෙහි සමහර කොටස් සැලැස්මක අන්තර්ගත වීම සුදුසු නොවේ. එබැවින් සැලසුම් සකස් කිරීමේ දී ඒවා ධාරණය කොට, එම හැඟීම් ද අන්තර්ගත වන පරිදි සකස් කළයුතු ය.

කෙසේ වුව ද, එහිම ආන්තික බලාපොරොත්තුව ඉටු කර ගැනීමට නම් උක්ත කරුණු වලින්

සමහරක් ඉෂ්ට විය යුත්තේම ය. කුරුඳු පොතු නිර්යාතයේ දී ඒවා ජාත්‍යන්තර ප්‍රමිතිකරණයට අනුව වර්ග කළයුතු ය. එහෙත් සමහර නිර්යාතකයන් තවමත් ඒවා දේශීය ප්‍රමිතිකරණ ක්‍රමයන්ටම වර්ග කරති. දෙවන කරුණු වශයෙන් ඉතා තියුණු අන්දමින් වර්ගීකරණයක් හා විශ්ලේෂණයක් සෑම නැව් තොගයක් ම වෙනුවෙන් කළයුතු ය. රජය මේ කරුණු සම්බන්ධයෙන් තම යුතුකම් ඉෂ්ට කරන බවට පොරොන්දු වී ඇතත්, තවමත් ඒවා ඉටු වී නැත.

9. කුරුඳු අසීරු භෝගයක් ද?

මුලින් කොටයේ දී බලන විට කුරුඳු මූලික වශයෙන් කුඩා ඉඩම් හිමියන් ගේ වගාවක් ලෙස දක්වන ලදී. එසේ වුව ද, විශාල වගාවන් වැඩි අස්වනු ප්‍රමාණයක් හා හොඳ වර්ගයේ කුරුඳු නිෂ්පාදනය කරයි. එහෙත් වටිනාකම් අංශයෙන් බලන විට කුරුඳු තවමත් සුළු භෝගයක් වශයෙන් පවතී. මෙසේ සුළු නිෂ්පාදකයින් ගේ භෝගයක් වශයෙන් තිබීම කුරුඳුවල සමස්ථ නිෂ්පාදනයට බාධාවක් වේ. මේ සුළු ඉඩම් හිමියෝ කුරුඳුවල ඉතාමත් වැදගත් නොවන, තත්ත්වයෙන් බාල කුරුඳු නිෂ්පාදනය හා සැපයුමේ විචලතාවයන්ට මූලික හේතුවක් වන හෙයිනි. මේ හේතූන් නිසා කුරුඳු අසීරු භෝගයක් වශයෙන් නඟා සිටුවීමට නම් එහි ශිල්පීය හා ආර්ථික විශේෂඥයන් දක්වන්නේ එය ස්ථිර කම්කරු සංඛ්‍යාවක් සිටින විශාල වැවිලි භෝගයක් ලෙස වගා කළයුතු බව යි. මෙම විශාල වතු, පහත දැක්වෙන අන්දමට පාලනය කළ හැකි ය.

මේ වතු දැනට විශාල වගාවන් හිමි, සුළු පිරිස කටයුතු කරන ලෙස කුරුඳු පොතු ගැලවීම අඩු රුද්ද මුවල්ලේ ම කළ හැකි ආකාරයට සකස් කළයුතු ය. පොත්ත මේරීමේ උපරිම අවස්ථාවට පැමිණි වහාම ඒ කටයුත්ත යොදා ගත හැකි ය. එසේම පස සංරක්ෂණය හා අර්ද්‍රතාවය රැක ගැනීම සඳහා රසායනික පෝර, තෙත පිදුරු ආදිය යෙදිය යුතු ය. මෙයින් කුරුඳු වගාවේ ඉක්මන් වැඩීම, විශාල අස්වැන්නක් හා උසස් වර්ගය යන සියල්ලම තහවුරු කළ හැකි ය. කුරුඳු තලන්නන් දෛනික වැටුපට හෝ වෙනස් මාසික වැටුපට හෝ ලාභ යොදා ගැනීමේ ක්‍රමයකට හෝ සේවයේ නිරත කර ගත හැකි ය.

ඉතා හොඳ වර්ගයේ කුරුඳු නිෂ්පාදනය කිරීම සඳහා දිරි ගැන්වීම් තිබිය යුතු ය. එසේ ම ස්ථාවර කුරුඳු ප්‍රමාණයක් වෙළඳ පොලට ඉදිරිපත් කිරීමට හැකි වන බැවින් ස්ථාවර මිළ ගණන් ද ඇති වෙතැයි සිතිය හැකි ය. මෙතෙක් දුරට මිළ ගණන් සීඝ්‍ර විචලනයන්ට බාධා වුනු නමුදු විශාල වතු හිමියන්ට ධන සංචිත තිබෙන බැවින් මිළ අඩු වීම නිසා පෝර යෙදීම් ආදිය මඟ හැරීමට සිදු වූයේ නැත. මේ කරුණ නව වතු වගාවේ දී ද වැදගත් වනු ඇත. එසේම විශාල වතු ලෙස කටයුතු කරන විට කුරුඳු පොත්තේ වර්ගය පිළිබඳව වංචාවන් කිරීම ද වෙළඳ පොලෙන් ඉවත් වනු ඇත.

වතු වගාව සුළු නිෂ්පාදකයින් ලෙස වගා කිරීමට වඩා සාර්ථක බව පිළිගෙන ඇතත්, සුළු නිෂ්පාදකයෙන් ද වාසි ඇත. මෙහි දී විශාල පවුලේ ශ්‍රම ප්‍රමාණයක් කර්මාන්තයට යෙද වෙන

අතර, වෙනත් සේවාවන්හි නිරත අයට ද, ඒවාට බාධා නොවන සේ නිෂ්පාදනයට හවුල් වීමට හැකි වේ. එසේ වුව ද, කුරුඳු කර්මාන්තයේදී එය එසේ නොවේ. මන්ද, කුරුඳු පොතු ගැලවීම සඳහා විශාල ශ්‍රම ප්‍රමාණයක් අවශ්‍ය බැවිනි. 1971 දී ජාතික සමීක්ෂණයට අනුව වගාකරුවන් ගෙන් 9% ක් පමණ පවුලේ ශ්‍රමය පමණක් කුරුඳු පොතු ගැලවීම සඳහා උපයෝගී කර ගත්හ (24). බටපොල සමීක්ෂණයට අනුව ද කුරුඳු පොතු ගැලවීමෙන් 63% ක් පමණ කුලී කරුවන් විසින් කරන ලද්දේ. බොහෝ විට මෙය ද වෙනත් තැනක රැකියාවක් කළ නොහැකි පවුලේ මහලු පිරිස් විසින් කෙරුණි. සුළු නිෂ්පාදනයේ දෙවන වාසිය ඔවුන් විශාල වතුවලට වඩා සූක්ෂම ලෙස වගා කිරීම යි. මෙතැන දී ද කුරුඳුවල තත්වය වෙනස් වේ. ඊට හේතුව පෝර යෙදීම හා අනෙකුත් වැඩිලි ක්‍රම සුළු නිෂ්පාදකයා මඟ හරින බැවිනි. ඒ හේතුව මත කුරුඳු විශාල වතු ලෙස වගා කිරීම සැසඳිය නොහැකි තරමට ඉතාමත් හොඳ බව කිව හැකි ය (25).

කුරුඳු කර්මාන්තය සම්බන්ධයෙන් පැන නැඟී ඇති බොහෝ ප්‍රශ්න සුළු නිෂ්පාදකයින්ටම පොදු ඒවා ය. එසේ නොමු වෙනත් ව්‍යුහාත්මක හා ශිල්පීය ප්‍රශ්න ද ඇත. එනම්, සැපයුමේ විචලතාවය, ඉල්ලුම හා මිළ, ඉඩම් හිමියන් ගෙන් නිෂ්පාදනය වෙනුවෙන් ලැබෙන දායකත්වය සුළු වීම වර්ගය වංචා කිරීම ආදී හේතූන් නිෂ්පාදනය මෙතරම් ඵල රහිත වීමට හේතු වශයෙන් පෙනී සිටී. සුළු නිෂ්පාදකයෝ මේ තත්වය වඩ වඩා තීව්‍ර කරති. කුරුඳු නිෂ්පාදනයට යොදවන සම්පත් වලින් ලැබෙන ලාභය, ඒවායේ ඵලදායීතාවයට වඩා බෙහෙවින් අඩු ය. එබැවින් රජයට නිෂ්පාදනය දියුණු කිරීම සඳහා ඇතුළු වීම ද දුෂ්කර ය. මේ හේතුව මත රජයේ ඇතුළු වීම කෙබඳු ආකාර ද යන්න සොයා බැලිය යුතු ය.

### III කොටස

**කුරුඳු සහ රාජ්‍ය තන්ත්‍රය.**

**10. ආයතනික ආශය.**

දෙවන කොටසේ දී රාජ්‍ය තන්ත්‍රයේ මැදිහත් වීමෙන් කුරුඳු නිෂ්පාදනය වැඩි දියුණු වීමත්, ඒ මගින් ශ්‍රී ලංකාවට ලැබෙන ආදායම වැඩි දියුණු කර ගත හැකි ආකාරයත් පෙන්නුම් කෙරිණි. මෙහි දී කෙරෙනුයේ රාජ්‍ය තන්ත්‍රයේ මැදිහත් වීම, වර්ගය උසස් කිරීම, මිළ විචලනයන් අඩු කිරීම, සැපයුම් බාධාවන් තුරන් කිරීම, විදේශික ගැණුම්කරුවන් ඉහළ මිළක් ගෙවීමට පෙළඹවීම යනාදී කටයුතු සඳහා උපයෝගී කර ගග හැකි පරිදි රාජ්‍ය නීති සැකසිය යුත්තේ කෙසේ ද යන්න සළකා බැලීම යි. එහෙත් මෙම කර්මාන්තය ගැන කථා කරන විට එහි දුර්වල හා අස්ථිර ස්වභාවය කෙරෙහි රජයේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

පාලන තන්ත්‍රයක් මගින් කළයුතු හෝ කළ දේ ගැන සැලකීම පහසු දැයෙකි. එසේ වුව ද, රාජ්‍ය නීතියක් මගින් කෙරෙන්නේ කුරුඳු නිෂ්පාදනය, වැවිලි ක්‍රම, ක්‍රියාදාම, මතු බලාපොරොත්තු ආදී කළයුතු වැඩ රැසක් පිළිබඳ අදහස් දැක්වීමක් පමණකි. ඇත්තවශයෙන් ම කිවහොත් මෙම නීති සම්පාදනයේ දී සිදු වන්නේ එකිනෙකට වෙනස් දෙපාර්තමේන්තු හා සංස්ථා රැසක විධායක නිලධාරීන් නැතහොත් නීති සම්පාදකයින් විසින් විටින් විට පළ කරන ලද මති මතාන්තර, අදහස් හා ක්‍රියාදාමයන් රැසක් සසම්භාවී ව එකතු වීම පමණි. විස්තරාත්මක ලෙස බැලුව හොත් මේ සෑම නීතියක් ම පාහේ කුරුඳු කර්මාන්තයේ එක්තරා අංශයකට පමණක් සීමා වනු විනා මුළු කර්මාන්තයට ම පොදු ආකාරයකට බලපෑමක් නොකරන බව පෙනේ. රාජ්‍ය සේවයේ නොයෙකුත් දෙපාර්තමේන්තු හා අංශයන්ට සීමා වූ අදහස් සම්ප්‍රදායන් ද, කුරුඳු කර්මාන්තයේ විවිධ අංශ සමඟ ඒවායේ ඇති බැඳීම් ද, පෞද්ගලික බලපෑම් ද යනාදිය බොහෝ විට මේ නීතිවලට සංකලනය වී ඇත. මෙයින් පෙනී යන්නේ කුරුඳු කර්මාන්තය සම්බන්ධයෙන් රජය ගත් සමහර තීරණයන් රාජ්‍ය තන්ත්‍රය සමඟ ඇති බැඳීම් කෙසේ වුව ද, ඒවා ස්වාධීනව ගත් කළ කෙතරම් අකාර්යක්ෂම වේද යන්න පැහැදිලි කිරීම ය.

මුලින් ම අපි කුරුඳු කර්මාන්තය හා බැඳුණු විවිධ රාජ්‍ය ආයතන මොනවා දැයි සොයා බලමු. කුරුඳු නිෂ්පාදකයින් හා වැඩි වශයෙන් ම බැඳීමක් ඇත්තේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවයි. මෙය කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ඉතා මෑත දී පිහිටුවන ලද්දකි. මූලික අපනයන භෝග වන තේ, පොල්, රබර් වලට අමතරව අනිකුත් සියළු ම සුළු අපනයන භෝග දියුණු කිරීමත්, එසේම නිර්යාත වර්ධනය කිරීමත්, මෙහි අරමුණයි. කුරුඳු විශාලතම සුළු අපනයන භෝගය බැවින් දෙපාර්තමේන්තුවේ වැඩ රාශියක් ම මේ මත සංකේන්ද්‍රනය වී ඇත. මෙහි දී වගා නිලධාරීන් ගේ මූලික කාර්යය වී ඇත්තේ කුරුඳු නැවත සිටුවීම හා පුනරුත්ථාපනය සඳහා සහනාධාර සැපයීම යි. (11 වන කොටස). වෙළඳ අමාත්‍යාංශය යටතේ ඇති වාණිජ දෙපාර්තමේන්තුව ද කුරුඳු කර්මාන්තය හා සම්බන්ධ වේ. මෙය කුරුඳු නිර්යාත වාර්තා සකස් කරන අතර, අවම මට්ටම් මිළක් තීරණය කිරීමේ දී ද වැදගත් කාර්යයක් ඉටු කරයි (13 වන කොටස). මීට අමතරව වෙළඳ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා වාණිජ ඒකාබද්ධ අපනයන සංස්ථාව, කුරුඳු නිර්යාතය පිළිබඳ ඒකාධිකාරයක් අනුගමනය කරයි. මේ කුරුඳු වැඩිපුරම නිර්යාත කෙරෙන්නේ මෙක්සිකෝවටයි (14 වන කොටස). කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය, නිර්යාත කරන කුරුඳුවලට නීතිමය වර්ගීකරණ සීමා පනවා වර්ගය ආරක්ෂා කිරීමට උත්සාහ කරයි. රාජ්‍ය පෝර සංස්ථාව කුරුඳු කර්මාන්තයට විශේෂ පෝර නිකුත් කරයි. පෝර සුළු නිෂ්පාදකයා වෙත ඇදී යන එකම මාර්ගය ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ ඇති විවිධ සේවා සමුපකාර සමිති මගිනි (12 වන කොටස). මෙසේ විවිධ අමාත්‍යාංශය යටතේ ඇති සංස්ථා හා දෙපාර්තමේන්තු රැසක් මගින් කුරුඳු නිෂ්පාදකයා ගේ සිට පාරිභෝගිකයා දක්වා ගමන් කරයි.

මීට පසුව ඇති කොටස් කිහිපයකින් කුරුඳු කර්මාන්තය හා බැඳුණු ඉහත දැක් වූ ඒවා ඇතුළු තවත් නො යෙකුත් රාජ්‍ය ආයතනයන්හි මූලික වැඩ සටහන් පිළිබඳ සාකච්ඡාවක් හා ඇගයීමක් කෙරේ. එහෙත් මෙහි අරමුණ රාජ්‍ය නීතිය අගය කොට එයට වෙනස්කම් යෝජනා කිරීම නො

වේ. කුරුඳු තලන්නන්, වැවිලි කරුවන්, වෙළෙන්දන්, රජයේ නිලධාරීන් යනාදී කොටස්වල අදහස්වලට අනුව දැනට ඇති නීතියේ දුර්වලතා සොයා බලා, ඒ වෙනුවට යෝජනා කළ හැකි ක්‍රම ඉදිරිපත් කිරීම අපේ අරමුණ යි. මෙහි දී ලැබෙන අදහස්, විරෝධතා වලින් යුක්ත වුව ද, ඒ අනුව යම්කිසි ප්‍රමාණයකට දේශපාලන වාතාවරණයක් යටතේ වූ ප්‍රතිපත්තියක් නිගමනය කර ගත හැකි වනු ඇත. ඒ ඒ ජන කොට්ඨාශවල මතයට අනුව රජය විසින් නීතිගත කළයුතු හා ඉෂ්ට කළයුතු කාර්යයන් මොනවා ද? මේවා සකස් කිරීමේ දී රාජ්‍ය ආයතනයන්ට කුමන අංශ යන්හි බලපෑම්වලට යටත් විය යුතු ද? මෙවැනි තන්හි දී රාජ්‍ය දෙපාර්තමේන්තු සේවකයන් ගේ කාර්යයන් කෙබඳු වී ද? මෙලෙස මෙම ප්‍රතිපත්තිය අගය කිරීම නොව, එය බිහි වුණු ආකාරය හා ක්‍රියාත්මක වන ක්‍රමය හැදෑරීම මෙහි අරමුණ වනු ඇත.

11. නැවත වගා කිරීම හා පුනරුත්ථාපනය සඳහා සහනාධාර.

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව කරන එක් විශාල එමෙන් ම වැදගත් කාර්යයකි, කුරුඳු වගා කරන්නන් වෙත දෙන නැවත වගා කිරීමේ හා වගා පුනරුත්ථාපනය කිරීමේ සහනාධාර පිළිබඳ කටයුතු සම්පාදනය කිරීම. 1970/77 අතර කාලයේ දී රජය විසින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේ මූලික හේතුවක් වූයේ අපනයන ඉපයීම් විවිධාංගකරණය කිරීම යි. මෙම කාර්යයේ දී දෙපාර්තමේන්තුව සෑහෙන දියුණුවක් ලබා ඇති බව පෙනේ. මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේ අරමුණ, මෙතෙක් කිසියම් රජයේ දෙපාර්තමේන්තුවක ආවරණය නොලැබූ භෝග වගාවන් සඳහා දෙපාර්තමේන්තුවක් ඇති කිරීම යි. සම්ප්‍රදායික අපනයන භෝග වන තේ, රබර් හා පොල් සඳහා වෙනම දෙපාර්තමේන්තු පිහිටා ඇති අතර, ඒ ඇතුළු අනිකුත් ස්වයං පාරිභෝගික කෘෂිකාර්මික භෝග සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරයි. එකළ කුරුඳු, ගම්මිරිස්, සාදික්කා, එනසාල්, කොකෝවා, පැපේන් හා පැඟිරි ආදී සුළු අපනයන භෝග මේ දෙපාර්තමේන්තුවලට ඇතුළත් වී නොතිබුණි. මේ කාලයේ දී රජයෙන් මෙතෙක් ආවරණය නොලද භාණ්ඩ සඳහා සමාන අයිතිවාසිකමක් ලැබීමේ අදහස් ද ඉතා සීඝ්‍රයෙන් පැන නඟින්නට විය. බොහෝ දෙනෙකු ගේ අදහස වූයේ එක්තරා කෙනෙකු කුරුඳු වැවෙන ප්‍රදේශයක හෝ වෙනත් නිසරු පෙදෙසක උපත ලද නිසාම ඔහුට ආර්ථික පීඩනයකට ලක් වීමට ඉඩ හැරීම සාධාරණ නොවන බව යි. රජය විසින් සෑම අංශයකම වගාවන්ට අත හිත දිය යුතු බව ඔවුහු පිළි ගත්හ. සම්ප්‍රදායික අපනයන වන තේ, පොල්, රබර් යනාදී ස්ථිර වගාවන්ට නැවත වගා කිරීම, අළුතින් පැළ සිටුවීම හා පුරුත්ථාපනය වැනි කටයුතු සඳහා විශේෂ සහනාධාර ලැබේ. ඒ ක්‍රමයම ස්ථාවර භෝගයන්ට සහනාධාර ක්‍රම සකස් කිරීමේ දී යොදා ගන්නා ලදී.

කුරුඳුවල අක්කර ප්‍රමාණය මීට වඩා විශාල කිරීම එතරම් ප්‍රතිඵලදායී දෙයක් නොවන බැවින් කුරුඳුවලට නැවත වගා කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා පමණක් සහනාධාර සපයන ලදී. මෙහි දී පරණ වගාව ඉවත් කොට අළුත් පැළ සිටුවීම කළයුතු වේ. රජය මඟින් නැවත වගා කිරීම සඳහා දෙන ආධාර සම්බන්ධයෙන් මත කිහිපයක් ඉදිරිපත් විය. ඉන් එකක් නම්, අළුත්

පැල සිටුවා ඒවායින් ආදායමක් ලබා ගැනීම සඳහා සෑහෙන කාලයක් ඉවසා සිටිය යුතු බැවින්, වතු හිමියන්ට, විශේෂයෙන් ම කුඩා වතු හිමියන්ට අස්වැන්නක් ලැබෙන තුරු වර්ෂ ගණනක් සිටිය යුතු නිසා සහනාධාරයක් නොලැබේ නම්, ඔවුන් නැවත සිටුවීමට වඩා උනන්දුවක් නොගන්නා බව යි. එසේම දෙවැනි මතය වූයේ පර්යේෂණ මධ්‍යස්ථානයන්හි සොයා ගන්නා ලද වැඩි පැල දරණ හොඳ වර්ගයේ පැල නිෂ්පාදකයින් අතර බෙදා හැරීමේ ක්‍රමයක් ලෙස සහනාධාර ලැබෙන බව යි. එහෙත් කුරුඳු ගැන සළකන විට සහනාධාර දීම සඳහා පළමුවන මතය උපයෝගී කර ගැනීම අසීරු වේ. මන්ද, කුරුඳු ගසක් තේ, රබර්, පොල් මෙන් නොව අවුරුදු 2 1/2 ත් 3 ත් අතර කාලයේ දී පොතු ගැලවීම සඳහා සූදානම් තත්වයකට එළඹෙන බැවින් ගොවියාට බොහෝ කලක් ඉවසා සිටීමට සිදු නොවන බැවිනි. දෙවැනි මතය අනුව සලකන විට පර්යේෂණ මධ්‍යස්ථානයන්හි දී සොයා ගත් නව වර්ගයන් නොවන බැවින් එම මතය කිසියේත් අදාළ නොවේ. (26). කුරුඳුවල මෙම තත්වය නිසා සහනාධාර වශයෙන් ගෙවීමට නිර්දේශ කළ හැක්කේ ඉතා සුළු මුදලක් බව අපට සිතා ගත හැකි ය. පුනරුත්ථාපන සහනාධාරය දෙනු ලබන්නේ හොඳින් වැඩුනු පැල 800 කට වැඩි ප්‍රමාණයක් එක් අක්කරයක තිබේ නම් පමණි. මෙහි දී සපයන ලද සහනාධාරය වන්නේ නොමිලයේ අමතර පැල දීම පමණි. නැවත වගා කිරීමේ සහනාධාරය දෙන් නේ අක්කරයකට හොඳ වර්ගයේ පැල 800 කට අඩුව තිබේ නම් පමණි. මෙහි දී නොමිලේ පැල හා බීම සකස් කිරීම, නැවත වගා කිරීම හා රැක බලා ගැනීම යන අවස්ථාවන්හි දී ඒවා නිම කිරීමෙන් පසු කොටස් වශයෙන් ලැබෙන පිළිවෙළට රු.300.00 ක දෙන සහනාධාරයක් ලැබේ. හැම කාර්යයක් අවසානයේ දී ම ක්ෂේත්‍ර නිලධාරියා ඒවා පරීක්ෂා කර බලයි. එහෙත් නැවත වගා කිරීම සඳහා යන නියම වියදමත්, තේ, රබර්, පොල් සඳහා යන වියදමට බොහෝ දුරට සමාන නමුත් ඒවා සඳහා දෙනු ලබන සහනාධාර හා සසඳන විට මෙය ඉතා සුළු මුදලක් වේ. මෙහි දී කර්තෘවරයා 1977 දී ලිපි ගොනු අංක අනුව තෝරා ගන්නා නියැඳිය කින් මෙම සහනාධාර ක්‍රමයේ ක්‍රියාකාරීත්වය අගය කළේය. කුරුඳු වගා කරන දිස්ත්‍රික්ක පහේ අයදුම් පත්‍ර සංඛ්‍යාව අනුව තෝරා ගන්නා ලද 85 දෙනෙකුගෙන් 65 දෙනෙකු හමු වී සාකච්ඡා කරන ලදී. මෙහි දී සහනාධාර ගැන බොහෝ ගොවීන් ගේ අදහස වූයේ ඒවා ප්‍රතිඵල රහිත, කරදරකාරී, අනවශ්‍ය හා දූෂණ ආදිය නිසා එක් අංශයකට බර වූ සහනාධාර දීමේ පරමාර්ථය පවා විනාශ කර ඇති දැයක් බව යි. මේ ගැන ලුහුඩින් සාකච්ඡා කිරීම මැනවැයි හැඟේ.

ප්‍රතිඵල රහිත යනුවෙන් අදහස් කෙරෙන්නේ බොහෝ අයදුම්කරුවන්ට මෙම සහනාධාර මුදල නො ලැබෙන බව යි. නැවත වගා කිරීමේ සහනාධාරය සඳහා අයදුම් කරන ලද 33 දෙනෙකු ගෙන් 5 දෙනෙකුට පමණි, නොමිලේ පැල ලැබී තිබුනේ. ඔවුන් ගෙන් ද දෙදෙනෙකුට ලැබී ඇත්තේ අවශ්‍ය ප්‍රමාණය නොව ඉතාමත් සුළු ප්‍රමාණයකි. මේ හැරුණු විට අයදුම් පත් ඉදිරිපත් කිරීමෙන් පසු 8 දෙනෙකු වෙත වෙනත් කිසිම තොරතුරක් ලැබී නැත. එසේම 10 දෙනෙකුට පමණ ක්ෂේත්‍ර නිලධාරියා පැමිණ පැල ලබා ගැනීම නිර්දේශ කර තිබුණ නමුත් එය ලබා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් කිසිම තොරතුරක් ලැබී නැත. අට දෙනෙකු පැල ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. ඊට හේතුව පැල ලබා ගැනීම සඳහා ගමන් කළයුතු දුර ගැන සළකා බලන විට එම පැල ඔවුන් ගේ ඉඩම්වල ම වගා කර ගැනීම පහසු බව හැඟී ගිය බැවිනි. එක්තරා තැනැත්තෙක් අසනීපයෙන් පසු වූ බැවින් අවශ්‍ය කාර්යයක් ඉටු කර ගත නොහැකිව සිටින අතර, තවත් තැනැත්

දෙනෙකුට අවශ්‍ය පහත මිලකට ලැබෙන කුරුඳු පෝර පමණි. නැවත වගා කිරීම පිළිබඳව දෙනු ලබන සහනාධාරයෙන් පූර්ණ සහනාධාර ප්‍රමාණයම ලැබී තිබුණේ 32 ක නියැදියකින් යුතු අයදුම් පත් සංඛ්‍යාවකින් පස් දෙනෙකුට පමණි. තවත් හය දෙනෙකුට මුදල් සහනාධාරයේ කොටස් කිහිපයක් පමණක් ලැබී තිබුණි. තවත් පස් දෙනෙකුට බිම් සකස් කරන ලෙස නියෝග ලැබී ඇතත් ඔවුන් තවම එය ආරම්භ කර නැත. එසේ වුව ද, බිම් සකස් කළ හය දෙනෙකු කියා සිටියේ ඔවුන් ක්ෂේත්‍ර නිලධාරියා ගේ ඉල්ලීම මත බිම් සකස් කළ නමුත් ඔහු ඒවා පරීක්ෂා කිරීම සඳහා නොපැමිණි බවත්, එබැවින් වැසි කාලයේ දී නැවත වගා කිරීම කළ නොහැකි වූ බවත් ය. මේ ආකාරයටම තවත් දෙන් දෙනෙකු ගේ වගාවන් වෙත ක්ෂේත්‍ර නිලධාරියා පැමිණ සිටි නමුත් වෙනත් කිසිම තොරතුරක් ඔවුන්ට දැන ගන්නට ලැබී නොමැත. මේ හැරුණු විට අයදුම් කරුවන් හත් දෙනෙක් අයදුම් කිරීමෙන් පසු තම **අයදුම්** පතට කුමක් සිදු වී දැයි නොදනිති. මෙහි දී 1972 හා 1974 වර්ෂවල අයදුම්පත් 65 කින් 49 දෙනෙකුටම සහනාධාර ලැබී ඇති අතර, 1976 වර්ෂයේ ද එය ලැබී තිබුණේ පස් දෙනෙකුට පමණි. සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යය කුරුඳු වගා සහනාධාර කටයුතු කිරීම වුව ද, එය සාධාරණව ඉටු වන බවක් නොපෙනේ. මේ හැරුණු විට ක්ෂේත්‍ර නිලධාරීන් පොදු ගමනා ගමන සේවාවන් භාවිතා කළයුතු බැවින් ඔවුන්ට එක දිනකට එක ක්ෂේත්‍රයකට පමණකි, යා හැකි වන්නේ. මේ තත්වය නිවැරදි වන්නේ බොහෝ කුරුඳු වගා කරන්නෝ ඉතා දුෂ්කර ප්‍රදේශවල වාසය කරන බැවිනි. (3 වන කොටස). මෙහි දී දළ වශයෙන් ගණනය කර බැලුවොත් සහනාධාර ගෙවීම සඳහා පරිපාලන කටයුතුවලට යන වියදමත්, සහනාධාරය සඳහා දෙන මුදලත් බොහෝ දුරට සමාන බවත්, පුනරුත්ථාපනය සඳහා දෙන සහනාධාරය බොහෝ විට මීට වඩා අඩු වන බවත් පෙනී ගොස් ඇත.

මෙම නීති රීති හා ක්‍රියාදාම දෙස විමසිල්ලෙන් බලන විට ඒවා අයදුම් කරුවන්ට විශාල කරදර යක් බව පෙනේ. බොහෝ විට සිදු වන්නේ සුළු මුදලක් ලබා ගැනීම සඳහා අනවශ්‍ය අයදුම් පත් ඉදිරිපත් කරමින් සිය කාලය අපතේ හැරීම පමණි. නිදසුනක් ලෙස සමහර වැවිලි කරුවෝ සිය භූමි ප්‍රදේශයන් කුරුඳු වගාව සඳහා සකස් කොට ඇත ද, ක්ෂේත්‍ර නිලධාරීන්ට ඒවා පරීක්ෂා කිරීමට යාමට අපහසු වීමේ හේතුවෙන් රජයේ සහනාධාර නොමැතිව තමාම කෙසේ හෝ වියදම් කර වගාව කර ඇති නමුත් තවත් සමහරෙක් ඒ සඳහා අවශ්‍ය මුදල් නොමැතිකමෙන් සකස් කරන ලද ඉඩම්වල නැවතත් වල් බිහි වීමට ඉඩ හැර ඇත. සමහර අවස්ථාවල දී අවුරුදු දෙකක් පිට පිටම මේ තත්වයට මුහුණ දුන් අයදුම් කරුවන් කිහිප දෙනෙකු ගැන ද අපට අසන්නට ලැබුණි. මොවුන් ගෙන් එක් අයෙක් ක්ෂේත්‍ර නිලධාරියා පිට පිටම කිහිප වරක් නොපැමිණීම ගැන ප්‍රකෝප වී ඔහුට පහර දුන් බවක් ද වාර්තා වී ඇත.

මෙම කරදරකාරී තත්වයට තවත් හේතුවක් වන්නේ ක්ෂේත්‍ර නිලධාරීන්ට වැඩ අධික වීමත්, සහනාධාර සම්බන්ධයෙන් අනුගමනය කළයුතු අනවශ්‍ය ක්‍රියාදාමයත් ය. බොහෝ සුළු පරිමාණ වැවිලි කරුවන් කරන්නේ නැවත වගා කිරීම හෝ පුනරුත්ථාපනය සඳහා හැම අවුරුද්දේ ම ලැබෙන ආකාරයට පැල කිහිපයක් ලබා ගෙන ඒවා සිටුවීම යි. එසේ වුව ද, සහනාධාර දීමේ දී අවශ්‍ය එක්තරා කොන්දේසියක්, මුළු කාර්යයම එක් වරම නිම කිරීම. එහෙත් එසේ කිරීමට

අවශ්‍ය පැල සහනාධාරය නොලැබීම නිසා ඊළඟ වසරේ දී ඔවුහු සහනාධාර ලැබීමට නුසුදුසු වෙති. මේ හැර කාර්යයන් නිම කිරීමට සෑම දෙනාම එකම අවස්ථාවක උත්සුක වීම නිසා අනවශ්‍ය තදබදයක් ද, වෙනත් කුලී වැඩ වලින් දවසේ ආදායම සොයා ගන්නා අයට එම කාර්යය කර ගැනීමට අවකාශ නොලැබීමද ආදිය නිසා වඩාත් වියවුල් තත්වයනට පත් වෙයි. නිදසුනක් ලෙස මිනිසෙක් පිය කාර්යයන් කර ගෙන යද්දී අසනීප වූවහොත් ඔහුට අරිත් පැල හෝ පොර සහනාධාරය හෝ නොලැබෙනු ඇත. මෙහි දී අපට හමු වූ එක් තැනැත්තෙක් ඔහු සතු මුළු ඉඩම් ප්‍රමාණයේ ම සහනාධාර බලාපොරොත්තුවෙන් කුරක්කන් සිටුවා, ඊට පසු පැමිණි නියඟය නිසා පැල වියළී යාමෙන් මහත් අලාභයකට මුහුණ පෑවේ ය. මෙහි දී පැල නොමිලේ දීම ද අනවශ්‍ය කාරණයකි. මන්ද බොහෝ වැවිලි කරුවෝ ඔවුන් ගේ අරිත් පැල ඔවුන් විසින් ම නැතහොත් ඒ අසලින් ම ලබා ගන්නා බැවිනි. අරිත් පැල ලබා ගැනීම සඳහා සහනාධාරයෙන් නිර්දේශ කරන රජයේ ගොවිපලකට බොහෝ දුර ගමන් කිරීම එබැවින් අනවශ්‍ය හිරිහැරයකි. මෙහි දී විශාල පරිමාණයෙන් නැවත වගා කිරීම සුළු නිෂ්පාදකයාට පහසු නොවන්නා සේම, සහනාධාර නැති වීම, එසේ නැතහොත් වෙනත් හේතුවක් නිසා ළපටි පැල මිය යාම, වර්ෂ තුන හතරක් ආදායමක් සඳහා බලා සිටීම යනාදී කරුණු නිසා මේ තත්වය තවත් දරුණු වනු ඇත.

සහනාධාරය බෙදීමේ දී එය කෙතරම් සාධාරණව බෙදී ගියේ දැයි සලකා බැලීමට හොඳම නිදසුනක් ඇත. බොහෝ විට සහනාධාර අයදුම්කරුවන්, විශේෂයෙන් සහනාධාර ලබා ගත් අයදුම් කරුවන් සාමාන්‍ය කුරක්කන් වගාවක් හිමි අයෙකුට වඩා ඉඩම් ප්‍රමාණයක හිමිකම් ඇත්තෝ වූහ. මේ හැරුණු විට සහනාධාර ලැබූ හා නොලැබූ අයදුම්කරුවන් අතර විශාල සමාජ පරතර යක් ද දක්නට ලැබේ. සියලු ම අයදුම්කරුවන් කුඩා ගොවීන්, කම්කරුවන් හා මුරකරුවන් ගෙන් යුත් සාමාන්‍ය පංතියේ හෝ ගුරුවරු, ව්‍යාපාරිකයෝ හා වෙනත් රජයේ සේවකයින් ගෙන් යුත් මධ්‍යම පංතියේ හෝ අය වූහ. මෙහි දී මධ්‍යම පංතිය බොහෝ විට (විශේෂයෙන් මුදල් සහනාධාරය ද ඇතුළු) සහනාධාර ලබා ගැනීමේ සුදුස්සෝ වූහ. මධ්‍යම පංතිකයන් සියලු දෙනාගේම රැකියා නිසා ගමින් පිට, වෙනත් රැකියාවල නියුතු වූවන් අතර නිරන්තර බැඳීම් ඇති වේ. එබැවින් මේ පංතිකයින්ට මෙම බැඳීම් ද ඊට අමතරව ඔවුන් ගේ අධ්‍යාපනය හා සංස්කෘතික රටාව නිසා ද අයදුම් පත් සම්බන්ධයෙන් ප්‍රතිඵලයක් ලැබෙන ක්‍රමයක් සකස් කර ගත හැකි වෙයි.

මෙවැනි තත්වයක් යටතේ ඕනෑම සහනාධාරයක් දූෂණයට ලක් විය හැකි ය. කෙසේ වුව ද, මෙහි දී කිසිම දෙනෙකු ගෙන් ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධයෙන් චෝදනාවක් ඉදිරිපත් නොවීම පැසසිය යුත්තකි. එසේ වුව ද, 'සමූපකාරය' යන වචනයේ මුවාවෙන් කුඩා පැල තවානක් ද, අයදුම් පත් ඉදිරිපත් කිරීමේ හා බෙදා හැරීමේ ආයතනයත් ද, මගින් සුළු මුදලක් අයුතු ලෙස ලබා ගත් අයෙකු අපට හමු විනි.

මේ අනුව අප ගේ අවසන් නිගමනය වන්නේ මෙම සහනාධාර මගින් බලාපොරොත්තු වූ අරමුණු ඉටු නොවුණු වගයි. මෙහි දී සහනාධාර දෙන හෝ ලැබෙන බව හෝ නාමිකව පල කිරීම හා

ඇත්තවශයෙන් ම ලැබෙන කාලයන් අතර ඇති දිගු කාල පමාව නිසා බොහෝ කුරුඳු වැවිලි කරුවන් නැවත පැල සිටුවීමේ කාර්යය නොකරති. එහෙත් සහනාධාර කිසිසේත් නොලැබේ නම් වැවිලි කරුවා කෙසේ හෝ මුදල් ආයෝජනය කොට තම කාර්යය කර ගනිතැයි සිතිය හැකි ය.

සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක වීම සම්බන්ධව විශේෂ කරුණු දෙකක් පැහැදිලි වේ. ඉන් පළමු වැන්න ලෙස පෙනී යන්නේ දැනට තිබෙන ප්‍රතිපත්ති යටතේ නම් මීට වඩා ක්‍රමවත් සහනාධාර කිසිසේත් බලාපොරොත්තු නොවිය හැකි බව යි. මේ හැරුණු විට දැනට කුරුඳු කර්මාන්තයේ තිබෙන ගැටළු නිසා අඩු හා විචල්‍ය මිළ ගණන් ලැබෙතැයි සිතන්නසු සහනාධාර ක්‍රමය සම්පූර්ණ යෙන් අත් හැරීමට එකඟ වනු ඇත. කෙසේ වුව ද, කෙතරම් විකෘති හා පක්ෂපාතිත්වයන් තිබුණ ද, ඒවාට වැය වන සියළු ම පිරිවැය ද, ළඟා විය හැකි ඉලක්කයක් තිබුනේ නම් දරා ගත හැකි වනු ඇත. එහෙත් මෙහි දී රජයේ සේවකයන් ද, ගොවීන් ද අතර තිබුනේ විවිධ පරමාර්ථයන් දෙකකි. ගොවීහු ශුද්ධ වාසිය සඳහා නොවූ අලුත් පැල සැපයීම වැනි දුර්වලතා තිබුණ ද පොදුවේ සහනාධාර ක්‍රමයට පක්ෂපාතී වූහ. ඔවුන් ගේ අදහසට අනුව සහනාධාර ක්‍රමය සාර්ථක නොවුනේ නිලධාරීන් ගේ අකාර්යක්ෂමතා වය, උදාසීන භාවය ආදී නොයෙකුත් හේතූන් මත ය. ඔවුන් ගේ මතය යහපත් සේවකයන් සමඟ ම ප්‍රතිඵලය වෙනස් වන බව යි. කෙසේ වුව ද, තේ, රබර්, පොල් සඳහා පමණක් නොව, කුරුඳු සඳහා ද ආධාර අවශ්‍ය බව ඔවුහු පිළිගත්හ.

රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන නිලධාරීන් මෙම ප්‍රතිපත්තියෙහි ඇති දූෂණ හා ගැටළු මහජන යාට වඩා හොඳින් දැන සිටිති. එහෙත් ඔවුන් මෙම සහනාධාර ක්‍රමය අනවශ්‍ය බව පළ නො කරන්නේ එය ඔවුන් තම රැකියාවන් ද අනවශ්‍ය බව කීමක් වැනි දැයක් නිසා ය. කෙසේ වුව ද, සාමාන්‍ය මානුෂික චිත්තයට අනුව ඕනෑම අයෙක් යම්කිසි කාර්යයක් හරිහැටි ඉෂ්ට වනු දැක්ම ප්‍රිය කරති. එහෙත් රජයේ සේවකයා 'හොඳින් සිය කාර්යය නිම කිරීම' යන්නෙන් අදහස් කරන්නේ 'හොඳින් අධීක්ෂණය කිරීම' යන්න පමණක් බව පහත දැක්වෙන ඔවුන් ගේ නිගමනයෙන් පෙනේ. 'ගොවීහු නැවත වගා කිරීම නිසි ලෙස නොකරති. මේ නිසා අප විසින් කළයුත්තේ ඔවුන් ගේ කටයුතු මීට වඩා හොඳින් අධීක්ෂණය කොට, මීට වඩා වැඩි වාර ගණනකින් ආධාර මුදල ඔවුනට ලබා ගැනීමට සැලැස්වීම යි'. මෙහි දී මොවුන් ගේ සාමාන්‍ය අදහස මෙසේ වී නම්, වියවුල් සහිත ප්‍රතිපත්ති හා ගැටළුවලට තුඩු දෙන්නේ ද ඒවාම බව අමුතුවෙන් කිව යුතු නැත.

ඉහත දැක්වූ කරුණු අනුව කිසිම රජයේ සේවකයෙක් ඔවුන් ගේ දෙපාර්තමේන්තුවේ සහනාධාර සැලසුම් විවේචනය නොකරයි. එසේම අන් දෙපාර්තමේන්තුවල අය ද ඔවුන් ගේ දෙපාර්ත මේන්තු චර්යාවට අනුව ඒ කටයුතුවලට ඇඟිල් ගැසීමක් නොකරති. මේ නිසා සහනාධාර කෙසේ හෝ බල පැවැත් වේ. එසේම කුරුඳු සහනාධාර ද එසේම පවතින නමුත් (27) ඒ සඳහා අයදුම් කරන සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ වැටේ (28).

## 12. පෝර සැපයීම.

ඉහත දී සඳහන් කෙරුණු ආකාරයට බොහෝ රාජ්‍ය සේවකයන් තම ප්‍රතිපත්ති හා සැලසුම් පිළිවෙළකට සකස් කිරීම හා ඒවා නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එතරම් සැලකිල්ලක් නොදක්වති. මෙයට ඉතාම සුදුසුතම උදාහරණයක් සුළු අපනයන භෝග සඳහා පෝර සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පෝර සංස්ථාව හා සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව සපයයි (29). භෝග වගා නිර්දේශකයන් හා පස ගැන සැලකිල්ල යොමු කොට ඒ ඒ පෝර වර්ගයේ සාමාන්‍යයෙන් අඩංගු වන දේ සකස් කිරීම සාමාන්‍ය සිරිත යි. එහෙත් මේවායේ එකිනෙක අතර ඇත්තේ ඉතා මඳ වෙනස්කම් බවත්, ඊට අමතරව මේවා භාවිතයේ දී, ඇසිරි මේදී කලවම් වීම් ආදිය නිසා එම වෙනස ඉතාම අල්ප වන බවත් පැහැදිලි කරුණකි. එසේ ම විවිධ පෝර කොටස්වල ඇති විශිෂ්ඨ ගුරුත්වය අනුව පරිවහනයේ දී ඒවා බෑගයේ ස්ථර වශයෙන් තැන්පත් වන අතර, ඒ නිසාම වගාවන්ට යෙදීමේ දී, ඒවායේ සංයුතිය බොහෝ වෙනස් විය හැකි බවත් පෙනේ. සංස්ථාව පෝර වර්ග සියයකට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කළ ද එයින් වර්ග බොහොමයකට ඉතා කලාතුරකින් නිෂ්පාදනය කළයුතු තරම් වූ මඳ ඉල්ලුමකි, ඇත්තේ. මේ වර්ග එකිනෙකින් වෙනස් කරන ශිල්පීය ගුණිතයන් තිබුණ ද, ඒවා මිශ්‍ර කිරීම හා ප්‍රවාහනය කිරීමේ දී එම වෙනස්කම් බොහෝ දුරට අඩු වේ. මේ නිසා ඒ ඒ භෝගයන්ට ලැබිය යුතු විවිධ පෝර කොටස් නොලැබී යන්නා සේම, අලෙවිය හා ප්‍රවාහන කටයුතුවල දී අනුගමනය කළයුතු විවිධ රීතීන් නිසා ඒවා භාවිතය ද වඩාත් දුෂ්කර වේ. මේ නිසා පෝ'ර නිකුත් කිරීමේ ක්‍රමය මීට වඩා ප්‍රායෝගික විය යුතු ය. මෙයින් විශාල ලෙස පීඩා විඳින්නේ සුළු අපනයන භෝගයන් ය. පෝර වර්ග 16 ක් පෝර සංස්ථාව විසින් සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවට නිර්දේශ කර ඇත. ඒ අනුව සුළු අපනයන භෝග යටතේ ඇති අක්කර 50,000 ක් මේ පෝර භාවිතයෙන් සශ්‍රීක කිරීමට බලාපොරොත්තු වේ. මෙහි දී අක්කර 38,000 ක් කුරුඳු යටතේ ඇති අතර, එ සඳහා පෝර වර්ග දෙකක්, අක්කර 14,000 කට එක වර්ගයක් සේ නිර්දේශ කර ඇත. මේ අනුව අනෙකුත් සුළු අපනයන භෝග සෑම වර්ගයකම අක්කර 850 කට එක වර්ගය බැගින් නිර්දේශිත පෝර ඇත. මෙය වඩාත් විසිතුරු වන්නේ තේ සඳහා අක්කර 26,000 කට එක් වර්ගයක් ද, පොල් සඳහා අක්කර 58,000 කට එක් වර්ගයක් ද, වී සඳහා අක්කර 1,18,000 කට එක් වර්ගයක් ද ලෙස මීට හාත්පසින් ම වෙනස් ආකාරයකට නිර්දේශ වී තිබීම යි.

මේ අනුව සළකන විට සමහර වැවිලි කරුවන් පොල් පෝර කුරුඳු සඳහා සාමාන්‍යයෙන් හෝ උසස් තත්වයෙන් හෝ යෝග්‍ය වන බව පල කිරීම විමතියට කරුණක් නොවේ. මේ වර්ග දෙකම වැලි සහිත පසේ වැඩෙන අතර පොටෑසියම් විශාල ප්‍රමාණයක් අවශ්‍ය වෙයි. මේ නිසා විශේෂ කුරුඳු පෝරක් අවශ්‍ය ද යන්න ප්‍රශ්නයකි. එසේ වුව ද මෙසේ විවිධ වර්ග රැසක් තිබීම විද්‍යාඥයින් ගේ මෙන් ම දෙපාර්තමේන්තුවේ ද සන්තුෂ්ටියට හේතු වෙයි. තේ හා රබර් වල මෙන් ම පොල්වලට ද විශේෂයෙන් සම්බන්ධීකරණ නිලධාරීන් ද, එයට විශේෂ වූ පෝර වර්ග ද බෙදා හැරීමේ ක්‍රමයක් ද තිබේ. මේ නිසා සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව ද සිය කාර්යයන් ගෙන් වැඩි හරියක් සංකේන්ද්‍රණය වූ කුරුඳු කෙරෙ ද, එවැනිම

පිළිවෙතක් අනුගමනය කිරීම යෙහෙකැයි සිතන්නට ඇත. මේ නිසාම කුරුඳු පෝර ලබා ගත හැකි වෙළඳ සැල් සුළු ප්‍රමාණයක් ද, විශාල නගරවල දක්නට ලැබේ. එසේ වුව ද, වී සඳහා පෝර ගබඩා කිරීම හා බෙදා හැරීමේ කටයුතුවල යෙදෙන විවිධ සේවා සමූපකාර සමිති කුරුඳු පෝර බෙදා හැරීම ප්‍රතික්ෂේප කර ඇත. ඊට හේතුව ඒවාට ඇති ඉල්ලුම සුළු වීමත්, බෙදා හැරීම එක්තරා කාල සීමාවකට සීමා නොවීමත්, නිසා විකිණීමට නොහැකිව විනාශ වී අපතේ යන තොග ප්‍රමාණයන් සමූපකාර සමිති වෙත ඉතිරි වෙතැයි යන අනියත බියක් ඇති බැවිනි. මේ නිසා කුරුඳු පෝර අලෙවිය නගරබද වෙළෙඳුන් කිහිප දෙනෙකු විසින් පමණක් කරනු ලබන අතර, ඒවා ලබා ගැනීම ද කළ හැක්කේ ඉහත දැක් වූ පරිදි විශාල කුරුඳු වතු හිමියන්ට පමණි. ඒ අයට ලොරියක් කුලියට ගැනීමෙන් පෝර ප්‍රවාහනය කර ගත හැකි වුව ද, කුඩා වතු හිමියන්ට පෝර බෑගයක් දෙකක් ගැනීමට අධික වියදමක් හා කාලයක් ගෙවීම එතරම් ඵලදායී නොවේ. මෙතැන්හි දී සුළු අපනයන භෝග සඳහා පෝර ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථාන කිහිපයක් ඒ සඳහා ඉල්ලුමක් ඇති තැන්වල පිහිටුවීමට රජය විසින් කර ඇති යෝජනාව පැසසුම් කටයුතු ය. එසේ වුව ද, මෙහි ආර්ථික අංශයෙන් සාධාරණ බවක් නො පෙනේ. මේ බෙදා හැරීමේ ව්‍යුහය සෑම කුරුඳු වගාවකටම පෝර ලැ බෙන සේ තිවූ වුව ද ඒවායින් ලැබෙන ආන්තික වාසිය ඉතා සුළු බැවින් බෙදා හැරීමේ මධ්‍යස්ථානයන් ද පාඩු ලබන ආයතන බවට පත් වනු ඇත. ඒ නිසා මෙහි දී කළ හැකි ඉතාම සාර්ථක කාර්යය කෙසේ හෝ විවිධ සේවා සමූපකාර සමිති මාර්ගයෙන් ම මේ කාර්යය කිරීම යි. ඒවාට විශාල බෙදා හැරමේ මධ්‍යස්ථාන රටාවක් ඇති බැවින් පාරිභෝගිකයා කරා පහසුවෙන් ම ළඟා විය හැකි ය. මේ සඳහා පාඩු රක්ෂණ ක්‍රමයක් වැනි දෙයක් ඇති කිරමෙන් මොවුන් මේ සඳහා පොළඹවා ගත හැකි ය. පෝර බෙදා හැරීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් නව ක්‍රමයක් යෝජනා කිරීමට පෙර කුරුඳු පෝර මේ භෝගය සඳහා වැඩ දායක ද යන්න සොයා බැලිය යුතුව ඇත. අනෙකුත් සියළු ම පෝර ද්‍රව්‍ය මෙන් කුරුඳු පෝර ද රජය විසින් සහනාධාර මිළකට අලෙවි කෙරේ. කුරුඳු පෝර මිළ සාමාන්‍යයෙන් නිෂ්පාදනය වියදමින් 50% කට සමාන වේ. මෙහි දී මේ සහනාධාරයෙන් සමස්ථ වශයෙන් ජාතියම යහපත් ප්‍රතිඵලයක් ලබයි ද යන ප්‍රශ්නය නැඟේ. 2 වැනි උප ග්‍රන්ථය අනුව මෙය එතරම් වැඩදායක නොවන බව පෙනේ.

මේ අනුව කුරුඳු වගාව සඳහා යොදු පෝර හා ශ්‍රමය ඒවායේ මිලය හා ඒ අනුව වූ සත්‍ය මිළ හා සළකන කල්හි ඒවා යෙදීමෙන් ලැබූ අමතර ලාභය, ඒ සඳහා වැය වූ මුදලට වඩා මඳ කින් වැඩි වන්නේ. දෙවනුව වැඩියෙන් වගා කෙරුණු කුරුඳු ප්‍රමාණයට ජාත්‍යන්තර වෙළෙඳ පොලවල ලැ බෙන වැඩි මිළ ගණන් ජාතියේ අංශයෙන් බලන විට අඩු වටිනාකමක් ගෙන දේ. ඊට හේතුව වැඩි ඵලදාව නිසා සැපයුම ඉහළ ගොස් අඩු මිළ ගණන් ඇති මඟ බව යි. 2 වන උප ග්‍රන්ථයේ දක්වා ඇති අදහස් වලින් අවසාන නිගමනයන්ට එළඹිය නොහැක. පෝර යෙදීම පිළිබඳ ආන්තික ප්‍රතිඵල ගණනය කර ඇති ක්‍රමය සාර්ථක නොවේ. එසේම දත්ත මූලාශ්‍රයන් ද ඉතා සුළු බැවින් ඒ තීරණ සාධාරණ වන්නේ සුළු නිෂ්පාදකයින්ට පමණි. මේ කරුණු අනුව සළ කන විට වතු වගා අංශය මේ සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිඵල ලබන බව පෙනේ. ක්‍රමවත් ලෙස පෝර යනාදී මූල ද්‍රව්‍ය ලබා දී නියමිත කාල සීමාවක පළපුරුදු තැලුම්කරුවන් ලවා තැලවීම විශාල වතු හිමියන් සාර්ථකව කරති. කෙටියෙන් කිවහොත් කුරුඳු වගාවන්ට පෝර යෙදීම

යෙදීම සම්බන්ධයෙන් සුළු නිෂ්පාදකයින් උනන්දු කිරීම එතරම් ඵලදායී නොවන බව පෙනේ. කෙසේ වුව ද, පෝර යෙදීමේ ආන්තික ප්‍රතිඵල සැක සහිත ය. එසේම පෝර ලැබෙන්නේ ද විශාල වතු හිමි සුළු ධනවතුන් කොටසකට හෝ වගාවන්ට පමණි. කෙසේ වුව ද, මේ පෝර යෙදීමෙන් ප්‍රමාණය මිස වර්ගයේ වෙනසක් නොවන නිසා බොහෝ දෙනා ගේ අදහසූ පෝර යෙදීමෙන් බාල වර්ගයේ කුරුඳු විශාල ප්‍රමාණයක් ලැබෙන බව යි. බට්පොල සමීක්ෂණ යෙන් ද, මේ තොරතුරු හෙළි කරයි.

කුරුඳු පෝර සහනාධාරයෙන් ප්‍රතිඵල ලබන්නේ විදේශික ගැනුම් කරුවන් මිස දේශීය නිෂ්පාදක යින් නොවේ. මෙවැනි ප්‍රශ්නයන් පැන නඟින්නේ ද කුරුඳු ලංකාවේ ස්ථාවර, ලංකාව විසින් පාලනය කරන ජාත්‍යන්තර වෙළඳ පලක් ඇති භාණ්ඩයක් බැවිනි. මෙවැනි ප්‍රශ්න සෑම භෝග යකටම පොදු නැත. මෙහි දී කුරුඳු පෝර නිකුත් කළයුතු ද යන්න රජයටත් ගැටළුවක් වී තිබීම ප්‍රධාන විශේෂයකි. මෙහි දී බැස ගත හැකි අවසාන ප්‍රධාන නිගමනය වනුයේ පෝර නිකුත් කිරීම, මිළ ආදිය මෙම කර්මාන්තයට අදාළ සුළු ප්‍රශ්න බැවින් මුලින් මෙහි මූලික ගැටළු වලට අවධානය යොමු කළයුතු බව යි.

## 13. අවම මට්ටම් මිළ ප්‍රතිපත්තිය.

1974 අග භාගයේ සිට වාණිජ දෙපාර්තමේන්තුව අවම මට්ටම් මිළ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරයි. අවම මට්ටම් මිළ යනු කුරුඳු සඳහා නිර්යාතකයින් විසින් ගෙවිය හැකි අවම මිළ යි. එක් එක් වර්ගයේ කුරුඳු වෙනුවෙන් මේ මිළ ගණන් සති පතා වෙන් වෙන්ව සැකසෙයි. මුලින් මේ කාර්ය යන්ට අධීක්ෂණ කටයුතු කිරීමේ ක්‍රමයක් තිබුණ ද, දැන් එය ක්‍රමයෙන් තුරන් වී ගොස් ඇත. එකල අඩු මිළට බිල් පත්‍රිකා සකස් කිරීමේ වංචා සහගත ක්‍රමයක් තිබූ බැවින් නිර්යාතකයා සාමාන්‍යයෙන් ලබා ගත් වෙළඳ පල මිළට වඩා අඩු මුදලක් දක්වා බිල්පත් නිකුත් කිරීම කෙරුණි. මේ අතිරික්තයෙන් කොටසක් ඔහු ගේ නමට හෝ ඔහු වෙනුවෙන් ඇති පිටරට බැංකුවක තැන්පත් වේ. කුරුඳුවල දී මෙය වඩාත් පහසු වන්නේ නිර්යාත ගිවිසුම් තේ හා රබර් වැනි දේවල මෙන් ප්‍රසිද්ධ වෙන්දේසි මඟින් විනිමය පාලන බලධාරීන්ට දැන ගැනීමක් කළ නොහැකි පුද්ගලික ගිවිසුම් වන බැවිනි. අවම මට්ටම් මිළ ක්‍රමය යටතේ මිළ තීරණය කරනු ලබන්නේ කුරුඳු වෙළඳ පලට ඇතුළු වන අවස්ථාවේ දී එවාට තිබූ මිළ ය. එහෙත් පැරණි විනිමය අනුපාතික වෙනස් වීමේ දී ගණක කටයුතු නිසා වෙනස් වුනු මිළ ප්‍රමාණයක් හැරුණු විට මිළ වෙනස් වී ඇත්තේ මඳ වශයෙනි. අවම මට්ටම් මිළ ක්‍රමයේ දී සාධාරණ මිළක් ලබා දීමට අමතරව වර්ගයෙන් බාල කුරුඳු වෙළඳ පලට ඇඳී ඒම වැළැක්වීමටත් නිර්යාතකයින්ට කොන්ත්‍රාත්තු දිනා ගැනීම පිණිස කුරුඳු අසීමිත මිළ වැඩිවීම් සීමා කිරීමටත් අපේක්ෂා කෙරුණි. එහෙත් මෙයින් සිදු වන්නේ අවම මිළ අවශ්‍ය තරමට වඩා පහත වැටීම වැළැක්වීම පමණි. කෙසේ වුව ද, මෙය පොදුවේ මිළ ගණන් ඉහළ නැංවීමටත් වර්ගයෙන් බාල භාණ්ඩයන්හි මිළ වෙනස් වීම් මඟින් ඉල්ලුම වඩා හොඳ වර්ග දෙසට හැරවීමත් කරන අභි ප්‍රායයක් ලෙස ද හැඳින් විය හැකි ය. මෙතෙක් නිර්යාත මිළ ගණන් අවම මට්ටම් මිළට සමාන විය. එහෙත් මේ ක්‍රමය තවදුරටත් කරන්නේ දැනට තිබෙන මිළ ගණන්මතහවුරු කිරීම පමණි.

ශ්‍රී ලංකාව හොඳම කුරුඳු නිෂ්පාදනය කරන එකම රට ද, කැසියා/කුරුඳු වෙළඳපලේ ප්‍රධානතම දායකයෙක් ද (4 වැනි කොටස) වන බැවින් ජාත්‍යන්තර වෙළඳ පල ද මේ අවම මිලෙහි බලපෑම් ලබනු ඇත. මේ ක්‍රමය දිගටම ක්‍රියාත්මක වීමට ඉඩ දුනහොත් විවෘත වෙළඳ පල යටතේ මිළ තීරණයන් ගැනීම වඩාත් අසීරු වනු ඇත. එහෙත් දැනටම නිදහස් වෙළඳ පල විනාශ වෙමින් පවතී. මෙවැනි කරුණු අනුව අවම මට්ටම් මිළ එකම සීමාවක රැඳී සිටින්නට නම් එය සකස් කළයුතු ආකාරය පිළිබඳව කිසිම සඳහනක් නැත. මේ හේතුවෙන් මිළ තීරණය කරන්නවුන් ස්ථාවර මිළ ප්‍රතිපත්තියක් පිළිබඳව විශේෂ අවධානය යොමු කළයුතු ය.

## 14. රාජ්‍ය වාණිජ්‍යය.

මෙක්සිකෝව හා ශ්‍රී ලංකාව අතර 1975 දී අත්සන් කෙරුණු වෙළඳ ගිවිසුම නිසා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ඒකාබද්ධ අපනයන සංස්ථාව ශ්‍රී ලංකාවේ එකම කුරුඳු නිර්යාතකයා බවට පත් විය.

එහෙත් මේ සංස්ථාව කුරුඳු වෙළෙන්දන් අතර ජනප්‍රිය නැත. මේ මගින් පුද්ගලික නිර්යාතකයින් ගේ වෙළඳ කාර්යයන් රැසක් ක්‍රියාත්මක කෙරෙන අතර, ඊට පසුව නිර්යාතකයින් ගේ ලාභ අධික වීමට පටන් ගෙන ඇත. මේ සම්බන්ධයෙන් එල්ල වී ඇති චෝදනා දෙකකි. එක් කරුණක් නම් උක්ත සංස්ථාවට මිළ දී ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැති වීම යි. නැවක් පැමිණි විගස මිළ දී කිරීම් කරන අතර ඊට පසු අධික මිළ විචලතාවයන්ට ප්‍රවනතා සලස්වමින් වෙළඳ පලින් ඉවත් වේ. අනික් කරුණ නම් එය බාල කුරුඳු මිළ දී ගෙන මෙක්සිකෝවට අලෙවි කිරීම යි. ක්‍රියාත්මක කිරීමේ දී අසීරු කරුණු රැසක් මතය ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (ඒකාබද්ධ අපනයන) සංස්ථාවට ක්‍රියා කිරීමට වී ඇත්තේ. ලියා අනුමත කර ගන්නා ලද ගුණාංග හා මිළ ගණන් මත කුරුඳු මිළ දී ගැනීම අසීරු ය. නිතරම අලෙවි කරන්නේ තත්වයෙන් බාල කුරුඳුවලට හොඳ මිළක් අපේක්ෂා වෙන් නියම ප්‍රමාණයට වඩා 'පුන් බුන් දමා' නැතහොත් හොඳින් නොවේලා වැඩි බර ප්‍රමාණයක් ලැබෙන ලෙස යි. මෙහි දී පුද්ගලික ගැනුම් කරුවෝ වඩාත් විචක්ෂණශීලි වෙත්. ඒ හැරුණු විට සංස්ථාවේ නොයෙකුත් දූෂණ ද නිෂ්පාදකයින් ගේ හොඳ හිත පලුදු කිරීමට හේතු වී. මේ හේතුවෙන් ඔවුන්ට ලබා ගැනීමට වන්නේ වර්ගයෙන් බාල කුරුඳු පමණි.

### නිෂ්පාදකයින් ගේ ඉල්ලීම්.

කුරුඳු කර්මාන්තය වෙනුවෙන් රජයෙන් ඉටු විය යුතු සේවය ගැන විමසන ලදුව, බොහෝ නිෂ්පාදකයින් ගේ ඉල්ලීම වූයේ පහසුවෙන් ලබා ගැනීමට හැකි වන පරිදි අඩු මිළට පෝර සපයන ලෙස යි. නැවත වගා කිරීම පුනරුත්ථාපනය සඳහා දැනට දෙනු ලබන සහනාධාරය ප්‍රමාණවත් නොවන බැවින් එය ඉහළ මට්ටමකට ගෙන ආ යුතු බව ඔවුන් ගේ මතය විය. කුරුඳු ස්ථාවර ප්‍රසිද්ධ කරන ලද මිළකට මිළ දී ගැනීම් කරන රාජ්‍ය අංශයේ මිළ දී ගැනීමේ මධ්‍යස්ථාන ඇති කිරීමෙන් පුද්ගලික වෙළෙඳුන් ගේ දූෂණ මැඩ පැවැත් විය හැකි යයි ඔවුන් විශ්වාස කරති. මෙය

නොතෙක් දුරට නිවැරදි දැයි කිව නොහැකි නමුත් මිළ විචල්‍යතාවයන් පිළිබඳව චෝදනා නැගෙනුයේ වෙළෙන්දන් වෙත ය. සාධාරණ මිළ ගණන් හා විචල්‍ය මිළ ගණන් සැසඳීම සාමාන්‍ය සිරිතකි.

නමුත් රාජ්‍ය අංශයෙන් තීරණය කළ මිළකට හෝ පාලන මිළකට අලෙවි කරනු ලබන භාණ්ඩ රැසක් ඇති ආර්ථිකයක මෙය සාමාන්‍ය සිද්ධියකි. මේ ක්‍රමයේ දී විචල්‍ය මිළ ගණන් සම්බන්ධයෙන් වෙළෙන්දන් චෝදනා ලබන නමුත් වෙනත් රටක දී හෝ සමාජයක දී එය ඉතා සාර්ථක තරඟකාරී වෙළෙඳ පලක් වෙයි (30). මොවුන් ගේ මේ මිළ දී ගැනීමේ ඒකක රබර් නිෂ්පාදකයින් ගේ රබර් මිළ දී ගැනීමේ මධ්‍යස්ථානවලට බොහෝ දුරට සමාන වේ. කෙසේ වුව ද, රාජ්‍ය අංශය කුරුඳු මිළයට ගැනීමේ දී වැලැක් විය නොහැකි විශේෂ බාධකයන් ඇත. ඒ තත්ව පාලන කාර්ය යි. රබර් රාජ්‍ය අංශය මිළ දී ගැනීම් වල දී ද නොයෙක් අක්‍රමිකතා හා දූෂණ වලට ලක් වෙයි. එසේ වුව ද, ගුණාංග මෙසේ පැවතිය යුතු යයි දැක්වීමේ අසීරුතාවය මත මේ ප්‍රශ්නය තවත් තීව්‍ර වේ. මේ අනුව බලන විට රාජ්‍ය අංශයේ මිළ දී ගැනීම්වල ද වර්ගය ගැන වඩා උනන්දු වීම හෝ තත්ව පාලනය ගැන සමස්ථයක් ලෙස කටයුතු කිරීම දුෂ්කර බව පෙනේ.

සාමාන්‍යයෙන් නිෂ්පාදකයින් අතර පැතිරී ඇති මතයකි, වර්තමාන පොදු ගැලවීමේ තත්වය අතීතයට වඩා තත්වයෙන් පහළ බව. මේ තත්වය නිෂ්පාදකයින්ට වඩා බැරෑරුම් ලෙස පෙන්වා දෙන්නේ දේශපාලකයෝ ය. ඔවුන් ඒ මුවාවෙන් රජය මගින් පාලනය වන මිළ දී ගැනීමේ ආයතන පිහිටුවා ඒ මගින් කුරුඳු කර්මාන්තයේ නියුතු සමහර අයට රැකියා ලබා දීමට අපේක්ෂා කරති. එහෙත් මෙවන් වැඩ පිළිවෙළක් එලදායී වේ ද යන්න සැකයකි. මේ දුර්වල පොතු ගැලවීම පිළිබඳ චෝදනා ලැබෙන්නේ දකුණේ ප්‍රධාන කුරුඳු නිෂ්පාදන ප්‍රදේශයෙන් මිස, ඉතා හොඳ වර්ගයේ කුරුඳු නිෂ්පාදනය වන කොළඹට උතුරින් පිහිටි ප්‍රදේශයෙන් නොවේ. මේ අනුව මේ සියල්ලම හේතුව දකුණේ සාමාන්‍ය කුරුඳු තලන්නන් ගේ පහත් ආදායම් මට්ටම් ය. ඊට වඩා වැඩි ආදායමක් කොළඹට උතුරින් පිහිටි පෙදෙසේ කුරුඳු තලන අයට ලැබෙන නිසාත් ය. ඒ නිසා කුරුඳු තලන්නන් පුහුණු කිරීමක් වැනි දෙයක් දකුණේ ආරම්භ කිරීම ව්‍යාධියට පිළියමක් නොව, මතු පිට පිස දැමීමක් පමණක් වේ.

දේශපාලන වාතාවරණය.

කුරුඳු කර්මාන්තය පිළිබඳ මෙසේ විසිරී ගිය අදහස් රැසකින් වුව ද, එක්තරා නීතියක් සකස් වීමට පසුබිම් ව අවශ්‍යතා, වටිනාකම්, පිළිගැනීම් හා ආකල්ප ආදිය මනාව ප්‍රත්‍යක්ෂ වේ.

මූලික වශයෙන් කුරුඳු වගාවේ නියැළුනු අයට හා එක්තරා ආකාරයක ආධාරයක් ලෙස රජය මගින් 'කුමක් හෝ කළයුතු ය' යන මතය පිළිගන්නා අය වෙති. මෙය මෙම කර්මාන්තය වර්ධනය කිරීමේ ආකල්පයන්ට හාත්පසින් ම වෙනස් වෙයි. මේ පරමාර්ථයන් එකිනෙකට හරස් නොවුන ද, එකිනෙක ගැලපීමක් සිදු නොවේ. මෙහි දී යම් කර්මාන්තයක දිගු කාලීන වර්ධන

ප්‍රවණතාවයක් නොමැත්තේ නම්, ඔවුනට වෙත කර්මාන්තයකට එක් වනු ඉඩ නොදී මේ කර්මාන්ත යේම රඳවා තබා ගැනීම සාධාරණ නොවේ. එහෙත් සෑම වගාවන්ට හා (මිනිසුන්ට ද) සමාන ධර්මතාවයකින් සැළකිය යුතුය යන්නේ දී මෙවැනි දැයක් අසාධාරණ සේ හැඟෙයි.

මෙහි දී දෙවැනි කොටසේ දැක් වුනු පරිදි 'මා කුරුඳු වැවෙන බිමක උපත ලබා ගැනීම නිසාම දුක් විඳිය යුතු ද' යන හැඟීම, ඒ ඒ වගාවන් සඳහා වෙන් වුනු රාජ්‍ය දෙපාර්තමේන්තු ව්‍යුහය මගින් තවත් ප්‍රබල කරනු ලබයි. ඒ ඒ ආයතනය එක් විශේෂිත භෝගයක, සංවර්ධන නැවත වගා කිරීම, අපනයන වගාවන් සඳහා සහනාධාර, පර්යේෂණ හා පෝර සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. මේ අනුව ප්‍රධාන නිර්යාත භෝග වන තේ, පොල්, රබර් සඳහා විශේෂ දෙපාර්තමේන්තු වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විශේෂයෙන් වී ගැන අවධානය යොමු කරයි. සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව ද විශේෂිත අපනයන කීපයක් අවධානයට ලක් කරයි. මෙහි දී නිෂ්පාදකයන් පමණක් නොව, ඒ ඒ අංශයන් ද සෑම භෝගයකට සමානව සැලකීම පිළිබඳ අදහස් පළ කරයි.

ස්වකීය තනි කැමැත්තට අනුව ද, දෙපාර්තමේන්තු ආයුධයක් ලෙස ද, කටයුතු කරන රාජ්‍ය සේවකයින් ගෙන් දැනට පවතින අවධානයන් සැලසුම් හා නීති රීති ආදියෙන් සිය දෙපාර්තමේන්තු සම්පූර්ණ කර ගනිති. එහෙත් ඒවා ක්‍රියාත්මක කිරීමේ දී දෙපාර්තමේන්තුවට වුව ද, ලැබෙන්නේ මඳ දිරි ගැන්වීමකි. අළුත් යෝජනා ඉදිරිපත් කිරීමේ දී හා තිබෙන සැලසුම් පුනරීක්ෂණය කිරීමේදී මහජන උද්ඝෝෂණ ගැන සලකා බැලුව ද, සම්පූර්ණයෙන් ආධාර ක්‍රමයක් නැවැත්වීම පිළිබඳ උද්ඝෝෂණයකට නම් තීරණයන් ගත් අවස්ථා විරලය.

මෙහි දී රාජ්‍ය අංශයේ එක්තරා කොටසක නැතහොත් භෝගයක සංවර්ධනයේ දී බොහෝ අණ්ඩුවේ දෙපාර්තමේන්තු එකතු වීම වැලැක් විය නොහැකි ය. එහි ප්‍රතිඵලය එක එක දෙපාර්තමේන්තුවට අදාළ දෘෂ්ටි කෝණයන් ගෙන් බැලූ විට ලැබෙන ඛණ්ඩ වූ අදහස් රැසකි. එහෙත් මේ අදහස් රැසට ඇත්තවශයෙන් ම නිෂ්පාදකයින් ගේ වැදගත් ම වූ ප්‍රශ්න හෝ ගැටළු අඩංගු නොවේ. කුරුඳු කර්මාන්තයේ දී විශේෂිත අවධානය මීළ ව්‍යුහය හා විචලතා වෙත යොමු විය යුතු ය. මෙය කුරුඳු සම්බන්ධ වූ එකම දෙපාර්තමේන්තුවකටවත් අදාළ නොවූ ප්‍රශ්නයකි. ඒවා ඔවුන්ට විශේෂිත වූ සැලසුම් එනම්, නැවත වගා කිරීමේ සහනාධාර නැතහොත් පෝර ගබඩා යනාදී ලෙස ගැටළුවලට මූලික දේවල් සම්බන්ධයෙන් අවධානය යොමු කරනු හැර ගැටළු ගැන සළකා බැලීම අමතක කරයි.

නිෂ්පාදකයින් වෙත යොමු කරන සහනාධාරයන් හි දී හෝ නැතහොත් වෙන යම් ක්‍රමයක ආධාරයක දී ඒවා අඛණ්ඩ විය යුතු බවත්, නැතහොත් වර්ධන විය යුතු බවත් වැදගත් වේ. නිෂ්පාදකයා සහනාධාරයෙන් වාසි අපේක්ෂා කරන්නා සේම, සාධාරණ වූ අදහසකි, මෙය. කෙසේ වුව ද, සහනාධාර පාලනය පිළිබඳ ක්‍රියාකාරී පරීක්ෂාවක් මොවුන් ගෙන් ඉටු නොවේ. ණය අයදුම් පත් ඉදිරිපත් කොට ණය නොලැබූ බොහෝ අයදුම්කරුවන් මේ සහනාධාර පාලනය ගැන කළකිරුණු ස්වභාවයක් පළ කළහ. බොහෝ විට මේ විවේචනයන් ඒ ඒ නිලධාරීන් වෙත එල්ල

විනි. මෙහි දී පොදුවේ සිතා ගත හැක්කේ වඩා කාර්යක්ෂම අවංක නිලධාරීන් පත් කිරීමෙන් මේ තත්වය මග හැරෙන බව යි. එහෙත් අප ගේ නිගමනය වන්නේ එය සහකාධාර ක්‍රමයේ වරදවල් නිසා ඇති වන්නක් මිස නිලධාරීන් ගේ දූෂණ මේ බාධකයන්ට හේතුවක් නොවන බව යි.

දේශපාලන වාතාවරණයට අමතරව ඇති රාජ්‍ය අංශයේ බලපෑම් හා මතිමතාන්තර ගුහත දක්වන ලදී. මේ හැරුණු විට ඍජු වශයෙන් හඳුනා ගත හැකි නොයෙකුත් බලපෑම් ද මේ නීති රීති වලට බලපා ඇති බව නොරහසකි. කුරුඳු නිෂ්පාදකයින් බොහෝ විට අර්ධකාලීන හෝ කුඩා වතු හිමියන් වන බැවින් භූගෝලීය එක් රැස්වීමක් තිබුණ ද, දේශපාලන අංශයෙන් එබඳු එක් වීමක් දක්නට නොලැබේ. මේ කරුණු විශාල වතු හිමියන් හා වෙළෙන්දන් ගෙන් සමන්විත (බොහෝ විට මේ දෙපක්ෂයම එකම පිරිසකි) දේශපාලන බලපෑම් ඇති පිරිසක් අම්බලන්ගොඩ හා ඒ අවට ප්‍රදේශයට සීමා වී සිටීම සාක්ෂි දරයි. මේ අය ගේ ඉල්ලීම් වනුයේ කුරුඳු පලන්නන්ට සුහුඹුවක් ලබා දීම, ව්‍යාපාර බද්දෙන් නිදහස් කිරීම (31) වැනි බොහෝ කුඩා වතු හිමියන්ට ගෝචර නොවූ ඒවා ය. කෙසේ වුව ද, මේ බලගතු කණ්ඩායම්වලට ද කුරුඳු සඳහා යොදා ගෙන ඇති නීති රීති වෙතට එතරම් බලපෑමක් කළ නොහැකි විය. මෙහි දී පැහැදිලිව දක්වෙන්නේ සාමාන්‍ය දේශපාලන වාතාවරණ පමණි.

## 4 වන කොටස – රාජ්‍ය ප්‍රතිපත්තියේ බලපෑම්.

### 17. තොග එක් රැස් කිරීමක්.

අප ගේ විග්‍රහයන්ට අනුව මෙම කර්මාන්තය දියුණු කිරීමේ පියවර ගත යුත්තේ මිළ (මිළ ගණන් හා විචල්‍යතා) හා තත්ව පාලන අංග වලිනි. මිළ ගණන් ඉහළ නැංවීමට තුඩු දෙන ක්‍රියාවන් ද, වඩා සැලකිලිමත්ව නිර්දේශ කළයුතු අතර, එය ඉතා හදිසි කාර්යයක් නොවේ (4 වන කොටස). එසේ වුව ද, තත්ව පාලනය පිළිබඳ තීරණයන් ඉතා කඩිනමින් කළයුතු ය (8 වන කොටස). මෙහි දී තවමත් තීරණය නොවුනු ගැටළුව මිළ විචලතාවයන් ය. කතුවරයා දක්වන අන්දමට මේ ප්‍රශ්නය විසඳිය හැක්කේ තොග එක් රැස් කිරීමෙන් පමණි. මන්ද ජාත්‍යන්තර වෙළඳ පොළ හෝ නිෂ්පාදනය පාලනය කළ නොහැකි බැවිනි. මෙහි දී ප්‍රධාන අරමුණු දෙකක් ඉටු වේ. මුලින් ම මිළ ගණන් අඩු අවස්ථාවක මිළ දී ගෙන තොග රැස් කිරීමෙන් ඉල්ලුම වැඩි අවස්ථාවේ සිදු වන විශාල මිළ වෙනස්වීම් වලක්වා ලිය හැකි ය. දෙවනුව, තොග තිබෙන බැවින් ජාත්‍යන්තර වෙළඳ පොළ ඉල්ලුම පහසුවෙන් පිරිමසා ලිය හැකි ය. දැනට නිර්යාත ප්‍රමාණයන් හා මිළ විචලතාවයන් කෙතරම් තිබුණු ද, තිවහොත් සැපයුම මඳවීමේ හේතුවෙන් සමහර විට නිර්යාත ඇණවුම් හරවා යැවීමට ද සිදු වේ.

මෙහි දී තොග රැස් කිරීම ඉතා වටිනා අදහසක් සේ පෙනේ. එසේම මෙවැනි අදහසක් ඉදිරිපත් වූ පළමුවැනි අවස්ථාව ද මෙය නොවේ. එහෙත් මේ ලියන අවස්ථාව වන විට රජය සියලු අපනයන භෝග සඳහා තොග එක් රැස් කිරීම ආරම්භ කර තිබුණි. මෙහි දී කුරුඳු

ගැන විශේෂ අවධානයක් යොමු වන්නේ එය නිරන්තර මිල හා අපනයන ධාරිතාවේ විචලතාවයන්ට භාජනය වන නිසා හා විනාශ වීමක් නොවී කල් තබා ගත හැකි භෝගයක් බැවිනි. එසේ වුව ද, කුරුඳුවලට ඉහත සඳහන් අරමුණු සපුරා ලන අන්දමට තොග රැස් කිරීමක් කිරීම අසීරු වේ. කතුවරයා තොග එක් රැස් කිරීමේ ක්‍රමය පහත සඳහන් ආකාර විය යුතු යයි යෝජනා කරයි.

1. රජය හා සමුපකාරය යන ආයතන දෙකින් ම තොග අධීක්ෂණය කළයුතු ය.

2. සමුපකාරයට එයට එක් වීමට කැමති ඕනෑම වෙළෙන්දෙකුට එක් වීමේ පහසුව තිබිය යුතුය. එහෙත් ක්‍රියාත්මක අංශයේ දී මෙලෙස එක් වන්නේ තොග වෙළෙන්දන් හා නැව් ගත කරන්නන් පමණි.

3. තොගය සකස් කිරීම සඳහා මිල දී ගැනීම හා තොගයේ භාණ්ඩ අලෙවිය සමුපකාරය මගින් නොව, පුද්ගලයන් විසින් සිය අභිමතාර්ථයන් අනුව ඉටු විය යුතු ය.

4. සමුපකාර ගබඩාවන්හි ගබඩා කරන ලද කුරුඳු ප්‍රමාණයන් ඒ ඒ පුද්ගලයා ගේ නාමයෙන් ඔවුන් සතු වස්තුවක් ලෙස තිබිය යුතු ය. ඒ අනුව සාමාජිකයින්ට තම තොග කැමති ඕනෑම අවස්ථාවක මිල දී ගැනීම හෝ අලෙවි කළ හැකි වනු ඇත.

5. තොග රැස් කිරීමට ලැ බෙන දිරි ගැන්වීම විය යුත්තේ තොග ගබඩා කර තැබීම සඳහා දැරිය යුතු වියදම්න් කොටසක් දැරීම යි. එනම් ; ද්‍රව්‍යමය තොගයන්හි මුදල් ආයෝජනය කර තිබීම යි.

6. මේ මුල්‍ය සහනාධාරය කුරුඳු නිර්යාත වලින් සුළු බද්දක් ලෙස ලබා ගත හැකි ය.

7. මේ බද්ද ගබඩා ගොඩ නැංවීම, පාලනය හා නඩත්තු කිරීම සඳහා වැය කළ හැකි ය.

මෙහි විශේෂිතම අංගය නම් වෙළෙඳුන්ට තමා ගේ නිෂ්පාදනය ඕනෑම වේලාවක ආපසු ගැනීම හෝ වැඩි කර ගැනීම කළ හැකි වීම යි (එසේම මේ තොග එකිනෙකාට විකිණීම ද කළ හැකි ය). මෙහි තවත් අදහසකි, තත්ව පාලන බාධකයන් ඉවත් කිරීම. යම් සමුපකාර සංගමයක් මගින් විශාල තොග එක් රැස් කිරීමක් කරන්නේ නම් එතැන විශාල ලෙස ඝණයන් ගෙන් පිරී පවතී. මෙයට අනුබල දෙමින් නිෂ්පාදකයෝ ද තත්වයෙන් බාල කුරුඳු තොග තොගයට එක් කරති. මෙසේ තොගය බොහෝ දුරට බාල කුරුඳු වලින් යුක්ත වන අතර, ඒවා විකිණිය නො හැකි සේ ඉතා අඩු මුදලකට විකිණිය හැකි තත්වයකට පත් වේ. මෙසේ තොගය විශාල වියදම් දරන්නක් වන අතර, සාමාන්‍යයෙන් සකස් වුනු කුරුඳුවල තත්වය ද බාල වෙයි. කිසිවක් සිදු නොවී තිබීමට වඩා මෙවන් තත්වයක් තවත් බරපතල වේ.

දැනට වෙළෙන්දෝ අධික වියදමක් අවදානමත් සහිත වෙළඳ පොළ නිසා සිදු වන අවිනිශ්චිත පාඩුත් නිසා තොග රැස් කිරීම නොකරති. මනා පරිපාලනයකින් යුක්ත වූ ඉහත දැක් වූ අන්ද මේ තොගයකින් දෙවනුව දැක්වූ ප්‍රශ්නය විසඳේ. සහනාධාරයන් මගින් වෙළෙන්දන්ට තොග

රඳවා තබා මිල ඉහළ යාමක් අපේක්ෂා කිරීමට අවකාශ සලසයි. මෙසේ ඔහු පුද්ගලික ලාභ පමණක් ම නොව, වාසින් ද සැලකීමට උගනියි. මෙහි දී විය යුත්තේ සම්පූර්ණ තොග රඳවා ගැනීම සඳහා මුදල් ගෙවීම නොව, ඒ මගින් මිල උච්චාවචනය කිරීම යි. ගෙවිය යුතු සහනාධාරය ගණනය කර ගත හැකි ක්‍රම කිහිපයකි. නිදසුනක් ලෙස තොග රඳවා ගැනීමකින් වන මූල්‍ය වියදම වර්තමාන බැංකු තැන්පතු පොලියට සමාන යයි සිතා ඒ වියදමින් භාගයක් දැරිය හැකි ය. බැංකු තැන්පතු පොලිය 10% ක් හා තොග වටිනාකම රු.10,000 ක් ද වේ. ඒ සඳහා ගෙවිය යුතු වාර්ෂික පොලිය 10%, 10,000 වේ. තොග අගය කරන්නේ කාටද – යන ප්‍රශ්නයේ දී විවිධ වර්ග ගැන සලකන්නේ නම් අපට තොග අධීක්ෂණය කළයුතු වේ. මන්ද තොග බාල තත්වයක පවතිද්දී සියලු ම සාමාජිකයෝ ඉතා හොඳම වර්ගයේ කුරුඳු තොග රැස් කර ඇති බවට වංචනික සහනාධාර ලබා ගත හැකි ය. ගබඩා කිරීමේ සහනාධාරය සළකා බැලීමේ දී සෑම තොගයක් ම සාධාරණ ලෙස පරීක්ෂා කොට වටිනාකම තීරණය කළයුතු ය. මෙහි දී මෙම අධීක්ෂණය ද කරදරකාරී දූෂණයන්ට තුඩු දෙන ක්‍රියාවකි. නිදසුනක් ලෙස එක් අයෙක් අවම ආරක්ෂිත මිලක් සාමාන්‍ය වර්ගයක කුරුඳු සඳහා නිර්දේශ කරනු ඇත. මෙහි දී අවශ්‍ය වනුයේ වෙළෙන්දන්ට තොග රැස් කොට මිල ඉහළ නැංවීමක් කළ නොහැකි වන සේ පෞද්ගලික වෙළෙඳුන්ට යම් දිරි ගැන්වීමක් දීම පමණි. ඒ දිරිගැන්වීම සෑම සාමාජිකයෙකුටම පොදුවේ ඕනෑම අවස්ථාවක ලැබෙන සහනාධාර ලෙස නම් කළ හැක. මේ සහනාධාර මිළ මුළු සමාගම් නිර්යාත ආදායමින් 20% වන තරම් සුළු මුදලකි.

මෙහි දී විශේෂයෙන් නිර්යාත හා අලෙවි සමාගමෙන් 20 කට නොවැඩි ප්‍රමාණයක් වන මෙම තොග මණ්ඩලයේ සාමාජික පිරිස මෙය ඉතා ආශාවෙන් පිළිගනු ඇත. මෙහි දී රජයේ සහභාගිත්වයට ඇති වන කැලඹ සහ වෙළඳ පරිසරයෙන් සිදු වන වෙනස්කම් නිසා මෙය විශාල සැක යනට භාජනය වනු ඇත. වර්තමාන අපේක්ෂිත ලාභයත් වෙළෙන්දාගේ ආදායම මත තදින් බලපාන අතර එයින් ද වඩාත්ම කාර්ය ශූර පුද්ගලයා කැපී පෙනෙනු නොඅනුමානය. මේ අවස්ථාවේ දී රහස්‍යතාවය විශේෂයෙන් රැකෙයි. එහෙත් තොග රැස් කිරීමේ දී ඒ ඒ සමාගම එකට ගැටෙන බැවින් මහජනයා ද ඒ ඒ සමාගම පුරෝකථනය කරන්නේ කෙසේ ද යන්න වටහා ගනී. මේ හේතුවෙන් සම්පූර්ණ වෙළෙඳ පල පරිසරයම වෙනස් වන අතර, සමහරුන් තුළ මානසික පසුබැස්මක් ද ඇති විය හැක. එනිසා විශාල ධෛර්යයක් හා උද්යෝගයන් මගින් වෙළඳුන් මේ සාමූහික වෙළෙඳ පලට සහාය දීම උදෙසා පොළඹවා ගත යුතු ය.

18. රාජ්‍ය ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයන් ලෙසින්.

(1) ශ්‍රී ලංකා කුරුඳුවල ඇති දිගුකාලීන වෙළඳ පල ප්‍රවණතා විරල ය. එනිසා නිෂ්පාදකයින් හා කුරුඳු තලන්නන් ගේ වෙනත් ඵලදායක ක්‍රියාවන් සඳහා යොමු කර විය යුතු අතර, අතිරේක ශූලිය ශූමය හෝ පෝර වැනි ඵලදාව යෙද වූමක් කුරුඳු සඳහා වැය නොකළයුතු ය.

(2) මිල විචල්‍යතාවය වගාවේ තත්වය දියුණු කිරීමේ දී ද හා මූල ද්‍රව්‍ය කාර්යක්ෂමව යොදා ගැනීමේ දී ද, විශාල බාධකයක් වෙයි. මේ නිසා දේශීය නිෂ්පාදකයන් ගේ මිල ගණන් ස්ථාවර කිරීමක් ද අවශ්‍ය වේ.

(3) මේ අනුව තොග එක් රැස් කිරීමක් මගින් මිල ස්ථාවර කළ හැකි වුව ද, 17 කොටස දක්වා ඇති අන්දමට සකස් නොකළ හොත් එයින් යහපතට වඩා අයහපතක් සිදු වීමට ඉඩ ඇති වේ.

(4) ඉතා දියුණු තත්ව පාලනයක් කුරුඳු ද්‍රව්‍ය සඳහා වැඩ දායක වේ.

(5) නැවත වගා කිරීමට හා පුනරුත්ථාපනය කිරීමට මෙම වර්තමාන තත්වය යටතේ ආධාර දීමෙන් සහනාධාර ක්‍රියාවලියේ වැදගත් බව ද තුරන් වෙයි. එහෙත් එක්තරා ආකාරයේ සහනාධාර ක්‍රමයක් පැවතිය යුතුම නම් මේ සහනාධාරය පස සංරක්ෂණයට ම පමණක් වන දේ හෝ ඊට මූලික වන සේ දීම වඩාත් ප්‍රයෝජනවත් වේ.

(6) කුරුඳු පෝර සහනාධාරයෙන් ජාතියට ශුද්ධ වාසියක් ද නැත. කුරුඳු පෝර බෙදා හැරීම් ව්‍යුහය ක්‍රමවත් කිරීමට කිසිම අවධානයක් නොකරන බැවිනි.

(7) ජාත්‍යන්තර වෙළඳ පල මිල ඉහළ යැවීමේ බලාපොරොත්තුවෙන් ජාත්‍යන්තර වෙළඳ පලට කුරුඳු සැපයීම පාලනය කිරීම වෙනුවෙන් දැඩි අවධානයක් යොමු විය යුතු ය.

(8) සැපයුම අඩුල කළ යුත්තේ බාල වර්ගයේ කුරුඳුවල ය. එමගින් තත්වයෙන් උසස් කුරුඳු වෙළඳ පලක් ප්‍රචාරණය කළයුතු ය.

19. අනෙකුත් වගාවන් හා සැසඳුම.

කුරුඳු ලංකාවේ මෙන් ම ජාත්‍යන්තර වෙළඳ පලට ද සුළු වැදගත් කමකින් යුක්ත වූ භෝගයකි. එසේ වුව ද, මෙහි එන අරමුණු හා තර්ක වලින් බොහොමයක් කෘෂිකාර්මික ආර්ථිකයේ බොහෝ ද්‍රව්‍ය වලට පොදු වූවකි.

කුරුඳු වෙළඳ පල ව්‍යුහය අනෙක් සුළු අපනයන භෝගයන්ට බෙහෙවින් සමාන ය. විශාල වෙළඳුන් කිහිප දෙනෙක් සිටීම, නිෂ්පාදනයන් ගේ සුළු බව, චංචල සැපයුම් රටාව, විචලනය වන ඉල්ලුම් හා මිළ මෙන් ම වෙළඳුන් ගේ අක්‍රමිකතා හා දූෂණ ද අනෙකුත් වගාවන්ට සමාන

වේ. රාජ්‍ය නීතිය මේ හැම භෝගයකටම රාජ්‍ය අංශයේ තොග රැස් කිරීමක් කළ යුතු ය. මේ එක් රැස් කිරීම් ද කුරුඳුවලට සේම අනෙකුත් ද්‍රව්‍ය වලට ද එතරම් වැඩ දායක නො වේ.

භෝගයන් වෙනුවෙන් විශේෂිත වූ දෙපාර්තමේන්තුවක් හෝ දෙපාර්තමේන්තු රැසක් පිහිටුවීම ලංකාවේ ප්‍රචලිත ක්‍රමයකි. තේ, රබර්, පොල් වලට මේ ලෙස ආයතන පිහිටුවා ඇති අතර, සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව ද ඊට සමාන ප්‍රශ්නයන්ට මුහුණ දේ.

වැදගත් භෝග වර්ගයන්ට කුරුඳු වලට ලැබෙන සහනාධාරය මීට වඩා නිදහස් ලෙස ලැබෙයි.

අවසන් වශයෙන් සෑම නිර්යාත වැවිල්ලක් ම විශාල හා සුළු නිෂ්පාදකයන් අතර නිෂ්පාදන ක්‍රම හා අස්වැන්න අතර වෙනස්කම් දක්නට ලැබේ. විශේෂයකට ඇත්තේ විශාල කුරුඳු පොතුවල ආධිපත්‍යයක් නොවීම පමණි. අප ගේ විග්‍රහයන්ට අනුව කෙතෙක් ආධාර දුන්න ද, සුළු ඉඩම් හිමියන් කාර්යක්ෂම වැවිලි කරුවන් කිරීම අසීරු කරුණකි.

උප ග්‍රන්ථය 1.

## බටපොල සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ කුරුඳුවලට මධ්‍යස්ථානය වූ අම්බලන්ගොඩ නගරයෙන් සැතපුම් පහක් පමණ ඈතින් බටපොල ග්‍රාමය පිහිටා ඇත. මෙහි වසන්නවුන් කුරුඳු තලන්නන් කුලයේ නොවූව ද, දිගු කලක සිට කුරුඳු වැවීම හා තැලීම කර ගෙන යන පිරිසකි. 1976 ඔක්තෝබර් සිට 1977 සැප්තැම්බර් දක්වා මාස 12 ක කාලයක ද, කුරුඳු නිෂ්පාදනයේ ආර්ථික පිරිවැයුම් සම්බන්ධ සමීක්ෂණය කෙරුණි. කතුවරයා සහ ක්ෂේත්‍ර විමර්ශකයන් ද සමීක්ෂණය ආරම්භයට පෙර තුන් මසක් ගමේ පදිංචි වී සිටි අතර, ඊට පසුව බොහෝ අවස්ථාවල දී ඒ තත්වයම අනුගමනය කෙරුණි. සමීක්ෂණයේ අවසාන පරිච්ඡේදයේ දී උගත් සාමාජිකයන්ට විශේෂ ගෙවීමක් කොට කුරුඳු කර්මාන්තය සම්බන්ධ කටයුතු සඳහා දින පොතක් තබා ගැනීමට උපදෙස් දී සති දෙකකට වරක් ඔවුන් හමු වීම කෙරුණි. පර්යේෂකයෝ වී ගොවිතැන හා රැකියා කටයුතු පිළිබඳ දත්තයන් ද, එක් රැස් කරමින් සිටි බැවින් ගම්වූ මේ පර්යේෂණයට කුරුඳු ගැන පමණක් ම දත්ත සොයන බවට සැක කිරීමක් ද නොවීය. ඇපණය තොරතුරු විමසන සාමාජිකයින් නියැදියෙන් ඉවත් කරන ලදී. එබැවින් විශ්ලේෂණයන්ට යොදා ගත් දත්තයන් ගම්වුන් නොදන්නා පිරිසක් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් රැස් කර ගත් තොරතුරු නොවන බැවින් අප ගේ විශ්වාසයට අනුව ඉතාම සත්‍ය තොරතුරු වෙයි.

මෙහි දී මෙම නියැදියට අයත් වූයේ සුළු ඉඩම් හිමියන් පමණි. මේ විස්තර උප ග්‍රන්ථය පළමු වැනි වගුවෙන් දැක්වේ. මේ නියැදිය ජාතික වශයෙන් සුළු ඉඩම් හිමියන් නියෝජනයට හොඳටම සෑහේ. මේ තොරතුරු 1969 ට අයත් ඒවා වන අතර, දැන් එම ඉඩම් ප්‍රතිසංස්කරණය කරන විට ඉඩම් කැබලි වල ප්‍රමාණය ද මඳක් කුඩා වී ඇත. අප ගේ නියැදියට විශාල වතු අයත් නොවූන අතර, අපට හමු වූ විශාලම වගාව අක්කර 8 කි. මෙම නියැදියට කුරුඳු අනිකුත් භෝග හා මිශ්‍ර වූ වගාවන් ලෙස ද මේ වතු අයිති විනි. මුළු අක්කර ප්‍රමාණයෙන් 58% (ජාතික වශයෙන් වූ 30% සංඛ්‍යාවට විරුද්ධ ලෙස) (32) මිශ්‍ර වගාව විය. ඒ අනුව මෙහි නිගමනයන් ලංකාවාසී සියලු ම කුඩා වතු හිමියන්ට අදාළ නොවීමට කිසිම හේතුවක් නැත.

උප ග්‍රන්ථ වගුව 1.

වගා බිම් කැබැල්ලේ ප්‍රමාණය අනුව කුරුඳු නිෂ්පාදකයන්
විසිරීම ප්‍රතිශතයක් ලෙස

| කුරුඳු වැවිල්ලේ ප්‍රමාණය / නියැදිය | අක්කර 0.5 අඩු | අක්කර 0.5-0.9 | අක්කර 1-2.9 | අක්කර 3-4.9 | අක්කර 5-9.9 | අක්කර 10 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජාතික සංඛ්‍යා ලේඛන - 1967 | 31 | 39 | 27 | 02 | 01 | සුළු ප්‍රමාණය | 100 |
| බටපොල සමීක්ෂණය | 21 | 32 | 36 | 04 | 07 | - | 100 |

## උප ග්‍රන්ථය II. බටපොල කුරුඳු නිෂ්පාදකයින් ගේ නිෂ්පාදන ශ්‍රිත

කුරුඳු වගාවේ දී යොදා ගන්නා ප්‍රධාන යෙදවුම් භූමිය, ශ්‍රමය හා රසායනික පොහොර ය. බටපොල සමීක්ෂණය දත්ත අනුව පොහොර හා ශ්‍රම යෙදවුම් සඳහා අක්කරයකට දායකත්වය ගණනය කිරීමට විශ්ලේෂණයක් කරන ලදී. උතාම ලිහිල් නිෂ්පාදනය ශ්‍රිතය එනම්, විසිරී ව්‍යාප්ති ශ්‍රිතය යොදා ගන්නා ලදී. එය පහත සඳහන් ආකාරය වේ.

$Y = f \quad (x_1, x_2)$

- $y$ = අක්කරයකට ලැබෙන කුරුඳු ප්‍රමාණය රාත්තල් වලින්
- $x_1$ = අක්කරයකට ලැබෙන පොහොර ප්‍රමාණය රාත්තල් වලින්
- $x_2$ = අක්කරයකට යොදවන ශ්‍රම ප්‍රමාණය පැය වලින්

මෙම ශ්‍රිතය පිළිබඳ ගැටළු රැසකි.

1. 1976 ඔක්තෝබර් – 1977 සැප්තැම්බර් දක්වා නියමිත කාලය තුළ විකිය ලෙස ගෘහ ඒකකයක් ගත් විට පොතු ගැලවීමේ කාර්යය හා පොහොර යෙදීමේ කාර්යය සීමිත කාලීන බවක් පමණි, දක්නට ලැබුණේ. එබැවින්, කෙබඳු කාලයක් ගත ද ඒ වෙනස් වේ යැයි සිතීම අසීරු ය. එය බාහිර යෙදීම් ගණනය කරන නමුත්, පොතු ගලවා හය මසකට පසු ඒ හා බැඳුණු නිෂ්පාදනය ගණනය නොකරයි. මේ තත්වය මඳක් ආරක්ෂා වන්නේ වගා ක්‍රමය සම්බන්ධයෙන් ඇති කාලීන බව නිසා ය. එනම්, මේ වර්ෂයේ පොහොර සෑදූ අය ඊළඟ වර්ෂයේ ද යොදන බැවිනි.

2. කුරුඳු වලට යොදන පොහොර වර්ග අවුරුදු ගණනක සම්මුච්චිතයක් ය. පොහොර යෙදූ වස රේම ලැබෙන අතිරේක අස්වැන්න එම පොහොර යෙදවීම නිසාම ඇති වී යයි ගණනය කිරීම අධි ඇස්තමේන්තුවක් වේ.

3. සාමාන්‍ය කුරුඳු ඉඩම්වල පසට සාරවත් පසක් ඇති කුරුඳු ඉඩමක පොහොර යෙදීමෙන් වඩා සාර්ථක බවක් ලැබේ. ඒ අනුව අතිරේක අස්වැන්න තනිකරම පොහොර නිසා ලැබුණු බවක් කිව නොහැක.

4. කුරුඳු මිශ්‍ර වගාවක් සේ තිබෙන අවස්ථාවල කුරුඳු වගාවට යොදන පොහොර (එවැනි වගා වන්ට පොහොර යොදන්නේ මඳ වශයෙනි) කුරුඳු හෙවන භෝගයන්ට ද යහපත් වේ. මේ නිසා පොහොර යෙදීමෙන් ලැබෙන අස්වැන්න මිශ්‍ර වශවන් හිඳී අඩු වෙයි. (ප්‍රතිපාදන ශ්‍රිතය බලන්න) පාඩුව දැක්වීමෙන් පොහොර යෙදීමේ පිරිවැය වාසි විග්‍රහයකට උපකාරී වේ.

5. අපේ දත්තයන් කුඩා වතු වලට පමණක් සීමා වේ. මෙහි දී විශාල වතුවලට වැඩි අස් වැන්නක් කලට වේලාවට පොහොර යෙදීමෙන් හා පුහුණු ශ්‍රමය යෙදීමෙන් ලැබෙයි.

6. ශ්‍රමය ඒකීය බැවින් තොර වවකි. එය තාවකාලිකව වගාවේ වල් පැල ඉවත් කරන ළමා ශ්‍රමය හා ප්‍රභූ වැඩිහිටි ශ්‍රමයන් ද යුක්ත වේ. මේ නිසා ශ්‍රමය කොටස් දෙකකට බෙදන ලදී. මූලික ශ්‍රමය (සියළු කුලී කරුවන් ගේ ශ්‍රමය හා අවුරුදු 20 ට වැඩි පවුලේ පිරිමි ශ්‍රමය) හා මූලික නොවන ශ්‍රමය (අනෙකුත් සියළු ශ්‍රමයයන්) සේවා ප්‍රතිපාදන ශ්‍රිතයන්හි දී උපයෝගී කර ගන්නා ලදී. මෙහි දී කරන ලද වැදගත් ම පිළිගැනීම එක තය වූයේ මූලික ශ්‍රම ඒකක පැය භාගයකට මූලික නොවන එක ශ්‍රම පැයක් ලෙස ගැනීමය. මේ අනුව සකස් කළ ප්‍රතිපාදන ශ්‍රිත උපයෝගී කර ගන්නා ලද අතර, ඒවා පොහොර භාවි තය පිළිබඳ ගණනය කිරීම් සඳහා යොදා ගන්නා ලදී.

7. අපට දත්තයන් ඇති යෙදවුම් නිමැවුම් රැසක් අතර, ඇත්තේ රේඛීය සම්බන්ධතාවයන් මෙම ප්‍රතිපාදන ශ්‍රිත පෙන්නුම් කළ ද, ඒ සම්බන්ධතාවය ඊට මඳක් වෙනස් විය හැකි ය.

මෙම ඉදිරිපත් කරන ලද තර්ක විතර්කයන්ට අනුව යහපත් මෙන් ම අයහපත් ලක්ෂණ ද මේ ප්‍රතිපාදන රේඛාවන්හි තිබෙන බව පෙනේ. එබැවින්, බටපොල ප්‍රදේශයේ පමණක් හෝ පොහොර ශ්‍රමය හා නිමැවුම් අතර සම්බන්ධතාවය දක්වා ඇති අන්දම බොහෝ දුරට සංවිධානාත්මකව නිවැරදි ය. එසේම අනුන් ප්‍රදේශවල සිටින බොහෝ කුඩා වතු හිමියන් ගේ තත්වයද මීට වඩා වෙනස් වෙතැයි සිතීමට හේතුවක් නැත.

$y$ = අක්කරයකට කුරුඳු පොතු අස්වැන්න රාත්තල් වලින්.
$x_1$ = අක්කරයකට පොහොර යෙදීම් ප්‍රමාණය රාත්තල් වලින්.
$x_2$ = ශ්‍රම භාවිතය අක්කරයකට සකස් කරන ලද ශ්‍රම පැය වලින්.

මූලික ශ්‍රමය 0.50 ක් මූලික නොවන ශ්‍රමය පැය 1 ට සමාන වන ලෙස සකස් කරන ලදී.

තනි වගාව සඳහා :

$$y = 100\ .78787 + 0.26003^{*}x_1 + 0.10045x_2$$

$r_2 = 0.294,\quad n =$ වගාවන් 24

මිශ්‍ර වගාවට : $y = 59.07190 + 0.75893^{***}x_1 + 0.08987^{***}x_2$

$r_2 = 0.593,\ n =$ වගාවන් 48

$*$ = විශ්‍රමිතය 2.5% ; $***$ = .5 විශ්‍රමිතය

පළමු වැනි ශ්‍රිතයට අනුව (තනි වගාව) පොහොර යෙදීම පමණකි. සංඛ්‍යාත්මකව ගණනය කළ හැක්කේ. එයට හේතුව ඉහත 4 වැනි සාධකයෙන් දැක්වේ. මෙය දෙවන ශ්‍රිතයේ සංඛ්‍යාවට වඩා විශ්වාස සහගත වේ. ප්‍රතිපාදන විශිෂ්ඨ ගුරුත්වයට අනුව රසායනික පොහොර අමතර රාත් තලකින් කුරුඳු පොතු රාත්තල් 0.26003 ක් නිෂ්පාදනය කළ හැකි බව කියයි. අමතර පොහොර වල වෙළඳ පළ මිළ රු.0.58 කි. කුරුඳු පොතු රාත්තලක් 5.50 ක් ලෙස ගණනය කළ

හොත් අමතර කුරුඳුවල වටිනාකම රු. 1.43017 ක් වේ. පරිවාහන, පෝර යෙදීම් හා ආයෝජනයන් බැඳුණු පොලිය ලබා ගත හැකි අනිකුත් වියදම් නොසලකා හැරේ. පළමු ඉඩම් හිමියා, කුලියට කුරුඳු තලන්නන් යොදවා නිෂ්පාදනයෙන් 65% ක් ලබා ගන්නා බව ද සිතමු. ඒ අනුව පුද්ගලික පිරිවැය වාසි 0.58 ක් වේ. (0.65 X 1.43017) = 1 : 660. අප මෙහි දී නියම පිරිවැය හා වර්ෂාපතනයේ අවදානම අමතක කොට ඇති බැවින්, නියම වාසිය මීට වඩා මඳක් වෙනස් වෙයි. මේ අනුව පෝර යෙදීම අමතර මුදලක් ඇති අයට වාසි සහගත වුව ද, මුදල් ණයට ගෙන ආයෝජනය කරන්නෙකුට එය වාසිදායක නොවේ.

මෙහි දී ජාතික වශයෙන් වන වාසිය මීට වෙනස් වෙයි. පෝර නියම මිලෙන් 50% ක් අඩු සහන මිලකට සැපයෙන බැවිනි. ඒ වෙනස බදු ගෙවන්නා දැරිය යුතු වේ. එබැවින්, කුරුඳු පෝර රාත්තලක සමාජ පිරිවැය (2 X 0.58) = රු. 1.16 ක් වේ. මෙහි දී අමතර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලද පෝර රාත්තල සඳහා යෙදවුනු ශ්‍රමයට වෙනත් විකල්ප කාර්යයක් නොවීනිය යයි උපකල්පනය කරමු. එහි දී පෝර යෙදීමෙන් වන පිරිවැය සමාජ පිරිවැය වාසිය 1.16 : 1.43017 = 1 : 1.23 ක් වේ. මෙහි දී ලැබෙන වාසිය පිරිවැයට වඩා වැඩි වන්නේ මඳ වශයෙනි. එහෙත් වාසි වැඩි වන ලෙසත් පිරිවැය අඩුවන ලෙසත් ගණනය කර ඇති බව ද සිහි තබා ගත යුතු ය. කුරුඳු තලන්නාට තවත් කාර්යයන් කළ හැකි බැවින් වියදම් අධික වේ. ඒ නිසා අප ඔහුට ජායා මිලක් නියම කළයුතු ය. (එනම්, ඔහු ගේ අනිත් ක්‍රියාවන් සඳහා කුරුඳු තැලීමෙන් ලැබෙන ආදායමින් භාගයක් වන ලෙසට) ඔහුට නිෂ්පාදනයෙන් 35% ලැබෙන්නේ නම්, පෝර රාත්තලකින් අමතරව නිපදවෙන කුරුඳු තැලීමෙන් ඔහුට වන සමාජ වාසිය (0.26003 X 0.35 X 5.50 - 2) = රු. 0.25028 කි. ඒ අනුව සමාජ පිරිවැය වාසි අනුපාතය 1.41028 : 143017 = 1 : 1.01 ක් වේ. මේ අනුව සමාජ පිරිවැය හා වාසි බොහෝ දුරට සමාන ය. එසේ වුව ද, ශ්‍රී ලංකාවට අමතර කුරුඳු පොතු රාත්තල් නිෂ්පාදනය කිරීමට යන වියදම හා සසඳන විට ජාත්‍යන්තර වෙළඳ පලෙන් රට ලැබෙන අගය ඉතා සුළු යයි හැඟේ. මුලින් විස්තර කළ අන්දමට ශ්‍රී ලංකාවට කැසියා/කුරුඳු වෙළඳ පලේ ප්‍රධාන ස්ථානයක් හිමි වන බැවින් නිෂ්පාදනය විකිණීමෙන් වන්නේ මිල පහළ බැසීම පමණි. අමතරව නිපැයෙන කුරුඳු රාත්තලක් ඒ සඳහා යම්කිසි ආදායමක් ලබා ගන්නා නමුදු සමස්ත කුරුඳු ආදායම හීන කරයි. මේ සම්බන්ධතාවයේ ප්‍රමාණය අවිනිශ්චිත බව නිසාත්, වෙළඳ පොලේ අවදානම නිසාත්, ගණනය කළ නොහැක. එහෙත් මෙතක් ලද අත්දැකීම් වලින් පල කළ හැක්කේ අමතර පෝර යෙදීමෙන් ලැබෙන කුරුඳු පොතු ප්‍රමාණයන් රටට ලැබෙන ශුද්ධ වාසිය අල්ප වන අතර, එය ජාතික සම්පත් අපතේ හැරීමක් ද වෙයි.

මේ සියලු ගණනය කිරීම් වල විචලය සාධකය ජාත්‍යන්තර වෙළඳ පොලේ කුරුඳු පොතු මිල යි. කුරුඳු පොතු රාත්තලක් රු.8.00 යන උපකල්පනය මත ගණනය කළොත් පෝර වියදම් පුද්ගලික පිරිවැය වාසිය 1 : 2.33 ක් වේ. සමාජ පිරිවැය වාසිය 1 : 1.37 කි. මේ නිසා පෝර යෙදීමට පෙළඹවීම ජාතික ප්‍රශ්නයක් ද වේ. ප්‍රතිපායන රේඛාවන්ට අනුව අප ගේ දෙවැනි විචල්‍යය ශ්‍රම යෙදවුම් ය. මෙහි විපර්ෂය ගුරුත්වය ශ්‍රිත දෙකේ ම සමා

ගමට ද, මිශ්‍ර වගාවේ දී එය සංඛ්‍යාත්මකව වෙනස් ය. ඒ අනුව අතිරේක ශ්‍රම වැයක් කුරැක්කන් පොදු රාත්තල් 0.90 කට සමාන වේ. කුරැක්කන් පොදු රාත්තලක මිල රු.5.50 ලෙස කල්පනය කළ විට අතිරේක කුරැක්කන් පොදු ප්‍රමාණයේ වටිනාකම රු.0.49 කි. කුරැක්කන් පොදු මිල රු.8.00 වන විට අතිරේක නිෂ්පාදනයේ වටිනාකම ශත 0.72 කි. මේ පැය ගණන් මුළික වැය වන අතර, ශත 25 තත්වය මීට වඩා අඩු ය.

නිෂ්පාදනයෙහි දී සකස් නොකරන ලද ශ්‍රම පැය ගණන බැලූ විට ආන්තික නිෂ්පාදනය වෙළඳ පල මිල ශත 0.36 සිට ශත .53 දක්වා ආන්තික නිෂ්පාදනයට ලැබේ. මේ ඇස්තමේන්තු ක්ෂේත්‍ර කටයුතු සඳහා ඇති ලැදියාව පෙන්වයි. කුරැක්කන් වගාවට අවශ්‍ය මිනිස් ශ්‍රමය ආයුධ කිහිපයක් හා තැලීමේ දී පසුගු ශ්‍රමය වැනි සීමිත ස්ථිර ප්‍රමාණයකි. කුරැක්කන් තැලීම හැර අනෙකුත් කාර්යයන්හි දී පවුලේ ශ්‍රමය විශාල ලෙස භාවිතා කරති. එම ශ්‍රමය යොදා ගැනීම වියදම් රහිත වන අතර, රැකියා විරහිත ශ්‍රමය ද වේ. මේ නිසා කුරැක්කන් බිම්වල ශ්‍රමය එක් රෙස් වී තිබීම නිසා පැයකට ලැබෙන ආන්තික ඵලදායීතාවය කුරැක්කන්වල වල් පැල නෙලීමේ නිරත ස්ත්‍රී ශ්‍රමයට ගෙවන වැටුපට (මේවා අනෙකුත් ශ්‍රම වැය වලට වඩා අඩු අගයකින් යුක්ත ය) සමාන වේ.

සටහන්.

1. නිදසුනක් ලෙස පෘතුගීසි ආර්ථිකයේ කුරුඳුවලට හිමි වූ ස්ථානය පිළිබඳ විස්තරයක් ටී. අබේසිංහ මහතා ගේ 'ලංකාවේ පෘතුගීසි පාලනය (1594 -1612)', ලේක් හවුස්, කොළඹ. 1966 ග්‍රන්ථයේ හා චන්ද්‍රා ද සිල්වා මහතා ගේ ලංකාවේ 'පෘතුගීසීහු 1617 - 1638', එච්.ඩබ්ලිව්. කේව් සහ සමාගම, කොළඹ, 1972 ග්‍රන්ථයේ ද දැක් වේයි. 'ආදි බ්‍රිතාන්‍ය යුගය කුරුඳුවල තත්වය' පිළිබඳව කොල්වින් ආර්. ද සිල්වා මහතාත්, බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ 'ලංකාව 1795 - 1833, දෙවන භාණ්ඩය, කොළඹ, ඇපොතිකරි සමාගම, කොළඹ, 1962 ග්‍රන්ථය දක්වයි.

2. කුරුඳු වගාව හා සකස් කිරීම - පිටුව 5.

3. ශ්‍රී ලංකා මහ බැංකු විවරණිකාව. කොළඹ, 1976 දෙසැම්බර්, 32 හා 36 වගු. දර ලෙස භාවිතා කරන කුරුඳු කෝටු හැරුණු විට අනෙකුත් සියලු ම කුරුඳු නිෂ්පාදනය 100% අපනයන භාණ්ඩය.

4. ඇස්. ද සිල්වා - පිටුව 17.

5. ඩී.ජේ. මැක්ඩොනල් හා පී.කේ. උපවංශ. වගුව 3.7 බලන්න.

6. මෙය රබර් කිරි කැපීමට සමාන ය.

7. 1 සටහන් දක්වා ඇති ග්‍රන්ථ මේ කරුණුවල මූලාශ්‍රයි.

8. ශ්‍රී ලංකා මහ බැංකු විවරණිකාව, කොළඹ, මැයි 1977. 28 හා 32 වගු.

9. යුරෝපා ආර්ථික හවුල හා අතර බහු වාර්ෂික වෙළඳ ගිවිසුම් - ආර බඩු කොටස් වලින්. ලන්ඩන්, මැයි 1975. පිටුව 9.

10. ඩී.ජේ. මැක්ඩොනල් හා පී.කේ. උපවංශ, 1.2 වගුව.

11. කොමන්වෙල්ත් ආයතනය. පිටුව 8.

12. නිරක්ෂ රේඛීය නිෂ්පාදන ආයතනය, ලන්ඩන්. පුද්ගලික ලේඛන. ජනවාරි 1977.

13. ඩී.ජේ. මැක්ඩොනල් හා පී.කේ. උපවංශ. 18 සිට හා 8.1 වගුව.

14. අයි. ද සිල්වා. 40 පිටුව.

15. ඩී.පී. මැක්ඩොනල් සහ එම්.පී. කේ. උපවංශ. 3 වන පිට හා 1.1 වගුව.

16. ඇස්. ද සිල්වා. 30 වන පිට. බටපොල සමීක්ෂණයේ දී කුරුඬු වැවිල්ලේ ප්‍රමාණය පෝර යෙදීම අතර සබඳතාවයක් නැති බව පෙනේ. මෙය විමතියට කරුණක් නො වන්නේ අයකුට හිමි කුරුඬු ප්‍රමාණය හා ඔහු ගේ ආදායම අතර සමානුපාතයක් නැත. කුරුඬු ඔහු ගේ ආදායම් මාර්ගයන් ගෙන් එකක් පමණි. එසේ වුව ද, පෝර භාවිතය හා පවුලේ ආදායම අතර ඍජු සම්බන්ධයකි.

17. එස්. ද සිල්වා. 3 පිට හා 23 පිට.

18. ඩී.ජේ. මැකොයිනල් හා පී.කේ. උපවංශ. පිට 45.

19. ඉඩම් හිමියා ආහාර දෙන්නේ නම් මොවුන් අඩු මිළට සේවය කරයි.

20. එස්. ද සිල්වා. 36 පිට. ඩී.ජේ. මැකොනල් හා පී.කේ. උපවංශ. පිට 24.

21. එස්. ද සිල්වා. 42 පිට.

22. මෙම විශ්වාසය තවදුරටත් ගෙන යා හැකි විශාල නිෂ්පාදකයින් ගැන කතුවරයා දනී. ඔහු ස්ථිර කුරුඬු තලන්නන් යොදවා ඔවුන්ට නිෂ්පාදනයෙන් කොටසක් නොව, දෛනික වැටුප් ගෙවීම කරයි. කාර්යක්ෂම හා පිරිසිදු සේවාව සඳහා ස්ථිර රැකියාව සහතික වන බැවින් ඔහු ඉතාම හොඳ වර්ගයේ කුරුඬු නිපදවයි.

23. කුරුඬු මිටි බෙදා හැරීම. විශාල හා කුඩා පරිමාන වැවිලිකරුවන් ගේ වෙනස් බැලීමට. අයි. ද සිල්වා ග්‍රන්ථයේ 45 වන පිටුව.

24. එස්. ද සිල්වා. 33 පිටුව.

25. ගාල්ල හා මාතර ප්‍රදේශයන්හි විශාල වතු අක්කරයකට වර්ෂයකට (පැය 7 වැඩ මුර) දින 18 ක් සේවය කළ හැකි බව පෙනේ. ඩී.ජේ. මැකොනොල් හා පී.කේ. උපවංශ, 2:1 සටහන හා පිටු 24. බටපොල සමීක්ෂණය සුළු ඉඩම් හිමියන් ගේ තත්ව යන් මත මේ දින ගණන අක්කරයකට වර්ෂයකට දින 154 ක් වේ. මේ අනුව බලන විට විශාල වතු මගින් සාමාන්‍ය කුඩා වතු හිමියන් අළ වඩා 1/3 ක් වැඩිපුර සේවය අපේක්ෂා කරන බව පෙනේ.

26. වර්ධනය වූ වර්ගයන් විශේෂයෙන් කොලවල තෙල් ප්‍රමාණය අධික වූ වර්ග කිහිපයක් එලි දක්වූ ඇත.

27. සුළු ඉඩම් හිමියන් ගේ ක්ෂේත්‍ර තේ, රබර්, පොල් සඳහා ගෙවන සහනාධාර ප්‍රමාණයේ තරමටම කුරුඳු හා අනෙකුත් සුළු අපනයන භෝග නැවත වගා කිරීමේ සහනාධාරය වැඩි කිරීමට අදහස් කරන අතර, ක්ෂේත්‍ර නිලධාරියා වගාව පරීක්ෂා කිරීමට පැමිණෙන වාර ගණන ද වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

28. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය. ජනවාරි සිට මාර්තු 1977, 'ක්‍රියාකාරීත්වය' කොළඹ, ජූලි 1977.

29. මේ ලියන අවස්ථාව වන විට මෙහි දැක්වෙන බොහෝ විවේචනයන් වෙනස් කර ඒවා සුදුසුතම ක්‍රියාවන් හඳුන්වා දීම කෙරෙයි. මේ අදහස බෙහෙවින් ම ලබා දුන්නේ ජේ. බොරෙයිමා.

30. කුරුඳු වෙළඳුන් ගේ වංචාකාරී ක්‍රියා කලාපය දැක්වීමට එක් නිෂ්පාදකයක් එකම වර්ගයේ සිටින විවිධ කුරුඳු වෙළෙන්දෝ විවිධ මිළයකට මිළ දී ගැනීම් කරන බව කීවේ ය.

31. 1977 අගෝස්තු 30 වන දා සන් පත්‍රය බලන්න.

32. එම්. ද සිල්වා. 17 වන පිටුව.